# ප්‍රාථමික පාසල් ළමයින් තුළ
# කියවීමේ පුරුද්ද
# සහ
# විඥාපන කුසලතා
# ප්‍රවර්ධනය කිරීම

නන්දා නාරංගොඩ

# ප්‍රාථමික පාසල් ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය කිරීම

# ප්‍රාථමික පාසල් ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ විඥපන කුසලතා ප්‍රවර්ධනය කිරීම

නන්ද නාරංගොඩ

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
14, නිදහස් මාවත, කොළඹ 07.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ
අධ්‍යාපන ප්‍රලේඛන පර්යේෂණ ව්‍යාපෘතිය
යටතේ
මණ්ඩලීය ආධාර ප්‍රදානය ඇතිව කරන ලද
අධ්‍යයනයකි.

ප්‍රථම මුද්‍රණය - 2000

©ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ISBN 955-8383-07-4

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

නාරංගොඩ, නන්දා
ප්‍රාථමික පාසල් ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා වර්ධනය කිරීම / නන්දා නාරංගොඩ .- කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2000
පි.x,63,x; සෙ.මී.29

ISBN 955-8383-07-4 මිල:

i. 028.9 ඩිවි 21 ග්‍රන්ථ නාමය
1.කියවීමේ පුරුදු
2.පොත් සහ කියවීම

පරිගණක අක්ෂර සංයෝජනය : සක්වා බිස්නස් ප්‍රමෝෂන්, 225/8, කිරුළ පාර, නාරාහේන්පිට

කවරය මුද්‍රණය : සමයවර්ධන මුද්‍රණ ආයතනය මාලිගාකන්ද පාර, කොළඹ 10

පිටපත මුද්‍රණය : ප්‍රකාශන අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ප්‍රකාශක : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07

# පෙරවදන

ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යාපන සංවර්ධන වර්ෂය ලෙස නම් කරන ලද 1997 වර්ෂය නිමිත්තෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විශේෂ අධ්‍යාපන ප්‍රලේඛන පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. ඒ අනුව තෝරාගත් පර්යේෂණ ක්ෂේත්‍ර දෙකක් සඳහා පුවත් පත් මගින් අයදුම් පත් කැඳවන ලදී. එනම්,

1. 1987 - 1996 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කෙෂ්ත්‍රය පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කිරීම සහ ප්‍රාථමික හා ද්විතයික පාසල් ළමයින්ට සුදුසු කියවීම් ද්‍රව්‍ය පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් සම්පාදනය කිරීම.

2. ප්‍රාථමික හා ද්විතයික පාසල් ළමයින් තුළ කියවීම් පුරුදු සහ විඥාපන කුසලතා දියුණු කිරීම සහ ප්‍රාථමික හෝ ද්විතීයික පාසල්වලට ගැලපෙන ආදර්ශ පුස්තකාලයක් සහ විඥාපන සම්පත් මධ්‍යස්ථානයක් ගොඩනැගීම යනුවෙනි.

මේ සඳහා ලැබුණු අයදුම්පත් සහ පර්යේෂණ ව්‍යාපෘති යෝජනා විද්වත් කමිටුවක් මගින් පරීක්ෂා කොට තෝරා ගැනීම් කරන ලදී. කියවීමේ රුචිය වර්ධනය කිරීම පිළිබඳ විශාල ජාතික අවධානයක් යොමුවී ඇති බැවින් එම ක්ෂේත්‍රයට මෙහිදී ප්‍රමුඛස්ථානය ලබාදෙන ලදී.

එසේ තෝරා ගන්නා ලද පර්යේෂණ ව්‍යාපෘතියක ප්‍රතිපල මෙම කෘතියෙන් ඉදිරිපත් කෙරේ. ප්‍රාථමික පාසල්වල ළමයින් තුළ කියවීම් පුරුදු හා විඥාපන කුසලතා වැඩි දියුණු කිරීම පිළිබඳ කරන ලද සමීක්ෂණයක තොරතුරු මෙහි අන්තර්ගත වේ. ඉංග්‍රීසි භාෂාවෙන් රචිත මෙම කෘතිය සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කොට ඇත. අධ්‍යාපන කෙෂ්ත්‍රයේ සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට, විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට මෙන් ම දෙමාපියන්ට ද මෙම පර්යේෂණය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

ජාතික මෙන් ම කාලීන වශයෙන් ද වැදගත් මෙවන් පර්යේෂණ කාර්යයක නියැලීම සම්බන්ධයෙන් නන්දා නාරංගොඩ මහත්මියට මාගේ කෘතඥතාව පළ කරමි. එමෙන්ම මෙම කාර්යය පිළිබඳ උන්නදුවක් දැක් වූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති හෙන්රි සමරනායක මහතාටත් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය භාරව කටයුතු කළ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ජානකී ප්‍රනාන්දු මෙනවියටත් ප්‍රකාශන හා මුද්‍රණ කටයුතු මැනවින් සිදුකළ ප්‍රකාශන අංශයේ අංශ ප්‍රධාන යූ.පී. අලහකෝන්, ප්‍රකාශන නිලධාරි නෙල්සන් පීරිස් යන මහත්වරුන්ටත්, පරිගණක අක්ෂර සංයෝජනය ඉටු කළ සක්වා එන්ටර්ප්‍රයිසස් ආයතනයටත් ස්තූතිවන්ත වෙමි.

එම්. එස්. යූ. අමරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

2000 අගෝස්තු
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
14, නිදහස් මාවත, කොළඹ 07.

# ස්තුතිය

පාසල් සතු මානව සහ භෞතික සම්පත්වල සමතාවක් නො පැවතීම, ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම කෙරෙහි, විශේෂයෙන් භාෂාව සහ ගණිතය යන විෂයයන් දෙක කෙරෙහි බලපෑමක් ඇති කරන බව, මීට පෙර කරන ලද පර්යේෂණවලින් හෙළිදරව් කර තිබේ. මෙම අධ්‍යයනයෙන් ද එය සනාථ කෙරේ. එම නිසා ප්‍රාථමික පාසල් ළමයින්ගේ කියවීමේ පුරුද්ද සහ විඥපන කුසලතා ප්‍රවර්ධනය සඳහා මූලික පියවරක් වශයෙන් පාසල්වල මානව සහ භෞතික සම්පත් සමග අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීමත්, ඒ පිළිබඳව දෙමව්පියන් දැනුවත් කිරීමත් අත්‍යවශ්‍යය.

පළමුකොට, මවිසින් ඉදිරිපත් කරන ලද යෝජනා අදළ කමිටුවේ අනුමතියෙන් පසුව මෙම පර්යේෂණය කිරීම සඳහා මා යොමු කරන ලද, එසේම අදළ උපදෙස් සහ සහාය ලබාදුන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් එම්.එස්.යු. අමරසිරි මහතා සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති හෙන්රි සමරනායක මහතා යන දෙපළට මගේ කෘතඥතාව පිරිනමමි. මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දුන් එම මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ජානකී ප්‍රනාන්දු මෙනවියට ද ස්තුතිවන්ත වෙමි.

මෙම පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ දී, පාසල් තෝරා ගැනීමට සහ ඒවා ප්‍රයෝජනවත් කර ගැනීමට අත හිත දුන් පළාත් සභා සහ ප්‍රාදේශීය සභා අධ්‍යාපන අධ්‍යක්ෂ මහතුන් ද, ඒ ඒ පාසල්වල විදුහල්පතිනියන් හා විදුහල්පතිතුමන් ඇතුළු ගුරුමඩුල්ල ද මෙහි ලා කෘතවේදීව සිහිපත් කරමි. එසේ ම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, චිත්‍ර ඇඳීම, පරීක්ෂණ පැවැත්වීම හා ඒවා ලකුණු කිරීම ආදියට නන් අයුරින් සහාය දැක් වූ සියලුම ගුරු මහත්ම මහත්මීන්ටත්, විශේෂයෙන් පී. ත්‍යාගරාජා, එම්. එන්. ද අල්විස් යන මහත්මීන්ට ද, ස්තුතිවන්ත වෙමි. මෙම පර්යේෂණ මාතෘකාව පිළිබඳ සාකච්ඡා කිරීමෙන් තම වටිනා කාලය වැය කළ ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ සභාපති ගුණසේන විතාන, අධ්‍යාපන පීඨ අධ්‍යක්ෂ එන්. හේරත් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් එන්. කුරේ යන මැතිවරුන්ට සහ ප්‍රසිද්ධ ළමා චිත්‍ර ශිල්පිනී සිබිල් වෙත්තසිංහ මැතිනියට ද මගේ විශේෂ ස්තුතිය පිරිනැමේ.

නන්ද නාරංගොඩ.

# පටුන


01 පරිච්ඡේදය හැඳින්වීම

1.01. ප්‍රාථමික අධ්‍යාපනය 1

1.02. භාෂා හැකියාව ලබා ගැනීමේ වැදගත්කම

1.03. කියවීමේ වටිනාකම

1.04. කියවීමේ පුරුදු සහ විශදපන කුසලතා

1.05. මෙම අධ්‍යයනයට අදළ පසුතලය

02 පරිච්ඡේදය පර්යේෂණ අධ්‍යයන සැලසුම 4

2. 01. අධ්‍යයන සැලසුමෙහි පසුතලය

2. 02. සුවිශේෂී අරමුණු

2. 03. පර්යේෂණ අධ්‍යයන ක්‍රමය

03 පරිච්ඡේදය දත්ත රැස්කිරීමේ උපකරණ 8

3. 01. අ. භාෂා පරීක්ෂණ

ආ. ශිෂ්‍යයන් සඳහා ආකල්ප පරීක්ෂණ

ඇ. ගුරුපිරිස සඳහා ආකල්ප පරීක්ෂණ

ඈ. පාසල් ප්‍රධානීන් සඳහා ප්‍රශ්නාවලී

ඉ. අධ්‍යාපනඥයන්, ළමා ලේඛකයන් සමග සම්මුඛ පරීක්ෂණ

3. 02. ප්‍රශ්න විසිරී ඇති අන්දම 2 වැනි ශ්‍රේණි - ප්‍රශ්න පත්‍රය

3. 03. ප්‍රශ්න විසිරී ඇති අන්දම 4 වැනි ශ්‍රේණි - ප්‍රශ්න පත්‍රය

3. 04. කියවීම පිළිබඳ ආකල්ප සමීක්ෂණය හා අභිරුචි ලේඛණ ලැයිස්තුව

04 පරිච්ඡේදය දත්ත විශ්ලේෂණ ක්‍රම 12

4. 01. හැඳින්වීම

4. 02. පාසල් වර්ග කිරීම

4. 03. විශිෂ්ට සාමාර්ථ මට්ටම සහ අවම - සාමාන්‍ය මට්ටම

4. 04. දිස්ත්‍රික්ක, පාසල්, ගැහැණු, පිරිමි භේද අනුව සාමාන්‍ය සාධනය

05 පරිච්ඡේදය භාෂා පරීක්ෂණ හා බැඳෙන අනු පරීක්ෂණ විශ්ලේෂණය 17

5. 01. විශිෂ්ට සහ අව මට්ටම 2 වැනි ශ්‍රේණිය

5. 02. විශිෂ්ට සහ අව මට්ටම 4 වැනි ශ්‍රේණිය

06 පරිච්ඡේදය ළමයින්ගේ කියවීමේ රුචිය 31
6.01. ආකල්ප පරීක්ෂණ විශ්ලේෂණය - 2 වැනි ශ්‍රේණිය
6.02. ආකල්ප පරීක්ෂණ විශ්ලේෂණය - 4 වැනි ශ්‍රේණිය

07 පරිච්ඡේදය නිවසේ පසුබිම 39
7.01. පවුලේ සාමාජික සංඛ්‍යාව සහ භාෂා සාධන මට්ටම
7.02. දෙමව්පිය සහාය - කියවීම සඳහා පොතපත
7.03. පාසලේ පසුබිම
7.04. කියවීම සහ ගුරුවරයා
7.05. සාරාංශය

08 පරිච්ඡේදය දත්ත තොරතුරු ආශ්‍රිත සාකච්ඡාව 47
8.01. සමාලෝචනය
8.02. 2 වැනි සහ 4 වැනි ශ්‍රේණි සිසුන්ගේ භාෂා සාධනය
8.03. සාධන මට්ටම පහළ බැසීමට හේතු සහ ප්‍රතිකාර්ය ක්‍රියා මාර්ග
8.04. කියවීම සඳහා පොත පත, පුස්තකාල

09 පරිච්ඡේදය නිර්දේශ සහ යෝජනා 52
9.01. අධ්‍යාපන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම
9.02. කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය
9.03. නවීකරණය

ආශ්‍රිත ග්‍රන්ථ 59

ඇමුණුම I. 2 වසර i
II. 4 වසර iii
III. ගුරු තොරතුරු ix
IV. පාසල පිළිබඳ ප්‍රශ්නාවලිය x

# සාරාංශය

ළමයින් තුළ කියවීමේ පුරුද්ද හීනවීගෙන යන්නේ කුමක් නිසා ද? ප්‍රාථමික පාසල් ළමයින් තුළ පහසුවෙන් කියවීමේ හැකියාව තීරණය කෙරෙන සාධක මොනවා ද? කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය සඳහා ගත යුතු පියවර මොනවා ද? යන ප්‍රධාන කරුණු අධ්‍යයනය කිරීමට දරන ලද ප්‍රයත්නයකි, මේ පර්යේෂණය. පහසුවෙන් කියවීමේ හැකියාව, භාෂා කුසලතා මත රඳා පවතී. එබැවින් තෝරා ගත් ප්‍රාථමික පාසල්වල 2 වැනි සහ 4 වැනි ශ්‍රේණිවලට අයත් ශිෂ්‍යශිෂ්‍යාවන් පිරිසකගේ භාෂා කුසලතා පරීක්ෂණයට ලක් කරන ලදී. ඒ ඒ පාසල් සතු සම්පත්වලට අනුව එම පාසල් වර්ග 3කට බෙදා ගනු ලැබිණ. කියවීමේ රුචිකත්වය තක්සේරු කිරීම සඳහා ආකල්ප පරීක්ෂණ ළමයින්ට සහ ගුරුවරුන්ට වෙන් වශයෙන් ද, අදාළ වැඩි විස්තර ලබා ගැනීම සඳහා විදුහල්පතිවරුන්ට වෙන ම ප්‍රශ්නාවලියක් ද සකස් කරන ලදී.

ඉහත සඳහන් පරීක්ෂණවලින් ලබාගත් දත්ත විශ්ලේෂණය පසුබිම් කරගෙන යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කර ඉන් පසු ප්‍රාථමික පාසල් ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය කිරීම සාකච්ඡා කරන්නට යෙදුණි.

# 01 පරිච්ඡේදය

## හැඳින්වීම

1.01 ඕනෑ ම රටක සියලු ම සංවර්ධන කටයුතු සඳහා ප්‍රාථමික අධ්‍යාපනය මුල්තැනක් ගනියි. කාගේත් පාගේ යාවජීව අධ්‍යාපනය සඳහා මුල් අත්තිවාරම ප්‍රාථමික පාසලෙහි දී ගොඩ නැගේ. විසි එක් වැනි සියවසෙහි දී අපේ ළමයින්ට අදට වඩා වෙනස් ලෝකයකට මුහුණ දීමට සිදුවනු ඇත. පෙර නොවූ විරූ අන්දමින් සිදුවන සමාජයීය හා තාක්ෂණික වෙනස්කම්වලට අනුරූපී ලෙස හැඩ ගැසීමට හැකිවන අධ්‍යාපනයක් ළමයින්ට ලබා දිය යුතු වේ. දැනටමත් අපි පරිගණක හා සන්නිවේදන - විඥපන යුගයකට අදාළ නිෂ්පාදිත භාණ්ඩ කරා පිය ඔසවමින් සිටිමු. සීමිත ප්‍රමාණයකට වුව ද, පරිගණක මගින් පන්ති කාමරවල ක්‍රියාකාරකම් වෙනස් කිරීම ආරම්භ කර තිබේ. බොත්තමක් තද කළ පමණින්, පරිගණක සංඥවක විධානයකින් සහ අන්තර්ජාල වැනි සන්නිවේදන යටිතල පහසුකම් හරහා විස්තරාත්මකව භාවිතයට ගැනීමට පිළිවෙල කරන ලද තොරතුරු සහ දැනුම ක්ෂණිකව ලබා ගැනීමේ ඉඩ පහසුකම් අත ළඟ ම ඇත. මෙවැනි අවස්ථාවක වුව ද ළමයාගේ අධ්‍යාපනය, භාෂා හැකියාව මත රඳ පවතී. මෙම සන්දර්භය යටතේ අඛණ්ඩ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා, නව දැනුම සහ කුසලතා අත්පත් කර ගැනීමෙහි දී මාධ්‍ය තුළින්, විශේෂයෙන් ප්‍රවෘත්ති පත්‍ර, පොත් පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය සහ සකස් කරන ලද පරිගණක සංඥ සංග්‍රහ ආදිය මගින් කියවීමේ හැකියාව ලබා ගැනීම සුවිශේෂී සම්පතකි. මේ අනුව, ප්‍රාථමික අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නම් කියවීම සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කළ යුතු වේ.

1.02 පුද්ගලයෙකුට ඔහුගේ භාෂාව, කියවීමට හා ලිවීමට ඉගැන්වීම ඕනෑ ම රටක අධ්‍යාපන පද්ධතිය තුළින් ඉටුවිය යුතු ප්‍රධාන වගකීමක් හැටියට කල්පනා කෙරේ. මිනිසුන්ට ඔවුන් ගේ අදහස් ප්‍රකාශ කිරීමට පිහිටවන මාධ්‍යය භාෂාවයි. විශ්වය පුරා මිනිසුන් අතර ප්‍රබල සමාජ සම්බන්ධතා ගොඩනංවා ගැනීමට ඉවහල් වන්නේ භාෂාවයි. මිනිසුන්ට සෞඛ්‍ය පුරුදු, පුරවැසිකම පිළිබඳ සවිඥනකතාව, විද්‍යාත්මක වෙනස්වීම් සහ ජීවනෝපාය සඳහා අවශ්‍ය විවිධ කුසලතා ආදී ඔවුන්ගේ මූලික අවශ්‍යතා වැඩි දියුණු කර ගැනීමට අදාළ තොරතුරු ලබාගත හැක්කේ භාෂාව තුළිනි. මානව බුද්ධි සංවර්ධනයට හා සංකල්ප සංවර්ධනයට දෙර විවෘත කර දෙන්නේ ඒ ඒ රටෙහි භාෂාව බව පියාජේ (*Piaget*) නම් සුප්‍රසිද්ධ මනෝවිද්‍යාඥයා විශ්වාස කළේය. සන්නිවේදනයෙහි ඉතා ම සක්‍රිය ක්‍රමය භාෂාව වේ. බොහෝ විට, භාෂා හැකියාවේ ඌනතාව කෙනෙකුගේ ප්‍රගතියට බාධා පමුණුවයි. විඥාපන කුසලතා අත්පත් කර ගැනීමේ ප්‍රධාන මාධ්‍යය භාෂාවයි. එම නිසා ප්‍රාථමික අවධියෙහි දී ළමයා ලබන භාෂා සංවර්ධනයෙන් ඔහු ඉගෙන ගන්නා අනෙකුත් විෂය ක්ෂේත්‍රයන්හි සාධන මට්ටම ප්‍රවර්ධනය කර ගැනීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කෙරේ.

1.03 කියවීම යනු භාෂාවකට අයත් ඉතා වැදගත් අංගයකි. එය විශේෂයෙන් ප්‍රාථමික පාඨශාලා අවධියෙහි දී අනෙකුත් විෂයයන් උගනීමේ උපකරණයක් වේ. කියවීම, පාසල් විෂය මාලාවෙහි අනෙකුත් සියලු ම විෂය ක්ෂේත්‍ර උගෙනීමට උපකාරී වෙමින් කෙනෙකුගේ අධ්‍යාපනයට ජීව ශක්තියක් ලබා දෙයි. කියවීම යනු තොරතුරු ලබා ගැනීම මෙන් ම මුද්‍රිත පණිවුඩය අර්ථවත් ලෙස ලබාදෙන ක්‍රියාවලියකි. සන්නිවේදනයට හා විඥපන දැනුම අත්පත් කර ගැනීමට ඉවහල්වන මාධ්‍යයක් හැටියට, එය පිළිගෙන තිබේ. කියවීම යනු, මිනිස් චර්යාව හා බැඳෙන සෑම අංශයක් ම සමෝධානය කරන, නිවැරදි ව කියවීමට, කියවන ලද දෑ අගය කිරීමට සහ ඒවා ජීවිතයේ අනිකුත් ක්ෂෙත්‍රවලට ප්‍රයෝජනවත් ලෙස සම්බන්ධ කිරීමට ද හැකි විවිධ සහ අඛණ්ඩ මග පෙන්වීමක් කළ යුතු සංකීර්ණ ක්‍රියාවලියක් හැටියට අදහස් වේ. කෙසේ වුව ද වැඩිදෙනා සිතන්නේ කියවීම යනු දුර ප්‍රමාණය සහ කාලය ඉක්මවා මිනිසුන් එකට සම්බන්ධීකරණය කරන, අත්දැකීම් සම්භාරයක් ලබා ගැනීමට දොරටු

විවෘත කරන්නක් ලෙසය. ස්ට්‍රැන්ග් (*Strang*) නම් අධ්‍යාපනඥයා පවසා ඇති අන්දමට "පුද්ගලයාගේ බුද්ධිය පුළුල් කර, ඔහුගේ රුචිකම් හඳුනාගෙන, ඒවා පුළුල්කර ගැනීමට සහ තීව්‍රකර ගැනීමට ද, තමා පිළිබඳ ව මෙන් ම මුලු මහත් විශ්වය සහ මිනිසුන් පිළිබඳ ව ද ගැඹුරු අවබෝධයක් ලබාගැනීම සඳහා අත්දැකීම් සපයා දෙන්නේ කියවීමයි" (68 පිටුව). මේ අනුව බලන විට කිසියම් ක්‍රියායනයක් ලෙස ද, සමාජයෙහි විද්‍යමාන දෙයක් ලෙස ද, අධ්‍යාපනික බලපෑමක් ලෙස ද කියවීම කෙරෙහි දෙමව්පියන්, සමාජ විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන් ආදී සියල්ලන් ගේ ප්‍රධානතම සැලකිල්ල හා උනන්දුව යොමු විය යුතු වේ. කියවීම වඩාත් ම වැදගත් විය යුත්තේ අධ්‍යාපනඥයන්ටය. ළමයා ගේ පුද්ගල සුබ සිද්ධිය සඳහා පූර්ණ පෞරුෂ සංවර්ධනය ලබාගැනීම සහ මුලුමහත් සමාජ සංවර්ධනය උදෙසා ඔහුට අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමට මග පෙන්විය යුත්තෝ මේ අය වෙති. එසේ ම සාක්ෂරතාඥානය ලබා ගැනීම ළමයකුගේ මූලික අයිතිවාසිකමකි.

ළමයින් විසින් හොඳ පොත්පත් කියවා, කියවීමේ පුරුද්දක් ද ඇති කර ගැනීම ඉතා වැදගත් වේ. ළමයි ශාරීරිකව මෙන් ම මානසිකව ද වැඩීම අවශ්‍ය වේ. මනා බුද්ධි සංවර්ධනයක් සඳහා කියවීමේ පුරුද්ද වුවමනාය. ළමයා සාමාන්‍යයෙන් තමාට ආසන්න පරිසරය ඉන්ද්‍රිය සංජානනය තුළින් අවබෝධ කර ගනියි. ළමයාගේ එම දැනුම වඩාත් විස්තීර්ණ කෙරෙන්නේ කියවීම මාර්ගයෙනි. කියවීමේ පුරුද්ද එක් කාල සීමාවක දී පමණක් ලබාගන්නක් නොවේ. එය මුලු ජීවිත කාලය පුරා ම ලබාගන්නා අඛණ්ඩ අත්දැකීමකි. එහෙයින් ළමයාගේ මුල් අවධියෙහි දී හොඳ කියවීමේ පුරුද්දක් වර්ධනය කර ගැනීම සහ එය පෝෂණය කිරීම වැඩිහිටියන්ගේ වගකීමයි.

1.04 කියවීම තුළින් මුද්‍රිත වචන හරහා අප ලබා ගන්නා දැනුම් අංශ විඥපන ඥනය යයි කිව හැකිය. එම විඥාපනය, විද්‍යාත්මක නව්කරණය, අභ්‍යවකාශ, යුද්ධය, නව තාක්ෂණය ආදී අංශ පිළිබඳ දැනුම හෝ එදිනෙද ආරංචි පිළිබඳ තොරතුරු හෝ විය හැකිය. ඕනෑ ම දැනුමක් හෝ තොරතුරක් අත්පත් කර ගැනීමට නම් කෙනෙකුට කියවීමේ කුසලතාව සතු විය යුතුමය. දැනුම අධිවේගයෙන් වර්ධනය වේ. ජාති, වර්ණ, සංස්කෘති ආදී භේද - සීමාවලින් ඔබ්බට පැතිරේ. තාක්ෂණ විද්‍යාව පිළිබඳ දැනුමක් නො මැතිව කෙනෙකුට තාක්ෂණ විද්‍යාත්මක ලොවක ජීවත්වීමට පුළුවන්කමක් නැත. මේ සියල්ල අපට ලබා දෙන්නේ කියවීමයි. සන්නිවේදනයයි. එම විඥාපන ඥානය අපට සන්නිවේදන කුසලතා සහ අදහස් හුවමාරු කර ගැනීමේ කුසලතා ලබා ගැනීමට උපකාරී වේ. මේ අනුව සලකා බලනවිට, කියවීමේ හැකියාව, කියවීමේ පුරුද්ද, විඥාපන කුසලතා සහ අදහස් හුවමාරු කර ගැනීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීම අප ජීවිතයට අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ.

තාක්ෂණ විද්‍යාව අතින් ලෝකයේ ඉතා ඉදිරියෙන් සිටින අමෙරිකාව, එංගලන්තය වැනි රටවල් පවා කියවීම හා විඥපන කුසලතා සතු ප්‍රබල වැදගත්කම අවධාරණය කර ඇත. ප්‍රවෘත්ති පත්‍ර තොරතුරුවලින් අනාවරණය වී ඇති පරිදි "විඥාපන විප්ලවය" මිනිස් සංහතියේ සමස්ත ජීවිතය ම වෙනස් කිරීම ආරම්භ කර තිබේ. පරිගණක, චන්ද්‍රිකා, අන්තර්ජාල වැනි අදහස් හුවමාරු කර ගැනෙන සන්නිවේදන යුගයට අයත් නිෂ්පාදන දැනටමත් වැඩබිම් පමණක් නොව පාසල් පන්ති කාමර ද ආවරණය කරගෙන ඇත. මෙම චන්ද්‍රිකා, පරිගණක, අන්තර්ජාල ආදී පැටලුම් ගොන්නක් අතර කියවීමේ පුරුදු සහ විඥපන කුසලතාවලට ලැබෙන තැන කුමක් ද? ඉන් ඇති ප්‍රතිඵලය කුමක් ද? වැනි ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කෙනෙකු තමාගේ දැනුම් ප්‍රමාණයට අනුව පෙළඹෙනු ඇත. එසේ වුවත්, තාක්ෂණය අතින් දියුණු එක්සත් රාජධානිය, අමෙරිකා එක්සත් ජනපදය ආදී, රටවල් බොහොමයක් කියවීමේ කුසලතා උසස් මට්ටමකට නැංවීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබේ. එය ජාතික ප්‍රමුඛත්වයක් ලැබිය යුතු දෙයක් ලෙස සලකනු ලබයි. අද තාක්ෂණ විද්‍යාව පිළිබඳ දැනුම මෙන් ම අනිකුත් හැම විඥපන දැනුමක් ම ලබාගත යුත්තේ බුද්ධිමත් ලෙස කියවීමේ මාර්ගයෙනි. එම රටවල "ළමයින්ගේ කියවීමේ දුර්වලතා මගහරවා ගැනීම" නම් පර්යේෂණ, අධ්‍යයන ආදී නොයෙකුත් පියවර හරහා කියවීම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම ප්‍රවර්ධනය කිරීම සඳහා දැන් නොයෙකුත් ක්‍රියාමාර්ග පිළිවෙළ කර ඇත. රජය, වෘත්තීය ආයතන, මහජන සංවිධාන ආදිය රට සහභාගි වේ. කියවීම තුළින් සාර්ථක ප්‍රතිඵල ළමයින්ට ලබා දීමට නම් අප ද මෙබඳු ප්‍රමුඛත්වයක් කියවීමට ලබා දියයුතුය.

### 1.05 මෙම අධ්‍යයනයේ පසුබිම

මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් කරන ලද පර්යේෂණ දෙකකට අනුව, කියවීම, ලිවීම, අදහස් හුවමාරුව සහ විඥපනය පිළිබඳව ප්‍රාථමික ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම ඉතා දුර්වල බව අනාවරණය වී ඇත.

(අ) එස්. බී. ඒකනායක සහ මොහොට්ටිගේ යූ. සේදර විසින් සාධන විෂමතා පිළිබඳව කරන ලද පර්යේෂණයෙන් පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර, සහ මාතලේ යන අධ්‍යාපන දිස්ත්‍රික්කවලට අයත්, අවශ්‍ය ප්‍රමාණ සම්පත් අහිමි ගැමි පාසල්වල ශිෂ්‍යයන්ගේ භාෂාව සහ ගණිතය යන වැදගත් විෂයයන් දෙකෙහි සාධන මට්ටම්වල ගුණාත්මක බව පෙන්නුම් කෙරේ. ඉහතින් දැක්වූ ප්‍රශ්නයෙහි ඇති භාරධූරකම් මෙම අධ්‍යයනයෙන් හෙළිදරවු කරන ලද නිගමනවලින් පැහැදිලි වේ.

| | | | | |
|---|---|---|---|---|
| i | 1 වසර | : | 47%ක් | භාෂාව සාධන පරීක්ෂණයෙන් අසමත් වී තිබේ. |
| | 2 වසර | : | 40.8%ක් | |
| ii | 1 සහ 2 වසර | : | 33%ක් | අකුරු 2-3 යුත් වචන හඳුනා ගැනීමට අසමත් වී ඇත. |
| iii | 1 වසර | : | 37%ක් | තමාගේ නම ලියා ගැනීමට නොහැකි විය. |
| | 2 වසර | : | 20%ක් | |
| iv | 3 වසර | : | 50%ක් | පන්ති මට්ටමට අදාළ වාග්මාලාව ඉගෙනීමට අසමත් වී තිබේ. |
| | 4, 5 වසර | : | 70%ක් | |

v අවුරුදු දෙකක් පුරා පාසල් අධ්‍යාපනය ලැබීමෙන් පසු 25%ක ශිෂ්‍ය ප්‍රමාණයක් සාක්ෂරතා දැනුම ලබා නොමැත.

vi අප සමාජයේ සමාජ ආර්ථික ව්‍යුහය විසින් අධ්‍යාපන පද්ධතිය නිත්‍ය ලෙස පවත්වා ගෙන යනු ලබන බව පැහැදිලි වේ. මෙය සෑම සංවර්ධිත රටක ම පාහේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

(ආ) 1993 වර්ෂයෙහි දී 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණය සඳහා පෙනී සිටි 182,262 ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10.6%ක් ලකුණු 10%ට අඩුව ද, 49.6%ක් ලකුණු 35%ක් ද, 26.2% ක් පමණක් 50% ට වැඩි ලකුණු ප්‍රමාණයක් සිංහල භාෂාව විෂයට ලබා ගත් බව අනාවරණය වී ඇත.

(ඇ) "අවුරුදු 5ක කාලය තුළ ශිෂ්‍යයන් ලබා ඇති ඉගෙනුම කුමක් ද? (1995)", යන මැයෙන් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයෙහි ඇගයීම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික ශිෂ්‍යයන් පිළිබඳ ව කරන්නට යෙදුණු අධ්‍යයනයෙන් හෙළිවුණු කරුණු අප ප්‍රාථමික අධ්‍යාපන තත්ත්වය පිළිබඳ අනතුරු හැඟවීමක් කෙරේ.

මෙම සමීක්ෂණයට අනුව ශිෂ්‍යයන්ගේ සාධනය මෙසේයි :–

| | |
|---|---|
| කියවීම - ලිවීම - භාෂා කුසලතා | 21% |
| ගණිතමය හැකියාව | 13% |
| ජීවන කුසලතා | 20% |

උපුටා ගන්නා ලද ඉහත සඳහන් සංඛ්‍යාවලින්, ප්‍රාථමික පාඨශාලා ශිෂ්‍යයන්ගේ භාෂා කුසලතා සහ විඥපන කුසලතා ද අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව ද කෙතරම් දුර්වල මට්ටමක පවතී ද යන්න පෙන්නුම් කරයි.

## 02 පරිච්ඡේදය

# පර්යේෂණ අධ්‍යයන සැලසුම

2.01 අධ්‍යයන සැලසුමෙහි පසුතලය

ප්‍රාථමික ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ සන්නිවේදන විඥපන කුසලතා දුර්වල වීමට හේතු මොනවාදැයි පරීක්ෂා කිරීම මෙම අධ්‍යයන සැලසුම හා බැඳෙන විෂය පථය වේ. සාමාන්‍යයෙන් පුරුදු හැඩගස්වා ගැනීම සහ කුසලතා අත්පත් කර ගැනීම කෙරෙහි බලපාන විවිධ හා අන්තර් සම්බන්ධතා ඇති හේතු බොහොමයක් ඇත. මෙම ගැටලුව පිළිබඳව පාසලක් තුළ ඉගෙනුම්, ඉගැන්වීම් අවස්ථාවක් සැලකිල්ලට භාජන කළ හොත්, එය කෙරෙහි බලපාන, අසමාන ගණයේ විචල්‍යයන් රාශියක් ඇති බව පෙනේ. ඒවා අතර ශිෂ්‍යයාගේ ගෙදර පසුබිම සහ පාසල් පසුබිම යන විචල්‍යයන් දෙක කැපී පෙනේ. ප්‍රධාන භාෂා කුසලතා අංග හතර අත්පත් කර ගැනීම සඳහා පහසුවෙන් කියවීමේ යෙදීම ඉවහල්වන බව පැහැදිලි සාධකයකි. ඒවා නම්: සවන්දීම, කථාව, කියවීම, ලිවීම යන කුසලතාවන්ය. මෙම හැකියාවන් සාධනය කර නොගෙන පහසු ලෙස කියවීම කළ හැකි නොවේ. ඒ අනුව 2 සහ 4 යන ශ්‍රේණිවල භාෂා සාධනය සහ විඥපන කුසලතා දැනුම මැන බැලීම සඳහා එම ශ්‍රේණිවලට අදළ විෂයමාලා පදනම් කරගෙන පරීක්ෂණ පවත්වන ලදී.

2. 02 මෙම අධ්‍යයනයට අදළ සුවිශේෂී අරමුණු:

i ළමයින් තුළ කියවීමේ පුරුද්ද හීන වී යාමට හේතු සොයා බැලීම.

ii ළමයින්ගේ කියවීමේ හැකියාව තීරණය කෙරෙන සුවිශේෂී සාධක, විශේෂයෙන් ගෙදර පසුබිම සහ පාසල් පසුබිම විමසීම.

iii ළමයින්ගේ කියවීමේ හැකියාව සහ සාධන මට්ටම අතර ඇති සම්බන්ධතාව, දිස්ත්‍රික්ක අනුව, පාසල් වර්ග අනුව, ස්ත්‍රී පුරුෂ භේදය අනුව විමසීමට ලක් කිරීම.

iv ළමයින් තුළ කියවීම කෙරෙහි ඇති ඇල්ම සහ ආකල්ප විමර්ශනයට භාජනය කර, ඔවුන්ගේ කියවීමේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා සුදුසු යයි හැඟෙන ක්‍රම සහ විධි යෝජනා කිරීම.

v ළමයින්ගේ කියවීමේ පුරුද්ද කෙරෙහි ගුරුවරුන් දක්වන ආකල්ප සහ සිසුන්ගේ කියවීමේ හැකියා මට්ටමට හා විවිධ අවශ්‍යතා පිළිබඳව ගුරුවරුන්ගේ දැනුම හඳුනා ගැනීම.

vi ප්‍රාථමික ළමයින් තුළ කියවීමේ හැකියාව, කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය සඳහා යෝජනා නිර්දේශ සහ ප්‍රතිපෝෂණ වැඩ සටහන් ඉදිරිපත් කිරීම.

2. 03 පර්යේෂණ අධ්‍යයන ක්‍රමය

ඉහත සඳහන් කරන ලද අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය සඳහා එක් දිස්ත්‍රික්කයකින් පාසල් 3 බැගින් අනුරාධපුරය, කුරුණෑගල, මාතර සහ කොළඹ යන දිස්ත්‍රික්ක 4න් පාසල් 12ක් සමස්ත නියැදිය හැටියට තෝරා ගන්නා ලදී. (සිතියම-01, අඳුරු කර ඇති අධ්‍යාපන දිස්ත්‍රික්ක) මේ සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහයෝගය ලැබුණි. තෝරා ගන්නා ලද පාසල් 1 AB මහා විද්‍යාල, 1 AB ජාතික හා කණිෂ්ඨ පාසැල් සහ ප්‍රාථමික පාසැල් 2-3 යන වර්ගවලට අයත් වේ. පර්යේෂණ අධ්‍යයනය සඳහා මෙම පාසල් තෝරා ගැනීමෙහි දී, ළමයින්ගේ සාධන මට්ටම කෙරෙහි ඔවුන්ගේ සමාජ සහ ආර්ථික මට්ටම බලපෑමක් ඇති කරන බව හා එමගින් එය පාලනය කරන බව පිළිබඳව අවබෝධයකින් යුතුව ඒ කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කෙරුණි.

පාසල් තෝරා ගැනීමෙහිලා පිළිගනු ලැබූ අනිකුත් සැලකිය යුතු විචල්‍ය ලෙස හැඟී ගියේ "පාසලේ පිහිටීම සහ එයට ළඟා වීමට ඇති පහසුකම්, පාසල සතු මානව සහ භෞතික සම්පත් ප්‍රමාණය ආදියයි.

මේ අනුව පාසල් වර්ග 3කට බෙදා ගනු ලැබිණ:–

1. සාමාන්‍ය මට්ටමට අඩු සම්පත් ඇති පාසල්
2. සාමාන්‍ය මට්ටමට සම්පත් ඇති පාසල්
3. සාමාන්‍ය මට්ටමට වැඩි සම්පත් ඇති පාසල්


**01 වගුව**

**තෝරාගන්නා ලද පාසල් 12**

| දිස්ත්‍රික්කය | පාසල්වල නම් | | |
|---|---|---|---|
| | සාමාන්‍ය මට්ටමට අඩු සම්පත් ඇති පාසල් | සාමාන්‍ය මට්ටමට සම්පත් ඇති පාසල් | සාමාන්‍ය මට්ටමට වැඩි සම්පත් ඇති පාසල් |
| අනුරාධපුරය | ඩී. එස්. සේනානායක කණිෂ්ඨ විද්‍යාලය 2 AB | රත්මලේ තිස්ස මහා විද්‍යාලය 1 AB | වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලය 1 C |
| කුරුණෑගල | නිශ්ශංක මහා විද්‍යාලය 1 C | මලියදේව ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය 1 AB | වයඹ රාජකීය විද්‍යාලය III ශ්‍රේණිය |
| මාතර | යටියන කණිෂ්ඨ විද්‍යාලය 1 C | තිහගොඩ කණිෂ්ඨ විද්‍යාලය 1 C | ඕල්කට් ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය 3 AB |
| කොළඹ | ධර්මාශෝක කණිෂ්ඨ විද්‍යාලය 3 C | ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය 1 AB | ගැ. විශාඛා විද්‍යාලය පි. ආනන්ද විද්‍යාලය, කොළඹ ජාතික පාසල් |

01 සිතියම

නියැදියට අදාළ අධ්‍යාපන දිස්ත්‍රික්ක 4 දැක්වෙන සිතියම



මෙම අධ්‍යයනයට අදාළ පරීක්ෂණ පැවැත්වීම සඳහා කාල සීමාව තෝරා ගන්නා ලද්දේ ඒ ඒ ශ්‍රේණියට අයත් නිර්දේශිත වසරක පාඨමාලාව සාමාන්‍යයෙන් ආවරණය කර අවසන් වූ නොවැම්බර් මස මැද භාගයේ සිට දෙසැම්බර් මස මුල් සතිය දක්වා වූ කාලයයි. (1997 නොවැම්බර් - දෙසැම්බර්)

පරීක්ෂණයට භාජන කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 960කි. 2 වැනි ශ්‍රේණියෙන් සිසුන් 40ක් (ගැහැණු සහ පිරිමි ළමයින් 20 බැගින්) ද, 4 වැනි ශ්‍රේණියෙන් සිසුන් 40ක් ද නියැදියට ඇතුළත් කර ගන්නා ලදී. මේ අනුව එක් දිස්ත්‍රික්කයකින් සිසුන් 240ක් (ගැහැනු ළමයින් 120ක් සහ පිරිමි ළමයින් 120ක් ) පරීක්ෂණයට භාජන කෙරුණි.

**02 වගුව**
**පරීක්ෂණයට භාජනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව**
**2 සහ 4 වැනි ශ්‍රේණී**

| දිස්ත්‍රික්කය | 1 සාමාන්‍ය මට්ටමට අඩු සම්පත් ඇති පාසල් | | 2 සාමාන්‍ය මට්ටමට සම්පත් ඇති පාසල් | | 3 සාමාන්‍ය මට්ටමට වැඩි සම්පත් ඇති පාසල් | | සියල්ල | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 2 ශ්‍රේණිය | | 4 ශ්‍රේණිය | | සමස්ත එකතුව |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | |
| අනුරාධපුරය | 20 | 20 | 20 | 20 | 20 | 20 | 60 | 60 | 60 | 60 | 240 |
| කුරුණෑගල | 20 | 20 | 20 | 20 | 20 | 20 | 60 | 60 | 60 | 60 | 240 |
| මාතර | 20 | 20 | 20 | 20 | 20 | 20 | 60 | 60 | 60 | 60 | 240 |
| කොළඹ | 20 | 20 | 20 | 20 | 20 | 20 | 60 | 60 | 60 | 60 | 240 |
| එකතුව | 80 | 80 | 80 | 80 | 80 | 80 | 240 | 240 | 240 | 240 | |
| | 160 | | 160 | | 160 | | =480 | | =480 | | 960 |

## 03 පරිච්ජේදය

# දත්ත රැස්කිරීමේ උපකරණ

3.01 අ. 2 සහ 4 යන ශ්‍රේණි දෙකට වෙන් වශයෙන් භාෂා කුසලතා මැන ගැනීම සඳහා පරීක්ෂණ සකස් කරන ලදි. අත්දැකීම් බහුල ගුරු මහත්මීන් සමග සාකච්ඡා කිරීමෙන් පසු අදාළ ගැටලු තෝරාගෙන ප්‍රශ්න රාශියක් සුදනම් කොට, කුඩා ශිෂ්‍ය කණ්ඩායම් සමග ඒවා පිරිස්සුම් කෙරුණි. මෙම පූර්ව පරීක්ෂණයට පසුව සිසුන් සංඛ්‍යාවෙන් 66%කට වැඩි ප්‍රමාණයක් ලකුණු ලබාගත් ප්‍රශ්න තෝරා ප්‍රශ්න පත්‍ර සකස් කරන්නට යෙදුණි.

මෙම භාෂා ප්‍රශ්න පත්‍ර කොටස් දෙකකින් සමන්විත විය. එනම් "අ" කොටස හා ආ කොටස යි. කියවීමේ සහ විඥපන කුසලතා කෙරෙහි බලපාන සාධක තීරණය කිරීමට ඉතා උචිත යයි හැඟී ගිය හැකියා මැන ගැනීම සඳහා "අ" කොටස සකස් කෙරුණි. ඒ ඒ ශ්‍රේණියට අදළ පාඨමාලා නිර්දේශවල අන්තර්ගතය එම ප්‍රශ්න පත්‍රවලට පාදක විය. 2වැනි ශ්‍රේණියට ප්‍රශ්න 6ක් ද, 4 වැනි ශ්‍රේණියට ප්‍රශ්න 7ක් ද, සුදනම් කොට, භාෂාව භාවිත කිරීමෙහි දී ශිෂ්‍යයන් ඔවුන්ගේ වාග්මාලාව උපයෝගී කර ගන්නා අන්දම සහ මුද්‍රිත දෑ අවබෝධකර ගැනීමේ හැකියාව මැනගැනීම අපේක්ෂා කෙරුණි.

ආ. ප්‍රශ්න පත්‍රයෙහි "ආ" කොටස සකස් කරන ලද්දේ කියවීම පිළිබඳව ළමයින් තුළ පවත්නා ගුණාත්මක අදහස් අවබෝධ කර ගැනීම සඳහා කියවීමේ හැකියාව කෙරෙහි බලපාන විචල්‍ය මැන ගැනීමටය. මේ සඳහා ශ්‍රේණි දෙකට වෙන් වෙන් වශයෙන් අභිරුචි ලේඛනයක් සහ ස්වයං වාර්තා කියවීම් පරිමාණ ඇතුළත් ප්‍රශ්න 10 -20 දක්වා වු කියවීම් ආකල්ප සමීක්ෂණයක් සකස් කරන ලදී.

ඇ. එක් ශ්‍රේණියකින් ගුරු මහත්මීන් දෙදෙනකු සඳහා ප්‍රශ්න 20කින් යුක්තව පොත් කියවීම පිළිබඳ ස්වයං වාර්තා පරිමාණයක් සකස් කොට ගුරු මහත්මීන් 25 දෙනෙකුගෙන් ප්‍රකාශන ලබා ගන්නා ලදී.

ඈ. කියවීමේ පුරුද්ද වර්ධනය කර ගැනීමට අදළ නිර්ණායක සහ විඥපන කුසලතා ලබා ගැනීමට ඉවහල් වන උපදේශාත්මක අවස්ථා පිළිබඳව විදුහල්පතීන්ගේ අදහස් දැන ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කෙරුණි.

ඉ. ලේඛකයන් , පුස්තකාලයාධිපතීන්, ළමා පොත් චිත්‍ර ශිල්පීන් සහ අධ්‍යාපනඥයන් කිපදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ගැටලු පිළිබඳ පුලුල් අවබෝධයක් ලබා ගන්නා ලදී.

3.02 ප්‍රශ්න විසිරී ඇති අන්දම

රජයේ විෂයමාලා නිර්දේශය පදනම් කොට 2 වැනි ශ්‍රේණියට අදළ සිංහල භාෂාව ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න 6ක් ඇතුළත් කර පහත සඳහන් මාතෘකා යටතේ බෙද වෙන් කෙරුණි.

- i මෙතෙක් ඉගෙන ගෙන ඇති සිංහල හෝඩියේ අකුරු හඳුනා ගැනීම
- ii අකුරු 2 - 3කින් යුත් වචන හඳුනා ගැනීම
- iii වාග් මාලාව
- iv,v අවබෝධය, ප්‍රකාශනය සහ නිර්මාණය
- vi තමාගේ නම (මුල කොටසවත්) ලිවීමේ හැකියාව

ප්‍රශ්න අංක 1, කොටස් 6කින් යුක්ත විය. ඉන් පළමුවැන්න උදාහරණයක් හැටියට යොදන ලදී. මෙහි දී ළමයාට පින්තූර 4ක් ඉදිරිපත් කර ඒවායේ සෑම පළමුවන පින්තූරයක ම ආරම්භක අකුර තෝරා ඒ හා සමාන අකුරකින් පටන් ගන්නා අනික් පින්තූරය ඒ ඒ පේළියේ ඉතිරි ඒවායින් සොයා ඊට යටින් ඉරක් ඇඳීම. මෙම පින්තූර ළමයාගේ පරිසරයෙහි ඔහුට දක්නට ලැබෙන භාණ්ඩ සහ සතුන් ආදියට අයත් වූ ඒවාය.

ප්‍රශ්න අංක 2, පින්තූර 6ක කට්ටලයක් ළමයාට ඉදිරිපත් කර ඒවායේ නමට අයත් වචනයේ එක් අකුරක් අඩුවෙන් සඳහන් කර, එම අඩු අකුර යොදා වචනය අර්ථවත්ව සම්පූර්ණ කිරීම අපේක්ෂිත යි.

ප්‍රශ්න අංක 3, පින්තූර 5ක් සහ ඒවා විස්තර කෙරෙන වගන්ති 5ක් ළමයාට ඉදිරිපත් කෙරුණි. වචන 2 - 3කින් යුත් එම වගන්ති කියවා ඒවා පින්තූරය හා ගැළපීම අපේක්ෂා කෙරුණි.

ප්‍රශ්න අංක 4, අවස්ථා 3ක් විස්තර කෙරෙන, වචන 2 - 3කින් යුත් වගන්ති 3ක් ළමයාට ඉදිරිපත් කෙරුණි. ඒවා කියවා තේරුම් ගෙන, එම අවස්ථා චිත්‍රයකින් නිරූපණය කිරීම බලාපොරොත්තු වුණි.

ප්‍රශ්න අංක 5, යෝග්‍ය ක්‍රියාපද සහ නාමපද යටින් ඉරක් ඇඳ අර්ථවත් ලෙස වගන්ති 3ක් සම්පූර්ණ කිරීම අපේක්ෂා කෙරුණි.

ප්‍රශ්න අංක 6, නිතර භාවිතයේ යෙදෙන ළමයාගේ කෙටි නම ලිවීම.

3.03 4 වැනි ශ්‍රේණියේ සිංහල භාෂාව ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න 7ක් ඇතුළත් විය. එම ශ්‍රේණියට අදාළ සිංහල භාෂාව විෂය නිර්දේශයේ අන්තර්ගතයට අනුකූලව පරීක්ෂණ අරමුණු සකස් කරන ලදී.

**03 වගුව**

**2වැනි ශ්‍රේණිය - ප්‍රශ්න 6 විසිරී ඇති අන්දම**

| I | II | III | IV | V | VI |
|---|---|---|---|---|---|
| අකුරු හඳුනා ගැනීම | වචන හඳුනා ගැනීම | වාග්මාලාව | අවබෝධය ප්‍රකාශනය නිර්මාණය | අවබෝධය ප්‍රකාශනය නිර්මාණය | නම ලිවීම |
| ප්‍රශ්න 5 | 6 | 5 | 5 | 3 | 1 = 25 |

3. 03 ප්‍රශ්න අංක 1-2 වාග්මාලාව පිළිබඳ හැකියාව
3 අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව
4 කියවීම හා අවබෝධය
5 අනුමාන වශයෙන් අවබෝධය
6 ව්‍යාකරණානුකූලව ලිවීමේ හැකියාව
7 නිර්මාණාත්මකව ලිවීමේ හැකියාව සහ තමාගේ නම, ලිපිනය, වයස සහ පාසලේ නම ලිවීම.

ප්‍රශ්න අංක 1 සහ 2 ශිෂ්‍යයාගේ වාග්මාලාව සංවර්ධනය වී ඇති මට්ටම තීරණය කර ගැනීම සඳහා සකස් කර ඇත. මෙහිලා ශිෂ්‍යයාගෙන් බලාපොරොත්තු වූයේ සමානාර්ථ පද 5ක් සහ විරුද්ධාර්ථ පද 5ක් සැපයීමයි. මෙම වචන තෝරා ගන්නා ලද්දේ 4වැනි ශ්‍රේණියට නියමිත සිංහල පාඩම් පොතෙනි.

ප්‍රශ්න අංක 3 සකස්කර ඇත්තේ ශිෂ්‍යයාගේ අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව මැන ගැනීමටය. වැරදි සහිතව ලියා ඇති අකුරු නිවැරැදිව ලිවීම අපේක්ෂිත ය.

ප්‍රශ්න අංක 4, හතර වැනි ශ්‍රේණියට නියමිත සිංහල පොතෙන් කවි 6කින් යුත් පද්‍යාවලියක් කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව සහ එම දැනුම භාවිත කිරීමේ හැකියාව මැන ගැනීම සඳහා සකස් කෙරුණි.

යමක් කියවා ඒ පිළිබඳව අනුමාන වශයෙන් නිගමනවලට එළඹීමේ හැකියාව මැනගැනීම සඳහා ප්‍රශ්න අංක 5, සකස් කරන ලද්දේ, එම හැකියාව කියවීම හා වාග්මාලා ප්‍රවර්ධනයට ඉවහල් වන හෙයිනි.

ව්‍යාකරණානුකූලව ලිවීමේ හැකියාව සොයා බැලීම සඳහා ප්‍රශ්න අංක 6 සකස් කෙරුණි. ප්‍රථම පුරුෂ සහ උත්තම පුරුෂ ඒක වචන බහු වචනවලට අදාළ ක්‍රියාපද යෙදීමේ හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න 10ක් සකස් කෙරුණි.

ශිෂ්‍යයන්ගේ නිර්මාණාත්මක රචනා කුසලතා නිගමනය කර ගැනීම සඳහා සරල මාතෘකා 4ක් ඉදිරිපත් කෙරුණි. ඒ සමග ම තමාගේ සම්පූර්ණ නම, ලිපිනය සහ පාසලේ නම ආදිය ලිවීම පිළිබඳ හැකියාව ද මැනීමට හසු කරන ලදී.

**04 වගුව**
**ප්‍රශ්න පත්‍රයට අදාළ උප පරීක්ෂණවල ප්‍රකාශන සංඛ්‍යාව සහ**
**ලකුණු ප්‍රමාණය - 4 වැනි ශ්‍රේණිය**

| | 1-2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| ප්‍රකාශන | වාග්මාලාව සමානාර්ථ විරුද්ධාර්ථ | අක්ෂර වින්‍යාසය හැකියාව | අවබෝධය | අනුමාන ලෙස අවබෝධය | ව්‍යාකරණානුකූලව ලිවීමේ හැකියාව | නිර්මාණාත්මක රචනා ශක්තිය |
| ප්‍රශ්න සංඛ්‍යාව | 5 5 | 10 | 5 | 5 | 10 | තෝරා ගැනීමට මාතෘකා 4 ක් |
| ලකුණු සංඛ්‍යාව % | 10 | 10 | 10 | 10 | 20 | 40 = 100 |

.ආ. කොටස

## 3.04 කියවීම පිළිබඳ ආකල්ප සමීක්ෂණය හා අභිරුචි ලේඛන ලැයිස්තුව

අ. ශිෂ්‍යයන් කියවීම කෙරෙහි දක්වන ගුණාත්මක අදහස් දැන ගැනීම මෙම සමීක්ෂණයේ පරමාර්ථය විය. මෙහි අංක 4, 10, 11 සහ 14 යන 2 වැනි ශ්‍රේණියට අදාළ ප්‍රශ්න සැලසුම් කරන ලද්දේ ළමයින්ගේ කියවීම පිළිබඳ අභිරුචි, විශේෂයෙන් ඒ අය සවන්දීමට කැමති කතන්දර පිළිබඳ අදහස් ලබා ගැනීමටය. ප්‍රශ්න අංක 12 සහ 13 ළමයින් විවේක කාලයෙහි දී නිරතවන ක්‍රියාකාරකම් ද, ප්‍රශ්න අංක 7 සහ 8 තුළින් ඔවුන්ගේ ජනප්‍රිය රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ද අපේක්ෂා කෙරුණි.

ආ. 4 වැනි ශ්‍රේණියට අදාළ කියවීම් අභිරුචි ලේඛනගත කිරීම සඳහා ළමයාගේ පවුලට අයත් පසුබිම පාදක කර ගැනුණි. අංක 5, 6, 8 සහ 14 යන ප්‍රශ්නවලින් අපේක්ෂා කරන ලද්දේ ළමයාගේ කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා සංවර්ධනය කිරීම සඳහා දෙමව්පිය වැඩිහිටියන්ගෙන් ලැබෙන

පිටුබලය පිළිබඳ සාමාන්‍ය තොරතුරු රැස්කර ගැනීමයි. අංක 9-10 සහ 15 -20 දක්වා ප්‍රශ්න , කියවීම කෙරෙහි ළමයින් දක්වන ආකල්ප සහ අභිරුචි විමසීම සඳහා සකස් කෙරුණි.

ඇ. ගුරුවරුන් 25 දෙනකු සඳහා සකස් කරන ලද ස්වයං වාර්තා කියවීම් පරිමාණයේ ප්‍රශ්න 20 මෙසේ වෙන් කරන ලදී.

I අංක 1-5 දක්වා ගුරුවරියගේ අධ්‍යාපන සුදුසුකම්, පුහුණුව ආදී තොරතුරු ලබා ගැනීම

II අංක 6-15 ළමා පොත්, අභිරුචි හා කියවීමේ පුරුද්ද ප්‍රවර්ධනය සඳහා අදහස් විමසීම.

III අංක 16-20 ළමයින්ගේ කියවීම දුර්වල වීමට හේතු සාධක, ඊට පිළියම්, පන්ති පුස්තකාල පිළිබඳ ගුරුවරුන් දරන මත විමසීම.

ඈ කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය සඳහා පාසල කොතෙක් දුරට පිටුවහලක් වේ දැයි දැන ගැනීම සඳහා පාසල් ප්‍රධානීන් වෙනුවෙන් පාසල් පරිසරය හා සම්පත් පිළිබඳව, ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී.

## 04 පරිච්ඡේදය

# දත්ත විශ්ලේෂණය

4. 01 "ප්‍රාථමික පාසල් ළමයින් තුළ කියවීමේ පුරුද්ද සහ විඥාපන කුසලතා ප්‍රවර්ධනය කිරීම" යන මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අදළ පරීක්ෂණ පැවැත්වීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා ඌනතාවක් ඇතිවීමට හේතු භූත වූ කරුණු විමසා බැලීමයි. ඕනෑ ම කෙනකුගේ කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා, පහසුවෙන්, අනායාසයෙන් කියවීමේ හැකියාව, තමන් විසින් කියවන ලද දෑ අවබෝධ කර ගැනීම, තොරතුරු උකහා ගැනීම සහ ඒවා අවශ්‍ය අවස්ථාවල දී වාචිකව හෝ ලිඛිතව අර්ථකථනය කිරීම යනාදී කරුණු රාශියක් මත රඳ පවතී. පහසුවෙන්, ආයාසයකින් තොරව කියවීමේ හැකියාවක් තිබීම - සවන්දීම - කථනය, කියවීම - ලිවීම යන මූලික චතුර්විධ භාෂා හැකියා ප්‍රගුණ කර ගැනීමේ සමුච්චිත ප්‍රතිඵලයකි. මෙම සාක්ෂරතා සාධනය යනු සංකීර්ණ, ශාරීරික සහ මානසික ක්‍රියාවලියකි. එය අත්පත් කර ගැනීමට නිසැකව ම ඉගැන්වීම සහ පුහුණුව අවශ්‍ය වේ. ඕනෑ ම ඉගැන්වීම්, ඉගෙනුම් අවස්ථාවක් කෙරෙහි විචල්‍ය රාශියක් බලපෑම් ඇති කරන බව සහ අනුබලයක් සිදු කරන බව, පිළිගත් කරුණකි. එහෙයින්, මෙම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා විවිධ පරීක්ෂණ ගණනාවක් කිරීමට සිදු විය. ඒ සඳහා අනු පරීක්ෂණ ඇතුළත් භාෂා පරීක්ෂණ ආකල්ප ලේඛන, අභිරුචි ස්වයං වාර්තා පරිමාණ, සිසුන් වෙනුවෙන් ද, ආකල්ප පරීක්ෂණ ගුරුවරුන් වෙනුවෙන් ද, ප්‍රශ්නාවලියක් විදුහල් ප්‍රධානීන් වෙනුවෙන් ද යොදා ගන්නා ලදී.

2වැනි සහ 4 වැනි ශ්‍රේණි සඳහා භාෂා සහ ආකල්ප පරීක්ෂණ වෙන් වශයෙන් පැවැත්වුණි. ඉන්පසු, දිස්ත්‍රික්ක අනුව, පාසල් වර්ග අනුව, ශිෂ්‍යයන්ගේ ස්ත්‍රී - පුරුෂ භේදය අනුව සහ විඥාපන හා ආකල්ප පරීක්ෂණ අනුව දත්ත විශ්ලේෂණය කර ඒවා කේන්ද්‍රගත කෙරුණි. ශිෂ්‍යයන්ගේ සමස්ත කාර්ය සාඵල්‍යය සංඛ්‍යාත වගු, ප්‍රතිශත, සමාන්තර මධ්‍යන්‍යය, සම්මත අපගමනය ආදී මාණ උපයෝග කරගෙන ගැහැනු - පිරිමි ළමයින් සඳහා වෙන් වෙන්ව වගුගත කිරීම, ප්‍රස්ථාර ඇඳීම ආදිය මගින් විස්තර කරන ලදී.

4.02 මෙම අධ්‍යයනයෙහි අභිප්‍රාය ඉටුකර ගැනීම සඳහා අනුරාධපුරය, කුරුණෑගල, මාතර, සහ කොළඹ යන දිස්ත්‍රික්ක 4න් නියැදිය සඳහා තෝරාගනු ලැබූ පාසල් පහත දැක්වෙන අන්දමට වර්ග කෙරිණි.

1. මානව සහ භෞතික සම්පත් සාමාන්‍ය මට්ටමට අවමව ඇති පාසල්
2. මානව සහ භෞතික සම්පත් සාමාන්‍ය මට්ටමේ පවතින පාසල්
3. මානව සහ භෞතික සම්පත් සාමාන්‍ය මට්ටමට වැඩි පාසල්

මෙම පාසල් තෝරා ගන්නා ලද්දේ ප්‍රාදේශීය සහ කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහාය ඇතිවය.

4.03 මෙම දත්ත විශ්ලේෂණයෙහි දී සමස්ත සාධනය සඳහා වෙන් කරන ලද ලකුණුවලින් 80%ක් ලබාගත් ශිෂ්‍යයන් විශිෂ්ට මට්ටමට (Master Level = ML) ළඟා වූ අය හැටියට උපකල්පනය කෙරුණි. අදළ ශ්‍රේණියේ අපේක්ෂිත මට්ටම කරා ළඟාවීමට නොහැකි වූ ශිෂ්‍ය ප්‍රතිශතය, එනම්, සමස්ත සාධන ලකුණුවලින් 30%ක් පමණක් ලබාගත් අය, සාමාන්‍යය අවම මට්ටමකට ළඟා වූ ලෙස උපකල්පනය ( Sub - Standard Level = SSL) කරන ලදී.

මෙම මට්ටම් දෙකට වෙන් කෙරුණු ලකුණු පරාසය මෙසේය.

1. සාමාන්‍යය අවම මට්ටම (SSL) = 0 -30 % දක්වා
2. විශිෂ්ට ලකුණු මට්ටම (ML) = 80% -100% දක්වා

මෙම මට්ටම් දෙකට අයත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සමස්ථ නියැදියේ ප්‍රතිශතයක් හැටියට, දිස්ත්‍රික්ක, පාසල් වර්ග හා ස්ත්‍රී පුරුෂ භේදයට අනුව ගණනය කෙරුණි.

**05 වගුව**
**2වැනි ශ්‍රේණියේ කාර්ය සාඵල්‍යයට අදාළ සාමාන්‍යය**

| දිස්ත්‍රික්කය | 1 සාමාන්‍ය මට්ටමට අඩු සම්පත් ඇති පාසල් | | 2 සාමාන්‍ය මට්ටමක සම්පත් ඇති පාසල් | | 3 සාමාන්‍ය මට්ටමට වැඩි සම්පත් ඇති පාසල් | |
|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. |
| අනුරාධපුර | 87.6 | 71.6 | 80.4 | 79.7 | 83.8 | 84.8 |
| කුරුණෑගල | 88.6 | 82.2 | 89 | 84 | 91.8 | 91 |
| මාතර | 91.5 | 88.6 | 84.4 | 78.6 | 91.8 | 84 |
| කොළඹ | 82.6 | 83 | 88.4 | 94.7 | 94 | 89.8 |

4.04 5වගුවෙන් පෙන්නුම් කරන පරිදි 2වැනි ශ්‍රේණියේ සිංහල භාෂාව පිළිබඳ කාර්ය සාඵල්‍යය ඉතා ඉහළ මට්ටමක පවතී. දිස්ත්‍රික් පාසල් වර්ග හෝ ගැහැනු - පිරිමි භේදය අනුව විෂමතාවක් ද දක්නට නොලැබේ.


**06 වගුව**
**4 වැනි ශ්‍රේණියේ කාර්ය සාඵල්‍යය - මධ්‍යන්‍යය හා සම්මත අපගමනය**

| දිස්ත්‍රික්කය | | පාසල් වර්ග 1 | | පාසල් වර්ග 2 | | පාසල් වර්ග 3 | | දිස්ත්‍රික්ක අනුව එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. |
| අනුරාධපුර | සාමාන්‍යය | 25.6 | 15.3 | 29.6 | 18.5 | 37.6 | 29.6 | 31 | 21.1 |
| අනුරාධපුර | අපගමනය | 14.4 | 10.6 | 7.9 | 5.7 | 18.2 | 21.4 | | |
| කුරුණෑගල | සාමාන්‍යය | 29 | 24 | 35.8 | 35 | 64.3 | 50.2 | 42 | 36.4 |
| කුරුණෑගල | අපගමනය | 11.7 | 18 | 17.5 | 18 | 16.8 | 15.4 | | |
| මාතර | සාමාන්‍යය | 41.7 | 24.8 | 33.8 | 16.8 | 67.5 | 60 | 47.6 | 34 |
| මාතර | අපගමනය | 17.4 | 20 | 17.8 | 10.5 | 12.5 | 10.5 | | |
| කොළඹ | සාමාන්‍යය | 54.6 | 41.7 | 72 | 62 | 58.5 | 54.3 | 61.8 | 52.8 |
| කොළඹ | අපගමනය | 18.9 | 14 | 13 | 11.9 | 15.19 | 16.8 | | |
| සමස්ථ සාමාන්‍යය | | 32 | | 38 | | 53 | | | |

4.05 එහෙත්, 4 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ කාර්ය සාඵල්‍යයේ සාමාන්‍යය ඔවුන් ලබා ඇති භාෂා අධ්‍යයනය පිළිබඳ අනතුරු හැඟවීමක් කරයි. භාෂා කුසලතා හා විඥාපන සාධනය අතින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි නියැදියට අයත් පාසල්වල සියලු ම ගැහැනු හා පිරිමි ශිෂ්‍යයන්, එම ශ්‍රේණියට අපේක්ෂිත මට්ටමට ළඟාවීමට අපොහොසත් වී තිබේ. 1වැනි සහ 2 වැනි වර්ගවලට අයත් කුරුණෑගල සහ මාතර යන දිස්ත්‍රික්කවල 4 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ සාධන මට්ටම ද එසේ ම අසාර්ථක බව පෙන්නුම් කෙරේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි දෙවැනි වර්ගයට අයත් පාසල්වල මෙම ශ්‍රේණියට අයත් සිසුන්ගේ භාෂා කුසලතා සාධනයේ සාමාන්‍යය 3 වැනි වර්ගයේ සිසුන්ගේ සාමාන්‍යයට වඩා වැඩි බව පෙනේ. (06 වගුව) පුද්ගලිකව ගුරුවරුන් සේවයට කැපවීම සහ එම ගුරුවරුන් විසින් අනුගමනය කරනු ලබන ඉගැන්වීම් ක්‍රමවල කාර්යක්ෂමතාව මෙයින් පිළිබිඹු වේ. කෙසේ වුව ද, කොළඹ දිස්ත්‍රික්කයෙහි නියැදියට අයත් පාසල්වල සිසුන්ට ඉහළ මට්ටමේ සාමාන්‍යයක් හිමිවේ: ගැහැනු ළමයින්ගේ 61.8 පිරිමි ළමයින්ගේ 52.8 ( 06 වගුව බලන්න.)

පාසල් වර්ග කිරීමට අනුව එම සාමාන්‍යය ගණනය කළ විට පාසල් අතර සහ අන්තර් පාසල් අතර පැහැදිලි විෂමතාවක් දක්නට ඇත. 1 වර්ගයේ සාමාන්‍ය මට්ටමට අඩු සම්පත් ඇති පාසල්වල භාෂා කුසලතා සාඵල්‍යයේ සාමාන්‍යය 32.1 ක් වේ. 2 වැනි වර්ගයේ සාමාන්‍ය මට්ටමක සම්පත් සතු පාසල්වල එය 37.9 ක් වන අතර 3 වැනි වර්ගයේ සාමාන්‍ය මට්ටමට වැඩි සම්පත් ඇති පාසල්වල සාමාන්‍යය 52.7 කි. ළමයින්ගේ අධ්‍යාපන කාර්ය සාධනය කෙරෙහි, විශේෂයෙන් භාෂා කුසලතා සාධනය කෙරෙහි පාසල් පරිසරය තුළ පවත්නා පහසුකම් හා සම්පත් තීරණාත්මක සාධකයක් වන අන්දම මෙයින් පැහැදිලි වේ. එසේම ගැහැණු ළමයින් පිරිමි ළමයින්ට වඩා දක්ෂතාවක් පෙන්වා ඇති බව දිස්ත්‍රික්ක හතරේ ම ලකුණුවලින් පැහැදිලි කෙරේ. අංක 7 වගුවෙන් දැක්වෙන ප්‍රස්තාරයෙන් එය තවදුරටත් සනාථ කෙරේ.

**07 වගුව**
**භාෂා කුසලතා සාධනයෙහි සාමාන්‍යය පාසල් වර්ග 1,2,3 අනුව**



4 .06 4 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගේ ද සමස්ත සාධනය විස්තරාත්මක ලෙස ගණ දෙකකට වෙන්කර ඇගයීමට ලක් කරන ලදී. පළමුවන ගණයට භාෂා කුසලතා සාධනයෙහිලා විශිෂ්ට මට්ටමකට ළඟා වූ (ML), එනම් 80% ට වැඩි ලකුණු ලබාගත් සිසුන් ද, දෙවැනි ගණයට 4 වැනි ශ්‍රේණියට අදාළ අපේක්ෂිත මට්ටමට ළඟාවීමට අසමත් වූ 30%ට අඩු ලකුණු ලබාගත් සිසුන් ද ඇතුළත් වුණි.

**8 වගුව**
**භාෂා කුසලතා පිළිබඳ සමස්ත සාධන මට්ටම්**
**4 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට මට්ටම 80% වැඩි ලකුණු | | | | අසමත් මට්ටම 30% ට අඩු ලකුණු | | | | දිස්ත්‍රික්ක අනුව අසමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | එකතුව | % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ + පි | |
| අනුරාධපුර | - | - | - | - | 37 | 51 | 61.6 | 85 | 88 | 66.6 |
| කුරුණෑගල | 3 | 1 | 5 | 1.6 | 32 | 32 | 53 | 53 | 64 | 53 |
| මාතර | 3 | 1 | 5 | 1.6 | 22 | 38 | 36.6 | 63 | 60 | 50 |
| කොළඹ | 11 | 5 | 18.3 | 8.3 | 5 | 13 | 8.3 | 21.6 | 18 | 15 |
| එකතුව | 17 | 7 | 7 | 3 | 96 | 134 | 40 | 55.8 | 230 | 48 |

නියැදියට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල්වල එක ම ශිෂ්‍යයෙකුටවත් විශිෂ්ට සාධන මට්ටමට ළඟා වීමට නොහැකි වූ බව වගු අංක 08න් පෙන්නුම් කෙරේ. කුරුණෑගල සහ මාතර යන දිස්ත්‍රික්ක දෙකෙහි ද විශිෂ්ට සාධන මට්ටම ඉතාමත් පහළ බව පෙනේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි පවා විශිෂ්ට සාධන මට්ටම 18.3% සහ 8.3% වශයෙන් ගැහැණු - පිරිමි ළමයි පිළිවෙළින් ලබාගෙන ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව 66.6% කි. කුරුණෑගල 53% කි. මාතර 50% කි. 15%අඩු ප්‍රතිශතයක් ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ පමණි. එසේ ම දිස්ත්‍රික්ක හතරේ ම පිරිමි ළමයින් වැඩි සංඛ්‍යාවක් ගැහැණු ළමයින්ට වඩා අසමත් වී ඇත. (අංක 8 වගුව)

**09 වගුව**
**පාසල් වර්ගවලට අනුව විශිෂ්ට සමාර්ථය = ලකුණු 80%**

| දිස්ත්‍රික්කය | පාසල් වර්ගය 1 | | පාසල් වර්ගය 2 | | පාසල් වර්ගය 3 | |
|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි |
| අනුරාධපුර | - | - | - | - | - | - |
| කුරුණෑගල | - | - | - | 1 | 3 | - |
| මාතර | - | - | - | - | 3 | 1 |
| කොළඹ | 1 | - | 8 | 3 | 2 | 2 |
| එකතුව | 1 | - | 8 | 4 | 8 | 3 |
| % | 1.25 | - | 10 | 5 | 10 | 3.75 |

**10 වගුව**
**පාසල් වර්ගවලට අනුව අසමත් සංඛ්‍යාව = ලකුණු 30%**

| දිස්ත්‍රික්කය | පාසල් වර්ගය 1 | | පාසල් වර්ගය 2 | | පාසල් වර්ගය 3 | |
|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි |
| අනුරාධපුර | 13 | 19 | 13 | 19 | 11 | 13 |
| කුරුණෑගල | 16 | 16 | 13 | 12 | 3 | 4 |
| මාතර | 9 | 17 | 13 | 20 | - | 1 |
| කොළඹ | 4 | 8 | 1 | 1 | - | 4 |
| එකතුව | 42 | 60 | 40 | 52 | 14 | 22 |
| % | 63.75 | | 57.5 | | 22.5 | |

අංක 09 සහ 10 වගුවලින් පාසල් වර්ග 1, 2, 3, ට අනුව විශිෂ්ට සහ අවම ලකුණු ලබාගත් ගැහැණු සහ පිරිමි ශිෂ්‍ය සංඛ්‍යාව පෙන්නුම් කෙරේ. 1 වර්ගයේ පාසල්වල සිසුන් ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා අසමත් වී ඇත. සම්පත් සහ පහසුකම් වැඩි වන විට අසමත් වන ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වන අන්දම වගු අංක 10 න් පිළිබිඹු වේ. උදහරණ: අසමත් ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රතිශතය:

1 වර්ගය පාසල් = 63.75%
2 වර්ගය පාසල් = 57.5%
3 වර්ගය පාසල් = 22.5%

## 05 පරිච්ඡේදය

# භාෂා පරීක්ෂණ හා බැඳෙන අනුපරීක්ෂණ විශ්ලේෂණය - 2 වැනි ශ්‍රේණිය

5.01 මේ අන්දමට බලන විට ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් කාර්ය සාඵල්‍යයෙහි, දිස්ත්‍රික්ක, පාසල් වර්ග සහ ගැහැනු - පිරිමි ළමයින් අතර පුලුල් විවිධත්වයක්, වෙනසක් ඇත. (ඔප්පුකර තිබේ.) ඒ පිළිබඳව තව දුරටත් විස්තර ලබා ගැනීම සහ ගැටලුවට අදළ අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර සියුම් ලෙස පරීක්ෂාවට භාජන කිරීම සඳහා 2 සහ 4 වසර යන ශ්‍රේණිවල පරීක්ෂණ අරමුණු අනු පරීක්ෂණ කාර්ය සංසිද්ධිය හා සම්බන්ධ කොට වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කරන ලදී. සෑම අනු පරීක්ෂණ අංගයක් සඳහා 80%ක් ලකුණු ලබා විශිෂ්ට මට්ටමට ළඟා වූ සංඛ්‍යාව සහ 30%ක් ලකුණු ලබා ඒ ඒ ශ්‍රේණියේ අපේක්ෂිත සාධන මට්ටමට ළඟාවීමට නොහැකිව අසමත් වූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් දිස්ත්‍රික්ක අනුව, පාසල් වර්ග අනුව සහ ගැහැනු - පිරිමි භේදය අනුව ගණනය කර ඒවායේ ප්‍රතිශතය ලබා ගන්නා ලදී. (11 වගුව බලන්න.)

(අ) සිංහල හෝඩියේ උගෙනගත් අකුරු හඳුනා ගැනීම - 2 වැනි ශ්‍රේණිය

පරීක්ෂණයේ 1 වැනි ප්‍රශ්නය වූයේ සිංහල හෝඩියේ සිසුන් උගෙනගෙන ඇති අකුරු කීපයක් තෝරා ගෙන ඒවා හඳුනා ගැනීමට භාජන කිරීමයි. එයට පින්තූර ඇතුළත් අනු ප්‍රශ්න 5ක් අයත් විය. ශිෂ්‍යයා පළමුවන පින්තූරයෙන් කියැවෙන පළමුවන අකුර හඳුනාගෙන එම පේළියේ අනිකුත් පින්තූරවලින් ඊට සමාන අකුරකින් පටන් ගැනෙන පින්තූරය සොයා හරි (✓) ලකුණ දමයි. මෙම පළමුවැනි ප්‍රශ්නයට අදළ සිසුන්ගේ සාධනය, විශිෂ්ට (ML) සහ සාමාන්‍ය මට්ටමට අඩු (SSL) ලකුණු ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව වගු අංක 12න් දැක්වේ. සමස්තයක් හැටියට ශිෂ්‍යයන්ගේ කාර්ය සාඵල්‍යය සතුටුදයකය. දිස්ත්‍රික්ක සහ පාසල් වර්ග අනුව සාධනයේ විෂමතාවක් දක්නට නොලැබේ. එසේ වුවත්, දිස්ත්‍රික්ක හතරේ ම ගැහැනු ළමයින් පිරිමි ළමයින්ට වඩා ඉදිරියෙන් සිටින බව මෙම පරීක්ෂණයෙන් පෙන්නුම් කෙරේ.

(ආ) අකුරු 2- 3කින් යුක්ත වචන හඳුනා ගැනීම

පරීක්ෂණයේ II වැනි ප්‍රශ්නයයි. රවුමක් ඇතුළේ සපයා තුබූ අකුරුවලින් අර්ථවත් වචන ලිවීම ශිෂ්‍යයා විසින් කළ යුතු විය. මෙම අනු පරීක්ෂණයෙන් 83% ක් පමණ ගැහැනු ළමයින් ද, 80% ක් පමණ පිරිමි ළමයින් ද විශිෂ්ට සාධන මට්ටමට (ML) ළඟා වී තිබුණි. අනෙකුත් දිස්ත්‍රික්ක තුනෙහි ඊටත් වඩා ඉහළ ප්‍රතිඵල දක්නා ලදී. වචන හඳුනාගැනීමේ පරීක්ෂණයෙන් ගැහැනු ළමයින් 5%ක් ද පිරිමි ළමයින් 8%ක් ද අවශ්‍ය සාධන මට්ටමට ළඟා වී නොමැත.

## 11 වගුව
## පරීක්ෂණ අරමුණුවලට අනුව දත්ත විශ්ලේෂණය - 2 වැනි ශ්‍රේණිය

| පාසල් වර්ගය | එක් දිස්ත්‍රික්කයකට අයත් පාසල් | ප්‍රශ්න අංක 1 උගත් අකුරු හඳුනා ගැනීම 80% + | | 30% - | | 2 වචන හඳුනා ගැනීම 80% + | | 30% - | | 3 වාග් මාලාව 80% + | | 30% - | | 4 අනුමාන ලෙස අවබෝධය 80% + | | 30% - | | 5 ප්‍රකාශනය + නිර්මාණය 80% + | | 30% - | | 6 තමාගේ නම ලිවීමට නොහැකි සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. |
| 1 | 1 | 16 | 15 | - | 2 | 16 | 14 | - | 4 | 17 | 14 | - | 3 | 18 | 12 | - | 1 | 12 | 12 | - | 5 | 2 | - |
| | 2 | 15 | 6 | 2 | 5 | 20 | 19 | - | - | 19 | 18 | - | - | 20 | 20 | - | - | 19 | 18 | 1 | 2 | - | - |
| | 3 | 16 | 11 | 2 | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | 19 | 20 | - | - | - | - |
| | 4 | 8 | 10 | 10 | 6 | 20 | 19 | - | - | 18 | 20 | 2 | - | 19 | 20 | - | - | 19 | 14 | - | 2 | 2 | 1 |
| එකතුව | " | 55 | 42 | 14 | 13 | 76 | 72 | - | 4 | 74 | 72 | 2 | 3 | 77 | 72 | - | 1 | 69 | 64 | 1 | 9 | 4 | 1 |
| % | " | 68.8 | 52.5 | 17.5 | 16.25 | 95 | 90 | - | 5 | 92.5 | 90 | 2.5 | 3.8 | 96.25 | 90 | - | 1.25 | 86.3 | 80 | 1.25 | 11.25 | 5 | 1.25 |
| 2 | 1 | 11 | 10 | 4 | 2 | 15 | 15 | 2 | - | 20 | 14 | - | 1 | 20 | 17 | - | 1 | 13 | 13 | 1 | 2 | 1 | 5 |
| | 2 | 14 | 14 | 1 | 2 | 20 | 20 | - | - | 20 | 17 | - | - | 19 | 9 | - | - | 18 | 15 | 1 | 4 | - | 3 |
| | 3 | 14 | 12 | 1 | 5 | 19 | 17 | - | - | 17 | 14 | - | 4 | 18 | 20 | - | - | 17 | 18 | 1 | 1 | 2 | 2 |
| | 4 | 18 | 9 | 2 | 6 | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | - | - |
| එකතුව | " | 57 | 45 | 8 | 15 | 74 | 72 | 2 | - | 77 | 65 | - | 5 | 77 | 66 | - | 1 | 68 | 66 | 3 | 7 | 3 | 10 |
| % | " | 71.25 | 56.3 | 10 | 18.8 | 92.5 | 90 | 2.5 | - | 96.25 | 81.25 | - | 6.25 | 96.25 | 82.5 | - | 1.25 | 85 | 83 | 3.8 | 8.8 | 3.8 | 12.3 |
| 3 | 1 | 14 | 14 | 2 | 3 | 19 | 19 | 1 | 1 | 17 | 18 | 2 | 2 | 19 | 18 | 1 | 1 | 15 | 18 | 3 | 1 | 2 | 5 |
| | 2 | 15 | 15 | 2 | 2 | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 20 | - | - | - | - |
| | 3 | 17 | 16 | 1 | 2 | 19 | 20 | - | - | 20 | 19 | - | - | 20 | 20 | - | - | 20 | 18 | - | 2 | - | - |
| | 4 | 20 | 17 | - | 1 | 20 | 20 | - | - | 20 | 20 | - | - | 20 | 14 | - | - | 19 | 19 | 1 | 1 | - | - |
| එකතුව | " | 66 | 62 | 3 | 8 | 78 | 79 | 1 | 1 | 77 | 77 | 2 | 2 | 79 | 72 | - | - | 74 | 75 | 4 | 4 | 2 | 5 |
| % | " | 82.5 | 77.5 | 3.8 | 10 | 97.5 | 98.8 | 1.25 | 1.25 | 96.25 | 96.25 | 2.5 | 2.5 | 98.75 | 90 | - | - | 92.5 | 93.8 | 5 | 5 | 2.5 | 6.25 |

12 වගුව
**අකුරු හඳුනා ගැනීම පිළිබඳ 2 වැනි ශ්‍රේණියේ**
**විශිෂ්ට සහ අව - සාමාන්‍ය කාර්ය සාඵල්‍යය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාමාර්ථ එකතුව | | % | | අසමත් සංඛ්‍යාව | | දිස්ත්‍රික්ක අනුව විශිෂ්ට සාමාර්ථ | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | එකතුව | % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. + පි. | |
| අනුරාධපුරය | 41 | 39 | 68 | 65 | 6 | 7 | 80 | 66.6 |
| කුරුණෑගල | 44 | 35 | 73 | 58 | 5 | 9 | 79 | 65.8 |
| මාතර | 47 | 39 | 78 | 65 | 4 | 7 | 86 | 71.6 |
| කොළඹ | 46 | 30 | 76 | 60 | 12 | 13 | 76 | 68.3 |

13 වගුව
**වචන හඳුනා ගැනීම 2 වැනි ශ්‍රේණිය**
**විශිෂ්ට සහ අව - සාමාන්‍ය කාර්යය සාඵල්‍යය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාමාර්ථ එකතුව | | % | | අසමත් සංඛ්‍යාව | | දිස්ත්‍රික්ක අනුව විශිෂ්ට සාමාර්ථ | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | එකතුව | % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. + පි. | |
| අනුරාධපුරය | 50 | 48 | 83 | 80 | 3 | 5 | 98 | 81.6 |
| කුරුණෑගල | 60 | 59 | 100 | 98 | - | - | 119 | 99.1 |
| මාතර | 58 | 57 | 96 | 95 | - | - | 115 | 95.8 |
| කොළඹ | 60 | 59 | 100 | 98 | - | - | 119 | 99.1 |

(ඇ) වාග්මාලාව සහ අවබෝධය

14 වගුවෙන් පෙන්නුම් කරන පරිදි දිස්ත්‍රික්ක 4ට ම අයත් නියැදියේ පාසල්වල 2 වැනි ශ්‍රේණියේ සිසුන් සියලු දෙනා ම පාහේ, එනම් 83%කට වැඩි සංඛ්‍යාවක් අවබෝධයෙන් යුක්තව කියවීමේ හැකියාව අත්පත් කරගෙන ඇත. අසමත් වී ඇත්තේ ඉතා ම සුළු සංඛ්‍යාවක් බව එයින් පෙන්නුම් කෙරේ.

**14 වගුව**
**වාග් මාලාව සහ අවබෝධය - 2වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාමාර්ථ එකතුව | | % | | අව සාමාන්‍ය සාමාර්ථ | | % | දිස්ත්‍රික්ක වශයෙන් විශිෂ්ට සාමාර්ථ | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ.+පි | එකතුව | % |
| අනුරාධපුරය | 54 | 46 | 90 | 76 | 2 | 6 | 6.6 | 100 | 83 |
| කුරුණෑගල | 59 | 55 | 98 | 91 | - | - | - | 114 | 95 |
| මාතර | 57 | 53 | 95 | 88 | - | 4 | 3.3 | 110 | 91.6 |
| කොළඹ | 58 | 60 | 96 | 100 | 2 | - | 1.6 | 118 | 98.1 |

IV අනුමාන වශයෙන් අදහස් අවබෝධ කර ගැනීම

මෙම අනුපරීක්ෂණයට ප්‍රශ්න 3ක් ඇතුළත් වුණි. වචන 2-3කින් යුත් වගන්ති 3ක් කියවා ඒවායේ අදහස අවබෝධ කරගෙන එම අදහස නිරූපණය කෙරෙන සරල චිත්‍රයක් ඇඳීම සිසුන්ගෙන් බලාපොරොත්තු වුණි. එම ප්‍රතිඵල ද ඉතාමත් සාර්ථක විය. සිසුන් සියලු දෙනා ම පාහේ විශිෂ්ට සාධන මට්ටමට ළඟා වී තිබුණි.

**15 වගුව**
**අවබෝධය අනුමාන ලෙස අදහස් ඉදිරිපත් කිරීම - 2වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාමාර්ථය එකතුව | | % | | අව සාමාන්‍ය සාමාර්ථය එකතුව | | % | දිස්ත්‍රික්ක වශයෙන් විශිෂ්ට සාමාර්ථ | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ.+පි. | එකතුව | % |
| අනුරාධපුරය | 57 | 47 | 95 | 78 | 1 | 3 | 3 | 104 | 88.6 |
| කුරුණෑගල | 59 | 49 | 98 | 81 | - | - | - | 108 | 90 |
| මාතර | 58 | 60 | 96 | 100 | - | - | - | 118 | 98 |
| කොළඹ | 59 | 54 | 98 | 90 | - | - | - | 113 | 94 |

**16 වගුව**
**ප්‍රකාශනය සහ නිර්මාණාත්මක හැකියාව - 2 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාමාර්ථය එකතුව | | % | | අව සාමාන්‍ය සාමාර්ථ | | | දිස්ත්‍රික්ක මට්ටම විශිෂ්ට සාමාර්ථ එකතුව % | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ.+පි. | එකතුව | % |
| අනුරාධපුරය | 40 | 43 | 66 | 71 | 4 | 8 | 10 | 83 | 69 |
| කුරුණෑගල | 57 | 53 | 95 | 88 | 2 | 6 | 6 | 110 | 91.6 |
| මාතර | 56 | 56 | 93 | 93 | 1 | 1 | 1.6 | 112 | 93 |
| කොළඹ | 58 | 53 | 96 | 88 | 1 | 3 | 2.5 | 111 | 92.5 |

IV ප්‍රකාශනාත්මක සහ නිර්මාණාත්මක හැකියාව

කුරුණෑගල, මාතර සහ කොළඹ යන දිස්ත්‍රික්ක තුනේ සිසුන්ගේ ප්‍රකාශනාත්මක සහ නිර්මාණාත්මක හැකියාවේ විශිෂ්ට සාධන මට්ටම 96% කි. (16 වගුව බලන්න) අනුරාධපුරය 69% කි. අසමත් වූ සංඛ්‍යාව ඉතා අල්ප බව මෙහි දී පැහැදිලි ය.

**17 වගුව**
**තමාගේ නම ලිවීමට නොහැකි ශිෂ්‍ය සංඛ්‍යාව - 2 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | ගැ. | පි. | ගැ.+පි. එකතුව | ගැ.+පි. % |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 5 | 10 | 15 | 12.5 |
| කුරුණෑගල | - | 3 | 3 | 2.5 |
| මාතර | 2 | 2 | 4 | 3.3 |
| කොළඹ | 2 | 1 | 3 | 2.5 |
| | | | 25 | 10 |

අංක 17 වගුවට අනුව කියවීමට හැකි තත්ත්වයට තමාගේ නම ලියා ගැනීමට නොහැකි වූ සිසුන්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 12.5%ක් ඇති බව පෙනේ. එයින් පෙන්නුම් කෙරෙන්නේ 87% කට සෑහීමට පත් විය හැකි අන්දමට තමාගේ නම ලියා ගත හැකි බවය.

පාසල් වර්ගවලට අනුව, මෙම භාෂා පරීක්ෂණයේ ප්‍රශ්න සියල්ලට ම සිසුන් ලබාගත් ලකුණු ප්‍රමාණය, විශිෂ්ට මට්ටම සහ අව සාමාන්‍ය මට්ටම යන දෙකෙහි ප්‍රතිශතය ගණනය කිරීමෙන් සිසුන්ගේ සාධන මට්ටම කෙරෙහි කොතෙක් දුරට පාසල් සතු මානව සහ භෞතික සම්පත් බලපාන්නේදැයි පෙන්නුම් කෙරේ. ප්‍රශ්න පහට ම විශිෂ්ට මට්ටම සඳහා ඉහළ ම සාධන මට්ටමේ ප්‍රතිශතය ලබාගෙන ඇත්තේ මානව සහ භෞතික සම්පත් වැඩි ප්‍රමාණයක් සතු 3 වැනි වර්ගයේ පාසල්වල ඉගෙන ගන්නා සිසුන් බව අංක 18-01-සහ 18-02 වගුවලින් දැක්වේ. අව සාමාන්‍ය මට්ටමට අයත් 1 වැනි වර්ගයේ පාසල්වල සාධනය මීට ප්‍රතිවිරුද්ධ බව එම වගුවෙන් පැහැදිලි කෙරේ. කරුණු මෙසේ වුවත් 2 වැනි ශ්‍රේණියේ සමස්ත සාධන මට්ටම 4 වැනි ශ්‍රේණිය සමග සසඳ බලන විට අතිශයින් ප්‍රශංසා කටයුතුය.

**18 - 01 වගුව**

**භාෂා කුසලතා සාධනයෙහි විශිෂ්ට මට්ටම - 2 වැනි ශ්‍රේණිය**

| ප්‍රශ්න අංක | 1 | | 2 | | 3 | | 4 | | 5 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | |
| වර්ගය | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| 1 | 97 | 60.5 | 148 | 92.5 | 146 | 91 | 149 | 93 | 133 | 83 |
| 2 | 102 | 63.8 | 146 | 91 | 142 | 88.8 | 143 | 89 | 134 | 83.8 |
| 3 | 128 | 80 | 157 | 98 | 154 | 96.3 | 151 | 94 | 149 | 93 |

**18 - 02 වගුව**

**භාෂා කුසලතා සාධනයෙහි**

**අව සාමාන්‍ය සාධනය 2 වැනි ශ්‍රේණිය**

| ප්‍රශ්න අංක | 1 | | 2 | | 3 | | 4 | | 5 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | | ශිෂ්‍ය සංඛ්‍යාවේ | |
| වර්ගය | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| 1 | 27 | 17 | 4 | 2.25 | 5 | 3.3 | 1 | 0.6 | 10 | 6.2 |
| 2 | 23 | 14 | 2 | 1.25 | 5 | 3.3 | 1 | 0.6 | 10 | 6.2 |
| 3 | 13 | 8 | 2 | 1.25 | 4 | 2.2 | 2 | 1.25 | 8 | 5 |

## 5.02 4 වැනි ශ්‍රේණියේ භාෂා පරීක්ෂණයේ අනුපරීක්ෂණ විශ්ලේෂණය

4 වැනි ශ්‍රේණියේ භාෂාව ප්‍රශ්න පත්‍රයට ප්‍රශ්න 7ක් අයත් විය. එක් එක් ප්‍රශ්නයට අදළ අරමුණු සහ අනු-පරීක්ෂණ ප්‍රශ්න මෙසේ විශ්ලේෂණය කරන ලදි.

### 1 වාග් මාලාව - සමාන පද

මෙම සමාන පද තෝරා ගනු ලැබුවේ එම ශ්‍රේණියට නියමිත සිංහල පාඩම් පොතෙනි. මෙහිදී ද විශිෂ්ට මම්ටම හා අව සාමාන්‍ය මට්ටම විශ්ලේෂණයට භාජන කරන්නට යෙදුණි. (19 වගුව බලන්න. )

**19 වගුව**
**විශිෂ්ට සාධන මට්ටමේ සහ අව - සාමාන්‍ය සාධන මට්ටමේ**
**ගණනය කිරීම - 2 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | විශිෂ්ට සාධන මට්ටම එකතුව | අව සාමාන්‍ය සාධන මට්ටම එකතුව | විශිෂ්ට සාධන මට්ටම % | අව සාමාන්‍ය සාධන මට්ටම % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | | | | |
| අනුරාධපුර | 2 | 5 | 3.3 | 8.3 | 37 | 43 | 61.7 | 71.7 | 7 | 80 | 5.8 | 66.6 |
| කුරුණෑගල | 12 | 2 | 20 | 3.3 | 29 | 33 | 48.3 | 55 | 14 | 62 | 10.8 | 51.7 |
| මාතර | 15 | 9 | 25 | 15 | 23 | 30 | 38.3 | 50 | 24 | 53 | 20 | 44 |
| කොළඹ | 28 | 26 | 46.7 | 43.3 | 11 | 10 | 18.3 | 16.7 | 54 | 21 | 45 | 17.5 |
| | | | | | | | | | 99 | 216 | 21 | 45 |

මෙම අනු-පරීක්ෂණ විශ්ලේෂණයෙහි දිස්ත්‍රික්ක අතර පැහැදිලි විෂමතාවක් විද්‍යමාන වේ. කැපී පෙනෙන විශිෂ්ට සාධන මට්ටමකට ළඟා වී ඇත්තේ වැඩි සම්පත් සතු කොළඹ දිස්ත්‍රික්කයෙහි පාසල්වල සිසුන් පමණි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින්ගෙන් 62%ක් ද, පිරිමි ළමයින්ගෙන් 72%ක් ද 4 වැනි ශ්‍රේණියට නියමිත වාග්මාලාව ඉගෙනීමට අසමත් වූ බව 19 වැනි වගුවෙන් පැහැදිලි ලෙස පෙන්නුම් කෙරේ. තවද කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි සිසුන්ගෙන් 52%ක් ද, මාතර දිස්ත්‍රික්කයෙහි සිසුන්ගෙන් 44%ක් ද මෙම අනු-පරීක්ෂණයෙන් අසමත් වී තිබේ. මේ අනුව සමස්ත නියැදියෙන් 45%ක් ම අපේක්ෂිත වාග්මාලා සංවර්ධනය අත්පත් කරගෙන නැත.

### 2. වාග්මාලාව - විරුද්ධ පද - සංවර්ධන මට්ටම

සිසුන්ගේ වාග්මාලාව පිළිබඳ සංවර්ධන මට්ටම සොයාබැලීම සඳහා සකස් කරන ලද මෙම ප්‍රශ්නයෙහි පිළිතුරු ද ඉතා දුර්වල බව 20 වැනි වගුවෙන් පිළිබිඹු වේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින් පමණක් 58.3% ක ලකුණු මට්ටමක් ලබා ඇත. හැම අවස්ථාවක දී ම පිරිමි ළමයින්ගේ ලකුණු මට්ටම ගැහැනු ළමයින්ගේ ලකුණු මට්ටමට වඩා අඩු බව මෙම පරීක්ෂණවලින් පෙනුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිසුන්ගේ විශිෂ්ට සාධන මට්ටම 30.8% කි. කොළඹ සහ අනුරාධපුරය අතර පැහැදිලි ව සනිටුහන් කළ හැකි ලකුණු පරාසයක් ඇත. එසේ වුව ද මෙම අනු-පරීක්ෂණයෙන් අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව එතරම් විශාල නොවේ. අංක 20 වගුවට අනුව එය 23% ක් පමණි.

**20 වගුව**

**අනු-පරීක්ෂණය - වාග් මාලාව - විරුද්ධාර්ථ පද - 4 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව අව සාමන්‍ය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | විශිෂ්ට සාධන මට්ටම එකතුව | විශිෂ්ට සාධන මට්ටම % | අව සාමාන්‍ය සාධන මට්ටම එකතුව | අව සාමාන්‍ය සාධන මට්ටම % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | | | | |
| අනුරාධපුර | 4 | 8 | 6.6 | 13.3 | 18 | 19 | 30 | 31 | 12 | 10 | 37 | 30.8 |
| කුරුණෑගල | 19 | 8 | 31.6 | 13.3 | 18 | 14 | 30 | 23 | 27 | 22.5 | 32 | 26.6 |
| මාතර | 11 | 13 | 18.3 | 21.7 | 11 | 21 | 18.3 | 35 | 24 | 20 | 32 | 26.6 |
| කොළඹ | 35 | 16 | 58.3 | 26.6 | 01 | 07 | 1.6 | 11.6 | 51 | 42.5 | 08 | 6.7 |
| | | | | | | | | | 114 | 24 | 109 | 23 |

3. අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව

අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව ඇගයීමේ සාධන මට්ටමෙහි ප්‍රතිශතය දුටුවකුගේ හිත අධෛර්යයට පත් වේ. දිස්ත්‍රික්ක 4න් ම සිසුන්ගෙන්, විශිෂ්ට සාධන මට්ටමට ළඟා වී ඇත්තේ 2.7%ක් පමණි. තම ශ්‍රේණියට අදාළ වචනවල අකුරු නිවැරදිව ලිවීමට 4 වැනි ශ්‍රේණියේ සිසුන් 64%ක් අසමත් වූ බව අංක 21 වගුවෙන් දක්වයි. ඒ අංශයෙන් ඉතා ම දුර්වලතාවක් දැක් වූ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි සිසුන් 82% ක් අසමත්ව ඇත. අනෙක් දිස්ත්‍රික්ක තුනට වඩා වැඩි වෙනසක් කොළඹ දිස්ත්‍රික්කයෙහි දක්නට ලැබුණ ද, එය පවා එතරම් ඉහළ මට්ටමක නොවන බව 21 වැනි වගුවෙන් පෙන්නුම් කෙරේ. ඒ අතරින් පිරිමි ළමයින් ඉතා ම දුර්වල බව පෙනේ.

**21 වගුව**

**අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව අව සාමාන්‍ය සාධන මට්ටම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | | |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | එකතුව | % |
| අනුරාධපුරය | 0 | 0 | 0 | 0 | 44 | 54 | 73 | 90 | 98 | 81.6 |
| කුරුණෑගල | 2 | 0 | 3.3 | 0 | 41 | 43 | 68.3 | 71.6 | 84 | 70 |
| මාතර | 2 | 0 | 3.3 | 0 | 40 | 46 | 66.6 | 76.6 | 86 | 71.7 |
| කොළඹ | 8 | 1 | 13 | 1.7 | 13 | 27 | 21.7 | 45 | 40 | 33 |
| එකතුව | 12 | 1 | 13 | 2.7 | 138 | 170 | 57.5 | 70.8 | 308 | 64 |

## 4. කියවීම හා අවබෝධය

22 වැනි වගුවට අනුව කියවීම හා අවබෝධය යන අංශයෙහි ඒ ඒ දිස්ත්‍රික්කවල, පාසල් වර්ගවල සහ ස්ත්‍රී පුරුෂ භේදය අනුව පැහැදිලි විෂමතාවක් ඇති බව පෙනේ. නියමිත පාඩම් පොතෙන් උපුටා ගන්නා ලද සරල කවි 6ක් අවබෝධ කර ගැනීම අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින්ගෙන් 78%ක ට ද, පිරිමි ළමයින්ගෙන් 58%ක ට ද නොහැකි වුණි. පාසල් වර්ග අනුව සලකා බලන විට වැඩි පහසුකම් සහ සම්පත් සතු පාසල්වල සිසුන්ගේ ලකුණු ප්‍රමාණය සහ අව ප්‍රමාණ සම්පත් ඇති පාසල්වල සිසුන්ගේ ලකුණු මට්ටම දෙස අප අවධානය යොමු කිරීමෙන් කියවීම හා අවබෝධය හීන වී ගෙන යන අයුරු පැහැදිලි වේ. උදහරණ:

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයෙහි | විශිෂ්ට සාධන මට්ටම ගැහැනු | | | | 75% යි. |
| මාතර දිස්ත්‍රික්කයෙහි | ,, | ,, | ,, | ,, | 60% යි. |
| කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි | ,, | ,, | ,, | ,, | 41% යි. |
| අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි | ,, | ,, | ,, | ,, | 24% යි. |

**22 වගුව**
**කියවීම හා අවබෝධය පිළිබඳ කාර්ය සාඵල්‍යය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | විශිෂ්ට සාධන මට්ටම | | අව සාමන්‍ය මට්ටම | |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | එකතුව | % | එකතුව | % |
| අනුරාධපුරය | 14 | 10 | 23 | 16.6 | 47 | 35 | 78 | 58 | 24 | 20 | 82 | 68.3 |
| කුරුණෑගල | 18 | 23 | 30 | 38.3 | 20 | 22 | 33 | 36.6 | 41 | 34 | 42 | 35 |
| මාතර | 35 | 25 | 58.3 | 41.7 | 11 | 22 | 18 | 36.6 | 60 | 50 | 33 | 27.5 |
| කොළඹ | 42 | 33 | 70 | 55 | 06 | 07 | 10 | 11.7 | 75 | 62.5 | 13 | 10.8 |
| සමස්ත එකතුව | 109 | 91 | 45 | 38 | 84 | 86 | 35 | 36 | 200 | 41.6 | 170 | 35.4 |

## 5. අනුමාන වශයෙන් අවබෝධය

මෙම අනු - පරීක්ෂණයෙන් විශිෂ්ට සාධන මට්ටමට ළඟා වූ සංඛ්‍යාවෙන් දිස්ත්‍රික්ක අනුව ඇති විෂමතාව අනාවරණය වේ. කොළඹ දිස්ත්‍රික්කයෙන් 50%ක් විශිෂ්ට සාධන මට්ටම ලබා ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශිෂ්ට සාධන මට්ටම ලබා ඇත්තේ 10% ක් පමණි. තමා විසින් කියවන ලද දෙයකින් අනුමාන වශයෙන් අදහස් ලබා ගැනීමටත්, ඒවායේ සම්බන්ධතාව දැකීමටත් ඉගෙනීමට අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 59%ක් සහ කුරුණෑගලින් 45% ක සංඛ්‍යාවක් අසමත් වී තිබේ. ඔවුන්ගේ කියවීමේ කුසලතාව, ඒ තුළින් තොරතුරු සෙවීම සහ අවශ්‍ය විට දී ඒවාට අර්ථකථනය කිරීමේ හැකියාව සංවර්ධනය වී නොමැත. මෙයින් පිළිබිඹු වන්නේ ඉගැන්වීම් ක්‍රමවල පවත්නා දුර්වලතාවකි. කියවීමේ පුරුද්ද ඇති වීම සඳහා සිසුන් පෙළඹවීමට නම් කියවීමේ හැකියාව වර්ධනය වන අන්දමට ඉගැන්වීම් ක්‍රම සකස් කර ගත යුතු වේ. මෙම අනු පරීක්ෂණයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ හැර අනිකුත්

දිස්ත්‍රික්කවල ගැහැනු ළමයින් පිරිමි ළමයින් අභිබවා ඇත. මෙහි ලා උපරිම ලකුණු ප්‍රමාණයක් ලබා ඇත්තේ මාතර දිස්ත්‍රික්කයෙහි සිසුවියන්ය. එය 56.7% කි. අසමත් වූ වැඩි ම ප්‍රමාණය, එනම් 61.7% අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පිරිමි ළමයින්ට හිමි වී ඇත. (අංක 23 වගුව බලන්න.)

**23 වගුව**

**අනුමාන ලෙස අවබෝධය පිළිබඳ කාර්ය සාඵල්‍යය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | විශිෂ්ට සාධන මට්ටම | | අව සාමන්‍ය මට්ටම | |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | එකතුව | % | එකතුව | % |
| අනුරාධපුරය | 9 | 4 | 15 | 6.6 | 34 | 37 | 56.7 | 61.7 | 13 | 10.8 | 71 | 59 |
| කුරුණෑගල | 16 | 15 | 26.7 | 25 | 24 | 30 | 40 | 50 | 31 | 25.8 | 54 | 45 |
| මාතර | 34 | 20 | 56.7 | 33.3 | 13 | 23 | 21.7 | 38.3 | 54 | 45 | 36 | 30 |
| කොළඹ | 29 | 31 | 48.3 | 51.7 | 06 | 06 | 10 | 10 | 60 | 50 | 12 | 10 |
| එකතුව | 88 | 70 | 36.7 | 29 | 77 | 96 | 32 | 40 | 158 | 33 | 173 | 36 |

## 6. ව්‍යාකරණානුකූලව ලිවීමේ කුසලතා

සම්මත ව්‍යාකරණානුකූලව ලිවීමේ සහ ව්‍යවහාරයට ගැළපෙන ලෙස ලිවීමේ හැකියාව මත ලිඛිත ප්‍රකාශනයේ කාර්යක්ෂමතාව රඳ පවතී. ව්‍යාකරණානුකූලව ලිවීමේ කුසලතා සංවර්ධනය කිරීමේ අත්තිවාරම ප්‍රාථමික පාඨශාලාවෙහි දී ගොඩනගා ගත යුතු වේ. අංක 24 වගුවෙන් පෙන්නුම් කරන පරිදි ව්‍යාකරණානුකූලව ලිවීමේ කුසලතාව අත්පත් කර ගැනීමේ දී දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු විෂමතාවක් ඇති බව පැහැදිලි වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පිරිමි ළමයින්ගෙන් 70%ක් ද, ගැහැනු ළමයින්ගෙන් 56.7%ක් ද, මාතර දිස්ත්‍රික්කයෙන් පිරිමි ළමයින්ගෙන් 60%ක් ද ව්‍යාකරණානුකූල ව ලිවීමේ කුසලතා පරීක්ෂණයෙන් අසමත් වී තිබේ. නිවැරදිව කර්තෘ සහ ආඛ්‍යාතය යොද වගන්ති 5ක් ලිවීමට ඒ අයට නොහැකි වුණි. මීට ප්‍රතිවිරුද්ධ ව, කොළඹ දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින්ගෙන් 68.3% ක් ද, පිරිමි ළමයින්ගෙන් 51.6 ක් ද විශිෂ්ට සාධන මට්ටමට ළගා වී ඇත. මෙහිලා ගැහැනු ළමයින්ගේ සාධනය පිරිමි ළමයින්ට වඩා වැඩි බව සමස්ත ලකුණුවලින් පැහැදිලි වේ. ගැහැනු ළමයි 36% ක් විශිෂ්ට සාධන සාමාර්ථ ලකුණු ලබා ඇති අතර පිරිමි ළමයින්ගෙන් විශිෂ්ට සාධන මට්ටමට ළගා වී ඇත්තේ 26% ක් පමණි. පාසල් වර්ග අතර ද මෙම විෂමතාව කැපී පෙනේ. විශේෂයෙන් පාසල් වර්ග 1 සහ 3 අතර පහසුකම් සහ සම්පත් පරතරය සාධනය කෙරෙහි බලපා ඇත. කියවීම සඳහා අවශ්‍ය ළමයින් කැමති පොත පත හිගවීම, ප්‍රාථමික පුහුණු ගුරු හිගය, ඇප කැපවීමෙන් තම සේවයේ යෙදෙන ගුරු පිරිසෙහි ඌනතාව වැනි අඩුපාඩු රැසක් එම පාසල්වල පැහැදිලි ලෙස විද්‍යමාන වේ. සමස්තයක් වශයෙන් ගත් කල නියැදියට අයත් කොළඹ දිස්ත්‍රික්කයෙහි සිසුන් 60%ක් විශිෂ්ට සාධන මට්ටමට ළගා වී ඇති අතර එය අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 6.6 ක් වීම ඛේදජනක ය.

**24 වගුව**

**ව්‍යාකරණානුකූලව ලිවීමේ කුසලතා සාධනය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | විශිෂ්ට සාධන මට්ටම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | එකතුව | % | එකතුව | % |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | | | | |
| අනුරාධපුරය | 6 | 2 | 10 | 3.3 | 34 | 42 | 56.7 | 70 | 8 | 6.6 | 76 | 63.3 |
| කුරුණෑගල | 19 | 21 | 31.7 | 35 | 19 | 21 | 31.7 | 35 | 40 | 33.3 | 40 | 33.3 |
| මාතර | 21 | 8 | 35 | 13.3 | 20 | 36 | 33.3 | 60 | 29 | 24.1 | 56 | 46.6 |
| කොළඹ | 41 | 31 | 68.3 | 51.6 | 06 | 07 | 10 | 11.6 | 72 | 60 | 13 | 10.8 |
| සමස්ත එකතුව | 87 | 62 | 36 | 26 | 79 | 106 | 33 | 44 | 149 | 31 | 185 | 38 |

## 7. නිර්මාණාත්මක ලිවීමේ කුසලතා

අනු - පරීක්ෂණ හත අතුරින් සාධනයේ අවම මට්ටමින් මුල් තැන, අක්ෂර වින්‍යාසයට ලැබෙන අතර එම අංශයේ දෙවැනි තැන ලැබෙන්නේ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා පරීක්ෂණයට යි. මෙහි දී ශිෂ්‍යයන්ට "මගේ ගම", "මා දුටු පෙරහැරක් ", "සිහිනයක් " වැනි ඉතා සරල මාතෘකා ඉදිරිපත් කෙරුණි. සිසුන් බහුතරයකට නිවැරදි ව, පැහැදිලි ව, අවම වශයෙන් වගන්ති 10ක් වත් ලියා ගැනීමට නොහැකි වුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි නියැදියට අයත් පාසල්වල එකම ශිෂ්‍යයකුටවත් විශිෂ්ට සාධන මට්ටමට ළඟාවීමට නො හැකි විය. කුරුණෑගල සහ මාතර යන දිස්ත්‍රික්කවල විශිෂ්ට සාධන මට්ටමට ළඟා වී ඇත්තේ ශිෂ්‍යයන්ගෙන් 10% ක් පමණි.

**25 වගුව**

**නිර්මාණාත්මක ලිවීමේ කුසලතාව - 4 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | විශිෂ්ට සාධන මට්ටම | | | | අව - සාමාන්‍ය සාධන මට්ටම | | | | දිස්ත්‍රික්ක අනුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | % | | එකතුව | | % | | විශිෂ්ට සාධන මට්ටම | | අව සාමන්‍ය මට්ටම | |
| | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | එකතුව | % | එකතුව | % |
| අනුරාධපුරය | 0 | 0 | 0 | 0 | 44 | 57 | 73 | 95 | 0 | 0 | 101 | 84.1 |
| කුරුණෑගල | 5 | 2 | 8.3 | 3.3 | 34 | 43 | 56.7 | 71.6 | 07 | 5.8 | 77 | 64.1 |
| මාතර | 4 | 1 | 6.7 | 1.6 | 39 | 49 | 65 | 81.6 | 05 | 4.1 | 88 | 73.3 |
| කොළඹ | 24 | 11 | 40 | 18.3 | 17 | 31 | 28.3 | 51.6 | 35 | 29.1 | 48 | 40 |
| සමස්ත එකතුව | | | | | | | | | 42 | 9.8 | 314 | 65 |

නිර්මාණාත්මක ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා වුවමනා කෙරෙන මූලික පියවර අත්පත් කර නො ගත් ශිෂ්‍ය සංඛ්‍යාව බහුතරයකි. අනුරාධපුර දිස්ත්‍රික්කය 84%කි. මාතර දිස්ත්‍රික්කය 73%කි. කුරුණෑගල 64%කි. ළමයින් තුළ පවත්නා සහජ හැකියාවක් වූ නිදහස් ප්‍රකාශනයන් ඉස්මතු කොට සංවර්ධනය කළ හැක්කේ ප්‍රාථමික අවදියෙහිදී ය. ළමයින්ගේ මෙම සහජ හැකියාව, ඔවුන්ගේ කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පෙළඹවීමට ගුරුවරුන්ට උපයෝගී කර ගැනීමට පුලුවන. එම අභියෝගයට මුහුණ දීමට ගුරුවරුන් විසින් නවීකරණය වී ඇති ඉගැන්වීම් ක්‍රම සහ නවතම චින්තාවලියකින් ද පරිපූර්ණ විය යුතු වේ.

**26 වගුව**
**තමාගේ නම, වයස, ලිපිනය, පාසලේ නම සෑහීමට පත්වන අයුරු ලිවීමට නොහැකි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය**

| දිස්ත්‍රික්කය | I නම | | | II වයස | | | III ලිපිනය | | | IV පාසලේ නම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව |
| අනුරාධපුරය | 7 | 19 | 26 | 10 | 16 | 26 | 34 | 48 | 82 | 27 | 25 | 52 |
| % | 11.6 | 31.6 | 22.6 | 16.6 | 26.6 | 22 | 56.6 | 80 | 67 | 45 | 41.6 | 43 |
| කුරුණෑගල | 6 | 13 | 19 | 10 | 10 | 20 | 16 | 28 | 44 | 16 | 14 | 30 |
| % | 10 | 21.6 | 16 | 16.6 | 16.6 | 16.6 | 26.6 | 46.6 | 36 | 26.6 | 23 | 25 |
| මාතර | 3 | 10 | 13 | 21 | 28 | 49 | 14 | 17 | 31 | 4 | 13 | 17 |
| % | 5 | 16.6 | 35 | 35 | 46.6 | 41 | 23 | 28 | 26 | 6.6 | 21.6 | 14 |
| කොළඹ | 5 | 7 | 12 | 5 | 7 | 12 | 2 | 6 | 8 | 7 | 11 | 18 |
| % | 8 | 11.6 | 10 | 8 | 11.6 | 10 | 3 | 10 | 6.6 | 11.6 | 18 | 15 |
| එකතුව | 21 | 49 | 70 | 46 | 61 | 107 | 66 | 99 | 165 | 54 | 63 | 117 |
| % | 14.5 | | | 22 | | | 34 | | | 24 | | |

අ. තමා ගේ නම ලිවීම

නියැදියට අයත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 31.6%ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි 21.6 % ක් ද, මාතර දිස්ත්‍රික්කයෙහි 16.6%ක් ද, කොළඹ දිස්ත්‍රික්කයෙහි 11.6%ක් පිරිමි ළමයින් තමාගේ නම, සෑහීමට පත් විය හැකි අයුරින් ලිවීමට අසමත් වී තිබේ. එහෙත් ගැහැනු ළමයින්ගේ අසමත් සංඛ්‍යාව එතරම් ප්‍රකට නොවේ.

ආ. තමා ගේ වයස ලියා දැක්වීම

නියැදියට අයත් පාසල්වල සිසුන්ගෙන් මාතර දිස්ත්‍රික්කයෙහි 40%ක් ද, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 22%ක් ද තම වයස නිවැරදි ව ගණනය කර අවුරුදු මාස වශයෙන් ලිවීමට නොහැකි වී ඇත. අවුරුද්ද, මාස යන සංකල්ප හරිහැටි ඉගෙන ගෙන නොතිබීම මෙහිලා සිසුන් මුහුණ පා ඇති ගැටලුවයි.

ඇ. තමාගේ ලිපිනය ලිවීම

අවුරුදු 4ක් පුරා පාසලේ අධ්‍යාපනය ලැබීමෙන් පසු නියැදියට අයත් පාසල්වලින් අනුරාධපුරයෙහි පිරිමි ළමයින් 80%ක්, ගැහැනු ළමයින් 56%ක්, කුරුණෑගල පිරිමි ළමයින් 46.6%ක් සහ ගැහැනු ළමයින් 26.6%ක්, මාතර ගැහැනු ළමයින් 23%ක් සහ පිරිමි ළමයින් 28%ක්, තමාගේ පුද්ගලික ලිපිනය, නිවැරැදි ව සහ පැහැදිලි ව ලිවීමට අසමත් වීම කණගාටුදායක කරුණකි. ඉගැන්වීමේ කාර්යයෙහි දී ඉගෙනීම ශිෂ්‍යයන්ගේ ජීවිතය හා සම්බන්ධ කර නැති බව මෙයින් පෙන්නුම් කෙරේ.

ඇ. තමා ගේ පාසලේ නම ලිවීම

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින් 45% ක්, පිරිමි ළමයින් 41% ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින් 26.6 %ක්, පිරිමි ළමයින් 23%ක්, මාතර දිස්ත්‍රික්කයෙහි පිරිමි ළමයින් 21.6% ක්,සහ කොළඹ දිස්ත්‍රික්කයෙහි ගැහැනු ළමයින් 11.6%ක් සහ පිරිමි ළමයින් 18%ක් ම සෑහීමට පත් විය හැකි මට්ටමකට තම පාසලේ නම ලිවීමට අසමත් වී තිබේ.
සමස්තයක් හැටියට ගත් විට නියැදියට අයත් පාසල්වල සිසුන්ගෙන් තම නම, වයස, ලිපිනය සහ පාසලේ නම ලිවීමට අසමත් වූවන්ගේ ප්‍රතිශතය මෙසේ ය:

| | | |
|---|---|---|
| I | නම | = 14.5% |
| II | වයස | = 22% |
| III | ලිපිනය | = 34% |
| IV | පාසලේ නම | = 24% |

මුලින් ම පාසලෙන් ගිලිහී යන්නේ මෙම දුර්වල සිසුන් නිසා, ඒ අයට අවම වශයෙන් මූලික සමාජීය ඉල්ලීමවත් ඉගැන්වීමට ගුරුවරුන් උත්සුක විය යුතු ය. නියමිත විෂය නිර්දේශයෙහි ම එල්බගෙන හැකිතාක් වේගයෙන් එය ආවරණය කිරීමට උත්සාහ ගන්නවා විනා බුද්ධිය අඩු හෝ වැඩි ශිෂ්‍යයාටත් සමාජයේ ජීවත්වීමට උදවු කිරීමට සමහර ගුරුවරුන් සූදනම් නැතිවාක් මෙන් පෙනේ. ළමයාට කියවීමට ඇති දෑ ඔහුගේ ජීවිතයට සම්බන්ධ විය යුතුය. ඉගැන්වීම් ක්‍රම සහ භාෂාව ඉගැන්වීමේ අරමුණු හා සම්බන්ධතාවක් තිබීම අවශ්‍ය වේ.

5.03 4වැනි ශ්‍රේණියේ භාෂා පරීක්ෂණයට අදළ අනු-පරීක්ෂණ විශ්ලේෂණයෙන්, විශිෂ්ට සාධන මට්ටම සහ අව-සාමාන්‍ය සාධන මට්ටම යන්නෙන් සිසුන් වැඩියෙන් ම අසමත් වී ඇති ක්ෂේත්‍ර පෙන්නුම් කෙරේ. (අංක 27-01,02 වගු බලන්න) අක්ෂර වින්‍යාසය සහ නිර්මාණාත්මක ව ලිවීම ඒ අයගේ ප්‍රකට ව පෙනෙන දුෂ්කර ක්ෂේත්‍ර දෙකයි. අක්ෂර වින්‍යාසය හැකියාව දුර්වලවීම නිසා ළමයින්ට කියවීම පහසුවෙන් කිරීම දුෂ්කර වේ. එවිට කියවීමේ දී අදහස් උකහා ගැනීම අපහසු වේ. (ප්‍රශ්න අංක 3) නියැදියට අයත් සිසුන්ගෙන් 50% - 70% ක් අක්ෂර වින්‍යාස හැකියාවෙන් අසමත් වී ඇත. එසේ ම නිර්මාණාත්මක ලිවීමේ හැකියාව ද දුර්වල ය. ප්‍රශ්න අංක 7න් 50%- 77%ක් අසමත් වීමෙන් එය පැහැදිලි වේ.

**27- 01 වගුව**
**විශිෂ්ට සාධනය ලැබූ සංඛ්‍යාව**

| ප්‍රශ්නාංක | 1 | | 2 | | 3 | | 4 | | 5 | | 6 | | 7 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් වර්ග | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | | විශිෂ්ට සාධනය | |
| | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| 1 | 14 | 8.75 | 26 | 16.25 | 3 | 1.8 | 43 | 27 | 36 | 22.5 | 26 | 16.25 | 21 | 13 |
| 2 | 28 | 17.5 | 35 | 22 | 6 | 3.8 | 60 | 37.5 | 44 | 27.5 | 46 | 28.8 | 13 | 8 |
| 3 | 56 | 35 | 53 | 33 | 4 | 2.2 | 97 | 60.6 | 78 | 48.8 | 77 | 48 | 13 | 8 |

**27- 02 වගුව**
**අව - සාමාන්‍ය සාධනය ලැබූ සංඛ්‍යාව**

| ප්‍රශ්නාංක | 1 | | 2 | | 3 | | 4 | | 5 | | 6 | | 7 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් වර්ග | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | | අව-සාමාන්‍ය | |
| | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| 1 | 94 | 58.8 | 49 | 28 | 110 | 68.8 | 66 | 41.25 | 74 | 46.25 | 80 | 50 | 123 | 76.8 |
| 2 | 70 | 43.8 | 42 | 26 | 113 | 70.6 | 64 | 40 | 69 | 43 | 75 | 46.8 | 112 | 70 |
| 3 | 52 | 32.5 | 17 | 10.6 | 85 | 53 | 30 | 18.8 | 30 | 18.8 | 30 | 18.8 | 79 | 49.6 |

අව - සාමාන්‍ය මට්ටමක සම්පත් හා පහසුකම් ඇති 1 වර්ගයේ පාසල්වල සහ සාමාන්‍ය මට්ටමක සම්පත් හා පහසුකම් ඇති 2 වැනි වර්ගයේ පාසල්වල සිසුන්ගෙන් 40% - 70% දක්වා සංඛ්‍යාවක් සමස්ත පරීක්ෂණයේ ප්‍රශ්න 6 කින් ම අසමත් වී තිබේ. මෙය ඉතා කණගාටුදායක තත්ත්වයකි. කියවීමේ පුරුදු සහ විඥාපන කුසලතා සංවර්ධනය කිරීමට නම් මෙම තත්ත්වය මගහරවා ගත යුතු වේ.

සම්පත් ලැබීමේ විෂමතාව ළමයින්ගේ අධ්‍යාපන හැකියා තීරණය කෙරෙන අන්දම (අංක 27-01,වගුව) 3 වැනි වර්ගයට අයත් පාසල්වල සිසුන්ගේ ලකුණු ප්‍රමාණවලින් පෙන්නුම් කෙරේ. එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් 30%- 60% ප්‍රමාණයක් ප්‍රශ්න 5කට ම විශිෂ්ට සාධනයක් ලබා ඇති අතර 1 වැනි වර්ගයේ සහ 2 වැනි වර්ගයේ පාසල්වල විශිෂ්ට සාධන මට්ටමට ළඟා වී ඇත්තේ පිළිවෙළින් 1-27% සහ 4% - 37% දක්වා පමණි.

## 06 පරිච්ඡේදය

# ළමයින්ගේ කියවීමේ රුචිය

6.01 2 වැනි සහ 4 වැනි ශ්‍රේණි සඳහා වෙන් වෙන් වශයෙන් සකස් කරන ලද ආකල්ප ලේඛන සහ කියවීම පාදක කරගත් ළමා අභිරුචි පිළිබඳ ප්‍රශ්නාවලිය ද ගුරුවරුන් සඳහා සකස් කෙරුණු අභිරුචි ලේඛන තුළින් ලබාගත් තොරතුරු සහ තෝරාගත් පාසල්වල ප්‍රධානීන්ගෙන් එකතු කර ගනු ලැබූ තොරතුරු ද ආදියෙන් ළමයින් විසින් කියවීම කෙරෙහි දක්වන ගුණාත්මක අදහස්, කියවීම පිළිබඳ ඔවුන් සතු ලැදිකම්, ළමයින් කොතෙක් දුරට කියවීමේ පුරුද්දට ඇබ්බැහි වී ඇද්ද, ළමයින් ගේ ගෙදර සහ පාසලේ පසුබිම කියවීමේ පුරුදු සහ සන්නිවේදන කුසලතා ලබා ගැනීමට ඉවහල් වේ ද ආදී කරුණු අනාවරණය කෙරුණි.

ළමයාට තමා වාසය කරන අවට පරිසරය පිළිබඳ ව දැන ගැනීමට සහජ ආශාවක් තිබේ. ළමයා වැඩෙත් ම, සංවේදී සංජානනය තුළින් තම පරිසරය තේරුම් ගැනීමට වැඩි කුතුහලයක් දක්වයි. සිද්ධවුයේ කුමක් ද? සිද්ධ වන්නේ කුමක් ද? ආදිය දැනගැනීම ඔහුගේ අභිරුචියකි. ඒ අනුව ළමයා, කෙනෙකු විසින් කියවනු ලබන කතාවක් අසා සිටීමට කැමති වේ. ළමයින්ගේ ස්වයං වාර්තා අභිරුචි ලේඛනවලින් ඔවුන්ගේ සිතට සහජයෙන් කා වැදී ඇති මෙම කුතුහලය පෙන්නුම් කෙරේ. (උදාහරණ: අංක 28, 29 වගු - 2 වැනි ශ්‍රේණිය) "මගේ විවේක කාලය ගත කිරීමට මා කැමති" ආදී අභිරුචි ලේඛනයට සපයන ලද තොරතුරුවලින් පැහැදිලි වේ.

**28 වගුව**
**"මගේ විවේක වේලාව ගත කිරීමට මා කැමති"**
**අභිරුචි ලේඛන ප්‍රකාශන සංඛ්‍යාව සහ ප්‍රතිශතය**

| දිස්ත්‍රික්කය | සෙල්ලම් කිරීම | සයිකල් පැදීම | කියවීම |
|---|---|---|---|
| අනුරාධපුරය | 11 | 18 | 67 |
| කුරුණෑගල | 13 | 23 | 79 |
| මාතර | 11 | 16 | 90 |
| කොළඹ | 14 | 30 | 70 |
| එකතුව | 49 | 87 | 306 |
| % | 10 | 18 | 64 |

**29 වගුව**
**"මුදල් ඇතොත් මා මිලදී ගන්නේ"**
**අභිරුචි ලේඛන ප්‍රකාශන සංඛ්‍යාව සහ ප්‍රතිශතය**

| දිස්ත්‍රික්කය | ක්‍රීඩා භාණ්ඩ | කතාන්දර පොත් | පාට පැන්සල් |
|---|---|---|---|
| අනුරාධපුරය | 31 | 33 | 29 |
| කුරුණෑගල | 27 | 53 | 37 |
| මාතර | 29 | 53 | 34 |
| කොළඹ | 27 | 52 | 40 |
| එකතුව | 114 | 191 | 140 |
| % | 24 | 40 | 29 |

අංක 28 සහ 29 වගුවලින් 2 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ ලැදිකම් දෙකක් පෙන්නුම් කෙරේ. නියැදියෙන් 64%ක් විවේකයක් ලැබුණ විට කැමති පොතක් කියවීමට මිස, සෙල්ලම් කිරීමට හෝ බයිසිකල් පැදීමට නොවේ. මුදල් ඇතොත් 40% ක් මිළදී ගන්නේ කතන්දර පොතක් මිස සෙල්ලම් බඩු හෝ පාට පැන්සල් නොවේ. 4 වැනි ශ්‍රේණියේ සිසුන් ද මීට සමානුපාතික අදහස් දක්වන බව වගු අංක 30 සහ 31 වගුවලින් පෙන්නුම් කෙරේ.

**30 වගුව**
**"විවේකකාලය ගත කිරීමට මා කැමති" අභිරුචි ප්‍රකාශන ප්‍රතිශතය**

| දිස්ත්‍රික්කය | සෙල්ලම් කිරීම | පිහිනීම | සංගීත වාදනය | පුස්තකාලයට ගොස් කියවීම |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 16 | 11 | 43 | 32 |
| කුරුණෑගල | 11 | 12 | 16 | 69 |
| මාතර | 27 | 8 | 34 | 48 |
| කොළඹ | 18 | 16 | 12 | 73 |
| එකතුව | 72 | 47 | 105 | 221 |
| % | 15 | 9.8 | 21.8 | 46 |

**31 වගුව**
**"මුදල් ඇතොත් මා මිලදී ගන්නේ" අභිරුචි ප්‍රකාශන ප්‍රතිශතය**

| දිස්ත්‍රික්කය | පාට පැන්සල් | ළමා පත්‍රයක් | පිත්තක් සහ බෝලයක් | කතන්දර පොතක් |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 18 | 28 | 19 | 38 |
| කුරුණෑගල | 20 | 38 | 14 | 44 |
| මාතර | 14 | 37 | 16 | 50 |
| කොළඹ | 8 | 41 | 9 | 59 |
| එකතුව | 60 | 144 | 58 | 191 |
| % | 12.5 | 30 | 12 | 40 |

4 වැනි ශ්‍රේණියේ නියැදියට අයත් ශිෂ්‍යයන්ගෙන් 46%ක් විවේක වේලාවට පුස්තකාලයට ගොස් පොතක් කියවීමට, 40%ක් කතන්දර පොතක් මිල දී ගැනීමට සහ 30% ක් ළමා පත්‍රයක් මිල දී ගැනීමට ද කැමැත්ත පළ කර ඇත.

**32 වගුව**
**" පාසල ඇරී**
**ගෙදර ගියාට පසු"**
**අභිරුචි ප්‍රකාශන සහ ප්‍රතිශතය**
**2 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | නිද ගැනීම | පොතක් කියවීම | සෙල්ලම් කිරීම |
|---|---|---|---|
| අනුරාධපුරය | - | 90 | 10 |
| කුරුණෑගල | 3 | 97 | 12 |
| මාතර | 2 | 92 | 22 |
| කොළඹ | 3 | 95 | 17 |
| එකතුව | 8 | 374 | 61 |
| % | | 78 | 12.6 |

**33 වගුව**
**"මා කැමති පොත්වල"**
**අභිරුචි ප්‍රකාශන සහ ප්‍රතිශතය**
**2 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | පින්තූර බැලීම | කතාන්දර ඇසීම | පිටු පෙරළීම |
|---|---|---|---|
| අනුරාධපුරය | 31 | 61 | 11 |
| කුරුණෑගල | 52 | 60 | 13 |
| මාතර | 30 | 72 | 18 |
| කොළඹ | 30 | 68 | 19 |
| එකතුව | 143 | 261 | 61 |
| % | 29.8 | 78 | 12.6 |

2 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගෙන් 78%ක් පාසල ඇරී ගෙදර ගියාට පසු කැමති පොතක් කියවීමට මිස ක්‍රීඩා කිරීමට හෝ නිදගැනීමට නොවේ. එසේ ම ඒ අය වඩාත් කැමති පොත්වල පිටු පෙරළීමට හෝ පින්තූර බැලීමට නොවේ. ඇත්ත වශයෙන් ම වැඩිහිටියකු විසින් කතාවක් කියාදීම හෝ පොතකින් කතාවක් කියවන විට අසා සිටීමට ඒ අය වඩාත් ඇලුම් කරති. (අංක - 32, 33 වගු බලන්න)

ළමයින් තුළ පවත්නා කතාන්දර ඇසීමේ මෙම ඇල්ම, ළමයා තුළ කියවීමේ පුරුදු සංවර්ධනය කිරීම සඳහා බුද්ධිමත් ගුරු පිරිසට උපයෝගී කර ගත හැකිය.

34 වගුව
"මා කියවීමට කැමති කතාන්දර"
2 ශ්‍රේණිය.

| දිස්ත්‍රික්කය | අන්දරේ | ගමරාළ | ජනකතා | යුද්කතා |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 43 | 27 | 16 | 07 |
| කුරුණෑගල | 65 | 25 | 13 | 14 |
| මාතර | 47 | 40 | 20 | 10 |
| කොළඹ | 51 | 37 | 21 | 05 |
| එකතුව | 206 | 129 | 70 | 36 |
| % | 43 | 27 | 14.6 | 7.5 |

35 වගුව
"මා කියවීමට කැමති"
4 ශ්‍රේණිය.

| දිස්ත්‍රික්කය | සතුන් පිළිබඳ | වාහන පිළිබඳ | කුරුල්ලන් පිළිබඳ | වීරයන් පිළිබඳ |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 09 | 10 | 27 | 53 |
| කුරුණෑගල | 11 | 03 | 16 | 85 |
| මාතර | 11 | 10 | 27 | 65 |
| කොළඹ | 22 | 04 | 23 | 70 |
| එකතුව | 53 | 27 | 93 | 273 |
| % | 11 | 5.6 | 19 | 56.8 |

ළමයි සිනාසීමට, විනෝදවීමට, ප්‍රීතියෙන් සිටීමට කැමති වෙති. එවැනි දෑ අන්තර්ගත කතාන්දර ඇසීමට ප්‍රිය කරති. රසවිඳිමින් ප්‍රීතියට පත් වෙති. හාස්‍යජනක කතාන්දර ඇසීමට වඩාත් ආසා වෙති. උදා:- අන්දරේගෙ කතා - 43% (34 වගුව )

6.02 මේඊමත් සමග ළමයින් කියවීමට කැමති මාතෘකා, කියවීමේ අභිරුචි, ස්වාභාවික ලෙස වෙනස් වේ. 4 වැනි ශ්‍රේණියේ කියවීමේ ලැදිකම් දැක්වෙන අංක 35 වගුවෙන් එය පැහැදිලි ව පෙන්නුම් කෙරේ. භේදයකින් තොර ව ගැහැනු සහ පිරිමි ළමයි වීරයන් පිළිබඳ කතා ඇසීමට වැඩි කැමැත්තක් දක්වති. 56.8% (35 වගුව)

විශේෂයෙන් මුල් ළමා අවදියෙහිදී කියවීම පිළිබඳ අභිරුචියක් ඇති කිරීම කියවීමේ පුරුදු සංවර්ධනය කිරීමට පහසු කෙරේ. කතාන්දරයකට සවන්දීමෙහි දී හෝ වැඩිහිටියෙකු ළමයාට ඇසෙන සේ කතාවක් කියවන විට ළමයාට කියවීමේ යෙදීම සඳහා පෙළඹවීමක් ඇති වේ. වත්මන් ලෝකයෙහි ජීවත්වන ළමයාට මෙවැනි තෘප්තියක් ලබා ගත හැක්කේ ජනමාධ්‍ය තුළිනි. ළමයින්ට සුදුසු වැඩසටහන් රූපවාහිනියෙන් නරඹන විට, ගුවන් විදුලියෙන් අසනවිට, කියවීම පිළිබඳ දැනුවත් වීමක්, එසේම අවශ්‍යතාත් ළමයින් තුළ ඇති වේ. මෙම ක්‍රම කියවීමේ පුරුදු සංවර්ධනය කිරීම සඳහා ප්‍රයෝජනවත් කර ගත හැකිය.

ප්‍රාථමික පාසලේ ළමයින් වඩාත් කැමති රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන්වලට බව අංක 36-1,2 වගුවලින් (2 වැනි ශ්‍රේණිය ) සහ අංක 37-1,2 වගුවලින් (4 වැනි ශ්‍රේණිය) පෙන්නුම් කෙරේ. 2 වැනි ශ්‍රේණියේ සිසුන් වඩාත් ම කැමති රූපවාහිනී වැඩසටහන කාටුන් කතන්දර වේ. 54%ක් ඒ අය වඩාත් කැමති ගුවන් විදුලි වැඩසටහන "අම්බිලි මාමා" ය. 53%ක් ළමයින්ගේ මෙම අභිරුචි, කියවීම් පුරුදු සහ විඥාපන, සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීම සඳහා විවිධ අන්දමට පන්ති කාමරයෙහි යොදා ගත හැකිය.

## 36 වගුව
## 2 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගේ ජනමාධ්‍ය පිළිබඳ අභිරුචි

### 36- (1) වගුව
### රූපවාහිනිය

| දිස්ත්‍රික්කය | කාටූන් කතන්දර | ළමා නාට්‍ය | කතන්දර |
|---|---|---|---|
| අනුරාධපුරය | 59 | 05 | 38 |
| කුරුණෑගල | 78 | 12 | 25 |
| මාතර | 54 | 06 | 60 |
| කොළඹ | 68 | 03 | 41 |
| එකතුව | 259 | 26 | 164 |
| % | 53.9 | 5 | 33.9 |

### 36- (2) වගුව
### ගුවන් විදුලිය

| දිස්ත්‍රික්කය | අම්බිලිමාමා | ළමා පිටිය | ළමා රඟ මඩල | ළමා ගායනා |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 45 | 19 | 18 | -21 |
| කුරුණෑගල | 70 | 12 | 14 | 21 |
| මාතර | 78 | 19 | 03 | 15 |
| කොළඹ | 60 | 20 | 07 | 23 |
| එකතුව | 253 | 70 | 42 | 80 |
| % | 52.7 | 14.5 | 8.8 | 16.5 |

### 36- (3) වගුව
### ළමා පත්‍ර

| දිස්ත්‍රික්කය | බින්දු | මිහිර | රන්කැටි | ටිකිරි | ළමා පත්‍ර කියවන සම්පූර්ණ සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 54 | 4 | 11 | 11 | 80 | 66.6 |
| කුරුණෑගල | 87 | 9 | 9 | 9 | 114 | 95 |
| මාතර | 78 | 7 | 15 | 10 | 110 | 91.6 |
| කොළඹ | 86 | 15 | 8 | 7 | 116 | 96.6 |
| එකතුව | 305 | 35 | 43 | 37 | 420 | 87.5 |

සමස්ත නියැදියට අයත් 4 වැනි ශ්‍රේණියේ සිසුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ළමා පත්‍ර කියවන බව 37- 01,02 වගුවලින් පෙන්නුම් කෙරේ. "බින්දු" ඒ අයගේ ප්‍රියතම පත්‍රය බව 2 වැනි ශ්‍රේණියේ 63.5%ක් ද, 4 වැනි ශ්‍රේණියේ 34.5%ක් ද එයට ඇලුම් කිරීමෙන් පැහැදිලි වේ. ඈත ගම්බද පළාත්වල පත්‍ර මිල දී ගැනීමට නොහැකි සිසුන් පවා ළමාපත්‍ර කියවන බවට තොරතුරු ලැබුණි. මෙය යහපත් ගුරුවරුන් විසින් දියුණු කරන ලද හොඳ පුරුද්දක ප්‍රතිඵලයකි. මුදල් වියදම් කළ හැකි දෙමව්පියන් පත්‍ර මිලදී ගත් විට ඒවා පන්තියේ සියලුදෙනා ම බෙදගෙන කියවීමට ඉඩ සැලසීම නිසා ළමා පත්‍ර කියවීමේ අවස්ථාව පන්තියේ කාටත් උදා වී තිබේ. මෙම ඉහළ මට්ටමේ ප්‍රතිශතය, ළමයින්ට කියවීම සඳහා පොතපත ලබා දෙන්නේ නම් ඒ අය කියවීම සඳහා පෙළඹෙන බව අපට ව්‍යංගයෙන් කියාපායි. එය ඒකාන්තයෙන් ම ප්‍රාථමික සිසුන්ගේ කියවීමේ පුරුදු සහ විඥාපන සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීමේ මගකි. ළමයින් රූපවාහිනිය නරඹනවිට, ගුවන්විදුලියට සවන් දෙන විට ඔවුන් තුළ කියවීම පිළිබඳ දැනුවත්වීමක්, කියවීම කෙරෙහි අවශ්‍යතාවක් ජනිත වේ. ළමයින් රූපවාහිනිය නැරඹීමට ඇබ්බැහිවීම නිසා රූපවාහිනී මාධ්‍යය ළමයින්ගේ කියවීමේ පුරුදු සංවර්ධනය කිරීමට තර්ජනයක් ලෙස සමහරු අදහස් කරති. බුද්ධිමත් ලෙස ළමයා රූපවාහිනිය නරඹන කාලය පාලනය කිරීම දෙමව්පියන් සතු වගකීමකි. කෙසේ වුවත් ළමයින්ට තොරතුරු සහ විනෝදය ලබාදෙන මූලාශ්‍ර හැටියට ජනමාධ්‍යවල වැදගත්කම අප විසින් සැලකිල්ලට ගත යුතු වේ.

**37- (01), (02), වගුව**
**ජනමාධ්‍ය පිළිබඳ අභිරුචි - 4 වැනි ශ්‍රේණිය**

**37- 01 වගුව**
**රූපවාහිනිය**

| දිස්ත්‍රික්කය | කාටුන් කතන්දර | රූපවාහිනී නාට්‍ය | කතන්දර | හින්දි චිත්‍රපටි |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 56 | 12 | 17 | 19 |
| කුරුණෑගල | 64 | 24 | 18 | 12 |
| මාතර | 55 | 22 | 18 | 24 |
| කොළඹ | 80 | 11 | 22 | 05 |
| එකතුව | 255 | 69 | 75 | 60 |
| % | 53 | 14 | 15.6 | 12.5 |

**37- 02 වගුව**
**ගුවන් විදුලිය**

| දිස්ත්‍රික්කය | සින්දු | කතන්දර | නාට්‍යරූපී ක්‍රීඩා |
|---|---|---|---|
| අනුරාධපුරය | 43 | 44 | 11 |
| කුරුණෑගල | 39 | 49 | 19 |
| මාතර | 40 | 56 | 17 |
| කොළඹ | 45 | 56 | 11 |
| එකතුව | 167 | 205 | 58 |
| % | 34.7 | 42.7 | 12 |

**38 වගුව**
**ළමා පත්‍ර - 4 වැනි ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | මිහිර | බින්දු | ටිකිරි | විද්‍යා | පත්‍ර කියවන සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 34 | 32 | 19 | 15 | 100 | 83 |
| කුරුණෑගල | 36 | 41 | 07 | 26 | 110 | 91.6 |
| මාතර | 32 | 48 | 10 | 19 | 109 | 90.8 |
| කොළඹ | 38 | 45 | 07 | 28 | 118 | 98 |
| එකතුව | 140 | 166 | 43 | 88 | 437 | 91 |
| % | 29 | 34.5 | 8.9 | 18 | | |

ස්වයං චාර්තා අභිරුචි ලේඛනයට අනුව ගැහැනු - පිරිමි භේදයකින් තොර ව නියැදියට අයත් සිසුන් සියලු දෙනා ම පාහේ පාසල් විෂයයන් අතරෙන් සිංහල භාෂාව ඉගෙනීමට නොව ගණිතය ඉගෙන ගැනීමට වැඩි කැමැත්තක් දක්වති. (අංක 39 වගුව බලන්න) ගණිතය විෂය ඉගෙනීමට 46%ක් කැමති වන අතර සිංහල භාෂාව ඉගෙනීමට කැමැත්ත දක්වා ඇත්තේ 12.7 කි.

**39 වගුව**
**මගේ ප්‍රියතම පාසල් විෂය - 4 ශ්‍රේණිය**

| දිස්ත්‍රික්කය | චිත්‍ර කර්මය | | | ගණිතය | | | සිංහල භාෂාව | | | සංගීතය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව | ගැ. | පි. | එකතුව |
| අනුරාධපුර | 5 | 12 | 17 | 26 | 23 | 49 | 07 | 14 | 21 | 18 | 04 | 22 |
| කුරුණෑගල | 13 | 13 | 26 | 22 | 32 | 54 | 11 | 01 | 12 | 12 | 05 | 17 |
| මාතර | 11 | 16 | 27 | 25 | 28 | 53 | 13 | 05 | 18 | 08 | 09 | 17 |
| කොළඹ | 12 | 17 | 29 | 31 | 34 | 65 | 06 | 04 | 10 | 12 | 04 | 16 |
| එකතුව | 41 | 58 | 99 | 104 | 117 | 221 | 37 | 24 | 61 | 50 | 22 | 72 |
| % | 20.6 | | | 46 | | | 12.7 | | | 15 | | |

වයස අවුරුදු 10ක් පමණ වූ 4 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයා අකමැති ම විෂය ලෙස දක්වන්නේ සිංහල භාෂාවයි. මෙම අවදිය වන විට ළමයා තව ම චතුර්විධ භාෂා කුසලතා සම්පූර්ණයෙන් අත්පත් කරගෙන නැත.

සිංහල භාෂාව පිළිබඳ අවම සාධනයක් ලැබීමට හේතු පිළිබඳ ඉඟියක් මෙයින් අපට ලැබේ. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 1,2 සහ 3 යන පාසල් වර්ගවල, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි 1සහ 2 යන පාසල් වර්ගවල සහ මාතර දිස්ත්‍රික්කයෙහි 1 සහ 2 යන පාසල් වර්ගවල සිසුන්ගේ සිංහල භාෂා විෂය පිළිබඳ සාධනයෙහි සාමාන්‍යය 35% කි. (අංක 06 වගුව බලන්න.) මෙය සිසුන්ගේ වරදක් හෝ අඩුපාඩුවක් පමණක් හැටියට සැලකීමට නුපුලුවන. ඉහත සඳහන් අභිරුචි ලේඛන තොරතුරුවලින් අපට පෙනෙන්නේ ළමයි බුද්ධිමත් ය. ඔවුහු යම් යම් දෑ ගවේෂණයට, ඉගෙනීමට, එයින් තෘප්තියක් ලබා ගැනීමට කැමති වෙති. එම නිසා ළමයාට රසවත්වන ලෙස, රුචියක් ඇතිවන ලෙස ඉගැන්විය යුතු ය. උගෙනීමට පෙළඹවිය යුතු ය. සුදුසු මාර්ගෝපදේශය ලබා දිය යුතු ය.

# 07 පරිච්ඡේදය

## නිවසේ පසුබිම

7.01 පවුලක සාමාජික සංඛ්‍යාව වැඩි වනවිට සමාන ආදායමක් ලබන කුඩා පවුලක ළමයින්ට ලැබෙන අවශ්‍යතා සම්පූර්ණවීමේ තෘප්තිය විශාල පවුල්වල ළමයින් නො ලබන බව මෙහිලා උපකල්පනය කෙරේ. මේ අදහසට අනුව, පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව ප්‍රශ්නාවලිය කොටස් දෙකකට වෙන් කරන ලදී. 1 වැනි ගණයට, 1-5 දක්වා සාමාජිකයන් සිටින පවුල් ද, 2 වැනි ගණයට 6-10 දක්වා සාමාජිකයන් සිටින පවුල් ද වෙන් කෙරුණි. අංක 40 වගුවෙන් මේ දෙවර්ගයට ඇතුළත්වන පවුල් (ගෙවල්) සංඛ්‍යාව සහ ඒවායේ ප්‍රතිශතය දැක්වේ.

**40 වගුව**
**පවුලේ සාමාජික සංඛ්‍යාව - 2 වැනි ශ්‍රේණිය**

| | 1 ගණය - 1-5සාමාජිකයන් | | | | 2 ගණය - 6-10 සාමාජිකයන් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ගැ. | පි. | එකතුව | % | ගැ. | පි. | එකතුව | % |
| අනුරාධපුරය | 28 | 22 | 50 | 41.6 | 25 | 19 | 44 | 36.6 |
| කුරුණෑගල | 42 | 33 | 75 | 62.5 | 17 | 25 | 42 | 35 |
| මාතර | 35 | 40 | 75 | 62.5 | 26 | 19 | 45 | 37.5 |
| කොළඹ | 47 | 38 | 85 | 70.8 | 07 | 15 | 22 | 18 |

අඩු සාමාජික පිරිසක් ඇති පවුල්වල ප්‍රතිශතය කොළඹ දිස්ත්‍රික්කයෙහි (1 ගණය) වැඩිවන අතර, උදා:- 70.8% , අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි එම ප්‍රතිශතය පහළ මට්ටමක පවතී. උදා: 41.6% කි. (40 වගුව ) එයට ප්‍රතිවිරුද්ධ ව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2 වැනි ගණයේ (6-10) පවුලේ ප්‍රතිශතය වැඩිවන අතර උදා: 36.6%, කොළඹ දිස්ත්‍රික්කයේ එම ප්‍රතිශතය පහළ මට්ටමක පවතී. උදා -18%යි. මෙම සාධකය ළමයින්ගේ සාධන සාඵල්‍යය කෙරෙහි බලපෑමක් ඇති කර ඇති බව විශිෂ්ට සාධන මට්ටම දැක්වෙන වගුවලින් සනාථ වේ. ( 06, 18 - 01,02 වගු)

7.02 ළමයින්ගේ කියවීමේ පුරුදු, සන්නිවේදන සහ විඥාපන කුසලතා සංවර්ධනය සඳහා ළමාපොත් සහ පත්‍ර, පින්තූර පොත්, සඟරා ආදී කියවීමට අවශ්‍ය දෑ ළමයාට සපයා දීමෙන් දෙමව්පියන්ගෙන් ලැබෙන පිටුබලය අතිශය ඵලදායී වේ. මෙය දෙමාපියන් ගේ සමාජීය, ආර්ථික තත්ත්වය විසින් නියම කෙරේ. 2 වැනි සහ 4 වැනි ශ්‍රේණිවල ළමයින් සතු අතිරේක කියවීම් පොත් ප්‍රමාණය දැක්වෙන 41 වැනි වගුව මෙම සාධකය පැහැදිලි ව කියා පායි.

41 වගුව
**ළමයින් සතු අතිරේක කියවීම් පොත් ප්‍රමාණය**

| | 2 වැනි ශ්‍රේණිය | | | | 4 වැනි ශ්‍රේණිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පොත් 1-5 | | 6-10 | | පොත් 1-3 | | 4-5 | | 6-10 | | 10 ට වැඩි | |
| දිස්ත්‍රික්කය | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % | එකතුව | % |
| අනුරාධපුරය | 75 | 62.5 | 24 | 20 | 60 | 50 | 28 | 23 | - | - | 14 | 11.6 |
| කුරුණෑගල | 69 | 57.5 | 46 | 42 | 38 | 31.6 | 25 | 20.8 | 14 | 11.6 | 44 | 36.6 |
| මාතර | 77 | 64 | 37 | 31 | 53 | 44 | 32 | 26.6 | 1 | - | 29 | 24 |
| කොළඹ | 56 | 47 | 47 | 39 | 20 | 16.6 | 33 | 27.5 | - | - | 65 | 54 |

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි නියැදියට අයත් පාසල්වල 2 වැනි ශ්‍රේණියේ අතිරේක කියවීම් පොත් පහකට වඩා සතු ළමයින්ගේ ප්‍රතිශතය 20%ක් වේ. කුරුණෑගල 42% කි. කොළඹ 39%කි. (41 වගුව බලන්න) 4 වැනි ශ්‍රේණියට අයත් වගුවෙන් එය තව දුරටත් සනාථ කෙරේ. 4 වැනි ශ්‍රේණියේ අතිරේක කියවීම් පොත් 10කට වැඩි ප්‍රමාණයක් සතු අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ළමයින්ගේ ප්‍රතිශතය 11.6% ක් වන අතර කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ඒ ප්‍රතිශතය 36.6% කි. කොළඹ දිස්ත්‍රික්කයෙහි 54.4% කි.

42 වගුව
**පුවත්පත් මිලදී ගන්නා ගෙවල් සංඛ්‍යාව සහ එහි ප්‍රතිශතය**
**4 වැනි ශ්‍රේණිය.**

| දිස්ත්‍රික්කය | දිනපතා | ඉරිදට | සමහරවිට | කවදාවත් නෑ |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 17 | 34 | 32 | 24 |
| කුරුණෑගල | 22 | 39 | 37 | 15 |
| මාතර | 15 | 47 | 41 | 13 |
| කොළඹ | 26 | 48 | 33 | 09 |
| එකතුව | 80 | 168 | 143 | 61 |
| % | 16.6 | 3.5 | 29.7 | 12.7 |

සමස්ත නියැදියට අයත්වන සිසුන්ගේ දෙමව්පියන්ගෙන් 12.7% ක් කිසිදිනක ප්‍රවෘත්ති පත්‍ර මිළදී නො ගන්නා බව 42 වගුවෙන් පෙන්නුම් කෙරේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 20%ක් ද, කොළඹ දිස්ත්‍රික්කයේ 7.5%ක් ද ගෙවල්වලට පුවත්පත් මිලදී නො ගැනේ. එසේ වුව ද, නියැදියෙන් 35%ක් ගෙවල්වලට ඉරිද ප්‍රවෘත්ති පත්‍රය ගනු ලැබේ. තොරතුරු ලබා ගැනීම සහ විනෝදය සඳහා රූපවාහිනිය, ගුවන්විදුලිය වැනි අනෙකුත් මාධ්‍ය සොයා යෑම මීට හේතු විය හැකි ය. කියවීමේ පුරුද්ද සංවර්ධනය කිරීම සඳහා ළමයා පෙළඹවීමට ඇති හොඳ අවකාශයක් මේ නිසා මග හැරී යයි.

දිනපතා පුවත්පත් මිල දී ගන්නා ප්‍රතිශතය ද ඉතාම අල්ප බව පෙනේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි පවා නියැදියට අයත් දෙමාපියන්ගෙන් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක් මිල දී ගන්නේ 26%ක් පමණි. මුදල් හිඟකම, කාලය මිඩංගු කිරීමට නො හැකිවීම මීට හේතු කාරක විය හැකි ය. කරුණු කෙසේ වුවත්, තම දරුවන්ට දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක් ලබාදීමට දෙමව්පියන්ට හැකිනම්, එය කියවීමේ නියැලීම සඳහා ළමයාට පෙළඹවීමක් ඇති කරයි.

## 7.03 පාසල් පසුබිම

කියවීමේ පුරුදු, සන්නිවේදන සහ විඥපන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පාසල් පසුබිම කොතෙක් දුරට හිතකර වේ ද යන්න සොයා බැලීම සඳහා පාසල් ප්‍රධානීන් සහ ගුරුවරුන් වෙනුවෙන් ප්‍රශ්නාවලියක් සකස් කෙරුණි. අංක 1-10 දක්වා පිලිතුරුවලින් පාසලට අදළ සාමාන්‍ය තොරතුරු ලබාගැනීම සඳහා ද, 11-16 දක්වා වූ පිලිතුරුවලින් පර්යේෂණ මාතෘකාවට අදළ පරමාර්ථ ඉටුකර ගැනීමට පාසල කොතෙක් දුරට පිටුබලයක් වේ ද යන්න පිළිබඳ ව තොරතුරු ලබාගැනීම සඳහා ද වෙන් කෙරුණි.

පාසලේ ඉගෙනීම ලබන ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් වන ලෙස ඉදි කරන ලද පන්තිකාමර සහිත පාසල් ගොඩනැගිලි, ළමයින්ට වාඩිවීමට අවශ්‍ය ඉඩ පහසුකම් සහ වුවමනා ලී බඩු ආදිය, විශේෂයෙන් ඉගැන්වීම් - ඉගෙනුම් අවස්ථාවක් කෙරෙහි මූලික වශයෙන් බලපෑම් ඇති කෙරේ. පාසල් ප්‍රධානීන්ගෙන් ලබා ගන්නා ලද තොරතුරුවලින් අනාවරණය වූයේ නියැදියට අයත් පාසල් 13න් 4 කට පමණක් එම අවම අවශ්‍යතා සතුව පවතින බව යි. සමහර නාගරික, ජනප්‍රිය පාසල්වල පවා ළමයින් 40කට සෑහෙන ඉඩ ප්‍රමාණය ඇති පන්ති කාමරයක් තුළ 50කටත් අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින බව දක්නා ලදී. මෙම තත්ත්වය අහිතකර ප්‍රතිඵල ගෙන දෙයි. ගුරුවරයාට හෝ ශිෂ්‍යයාට නිදහසේ පන්ති කාමරයෙහි එහා මෙහා ගොස් ඉගැන්වීම හෝ ඉගෙනීම සඳහා අවශ්‍ය පුද්ගලික අවධානය ළඟා කරදීමට හෝ ළඟා කර ගැනීමට නො හැකිවේ. ඒ නිසා ම ඉගෙනීම - ඉගැන්වීම විධිමත් ක්‍රියාවලියක් බවට පත් ව තිබේ.

මෙම තත්ත්වය මීට වඩා උග්‍ර ලෙස බලපාන පාසල් ද ඇත. සමහර පාසල්වල ප්‍රාථමික පන්ති බෙද වෙන් නො කරන ලද විවෘත ශාලාවල පැවැත්වේ. එම පාසල්වල ඉගැන්වීම මෙන් ම ඉගෙනීම ද කළ යුත්තේ ඉතා ආයාසයෙනි. මේ නිසා ම සමහර ගුරුවරුන්ට පාසල් වත්තේ ගස් යටට පන්ති ගෙන යාමට - ආපසු ගෙන ඒමට නියමිත කාල පරිච්ඡේදයෙන් හරි අඩකට වඩා වැය කිරීමට සිදුවේ.

නියැදියට අයත් පාසල් 13න් ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලබා දෙන්නේ පාසල් 5ක පමණි. (අංක 01වගුව) 11 වැනි හෝ 13 වැනි ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල්වල, ප්‍රාථමික අංශයේ සම්පූර්ණ කළමනාකරණය, අත්දැකීම් බහුල, පුහුණු උප ප්‍රධානියෙකු භාරයේ පවතී. අනිකුත් පාසල් අටේ ප්‍රධානීන්ගෙන් තිදෙනෙකු පුහුණු ගුරුවරුන් වන අතර 5 දෙනෙකු අධ්‍යාපන ඩිප්ලෝමා සහතික ලත් උපාධිධරයෝ වෙති. පාසල් ප්‍රධානියාගේ අධ්‍යාපන සහ වෘත්තීය තත්ත්වය, ස්වභාෂාව වර්ධනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය, වෘත්තියට ඇප කැප වීම, කියවීම සඳහා පුස්තකාල පහසුකම් සැලසීම සහ පොත පත ලබා දීම සඳහා ලැබෙන සහාය සහ කියවීමේ පුරුදු වර්ධනය සඳහා දක්වන උනන්දුව ආදී කරුණු මෙහිලා වැදගත් කොට සැලකිය හැකි වේ.

පාසලක මානව සහ භෞතික සම්පත් අවම මට්ටමක පවතින විට ළමයින් තුළ කියවීමේ පුරුදු සහ කුසලතා, සන්නිවේදන සහ විඥපන කුසලතා, ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ ගුරුවරයා ය. එවැනි පාසල්වල ඉගෙනීම සඳහා මූලාශ්‍ර සපයන එක ම සම්පත ගුරුවරයා ය. ප්‍රශ්නාවලියට පිළිතුරු සපයන ලද ගුරුවරුන් 24 දෙනා අතුරින් 21 දෙනෙකු ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ පුහුණුවක් ලැබූ අයයි. අනික් තිදෙනා පුහුණු උපාධිධාරීන් ය. කරුණු මෙසේ වුව ද පාසල් ප්‍රධානීන් සපයන ලද පිළිතුරුවලට අනුව නුපුහුණු ගුරු පිරිසක් ද සිටින බව අනාවරණය වුණි. අංක 43 වගුවට අනුව නියැදියට අයත් පාසල්වල අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ගුරුවරුන් 12ක්, කුරුණෑගල 10ක් , මාතර 4ක් සහ කොළඹ දිස්ත්‍රික්කයෙහි 2ක් ගුරු පුහුණුව ලබා නොමැත. ගුරුවරුන් වෘත්තියමය පුහුණුවක් නො ලැබීම නිසැකයෙන් ම ප්‍රාථමික අවදියේ අධ්‍යාපන තත්ත්වය පසුබෑමට හේතු කාරකයක් වේ.

එම පාසල් 13න් ප්‍රාථමික අවදියේ ළමයින්ගේ කියවීමේ අවශ්‍යතා සපුරාලන පුස්තකාල පාසල් 7කටම නොමැති බව අංක 43 වගුවෙන් හෙළි වේ. පුස්තකාල සතු පාසල් 6න් 4කම ඇත්තේ පොත් 100-500 දක්වා වූ ප්‍රමාණයකි. එයින් පුස්තකාල 3කම ඇත්තේ පොත් 1000ට අඩු ප්‍රමාණයකි. එහෙත් කොළඹ ජාතික පාසල් පුස්තකාල දෙක සතු පොත් සංඛ්‍යාව 3000 හෝ ඊට වැඩි වේ. කොළඹින් දුර බැහැර පාසල් දෙකකට පොත් ප්‍රමාණයක් පරිත්‍යාගයක් ලෙස ලැබී ඇතත්, ඒවා පිළිවෙළකට අසුරා තැන්පත් කිරීමට තබා ආරක්ෂා සහිත ව තබාගැනීමටවත් පහසුකම් නැති බව සඳහන් කර ඇත. අවම මට්ටමේ සහ සුපිරි මට්ටමේ පාසල් සතු සම්පත්වල විෂමතාව මෙයින් පැහැදිලි ව පෙනේ. මීට පෙර සඳහන් කළ පරිදි ගෙදර සහ පාසලේ සමාජ ආර්ථික තත්ත්වය ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කරන බව මෙයින් තවදුරටත් තහවුරු වේ. (අංක 06 වගුව) පාසල් 13න් 8කට ම එකම ප්‍රවෘත්ති පත්‍රයක්වත් මිල දී නො ගැනේ.

## 7.04.01 කියවීමේ ප්‍රවර්ධනය පිළිබඳ ගුරුවරුන්ගේ අදහස්

නියැදියට අයත් පාසල්වල ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන ලද පිලිතුරුවලට අනුව ළමයි බහුතරයක්, ඇත්ත වශයෙන් ම පොත් පත් කියවීමට ඇලුම් කරති. ගුරුවරු දුෂ්කර අවස්ථා මධ්‍යයෙහි වුව ද පන්තිවල පුස්තකාල පවත්වාගෙන යමින් ළමයින්ගේ කියවීමේ ප්‍රවර්ධනය සඳහා දිරි ගනිති. මේ අනුව වසර ආරම්භයෙහි දී සෑම ළමයකු ම එක් අතිරේක කියවීම් පොතක් පන්තියට ගෙන එනු ලැබේ. සමහර විට ගුරුවරු ළමයින්ට සුදුසු පොත් ලැයිස්තුවක් සපයා දෙති. ළමා පත්‍ර මිල දී ගැනීමට හැකි අය ඒවා ද සතිපතා පන්තියට ගෙන එනු ලැබේ. මෙම පොත් සහ පත්‍ර ළමයින් අතර හුවමාරු කෙරේ. මෙසේ ළමයින් තුළ කියවීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම සඳහා ගුරුවරු උනන්දු වෙති. මෙවැනි පොත්පත් හුවමාරුවක් අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ඇති බව දැනගන්නට ලැබුණි. ඒ අතර සමහර පාසල්වල ප්‍රාථමික ගුරුවරු ද්විතියික පාසලේ පුස්තකාලයෙන් පොත් 30-40ක් ගෙනැවිත් ඒවා මසකට වරක් ළමයින් අතර බෙද දෙති. දුර බැහැර ප්‍රාථමික පාසල්වල තත්ත්වය මෙසේ වුව ද කොළඹ පාසල්වල ප්‍රධාන පුස්තකාල සහ පන්ති පුස්තකාල යන දෙවර්ගය ම මනාව ක්‍රියාත්මක වනු දක්නා ලදී.

## 7.04 .02

කියවීමට සුදුසු පොත් පත් ඌනතාවට අතිරේකව පාසල් වර්ග 1 සහ 2හි ශිෂ්‍යයන්ට ගෙදර සමාජ - ආර්ථික දුෂ්කරතා, පවුල්වල සාමාජික සංඛ්‍යාව අධික වීම, දෙමාපියන් හරිහැටි අධ්‍යාපනයක් ලබා නො තිබීම කියවීමේ වැදගත්කම එම දෙමව්පියන්ට නො වැටහීම ආදී දුෂ්කරතා රාශියකට මුහුණදීමට ළමයින්ට සිදු වී ඇති බව ගුරුවරු අනාවරණය කළ හ. අවශ්‍ය පහසුකම් හා දෙමව්පිය උනන්දුව නො ලැබීම නිසා ළමයින්ට පන්තියට අදළ භාෂා කුසලතා මට්ටමට ළගාවීමට අපොහොසත් බව සමහර ගුරුවරුන් ගේ අදහස විය.

7.04.-3 ගුරුවරුන් ඉදිරිපත් කරන ලද තවත් අදහසක් නම් ප්‍රාථමික විෂය නිර්දේශය අනවශ්‍ය ලෙස පුළුල් වී වසර තුළ ආවරණය කිරීමට නො හැකි තරම් විෂය කරුණු ඇතුළත් කර ඇති හෙයින් පුද්ගලික ව ළමයින්ගේ භාෂා කුසලතා සංවර්ධනයට අවධානය යොමු කිරීමට නො හැකි වී ඇත. විෂයමාලාවක අන්තර්ගතය ළමයින්ගේ පුද්ගලික අවශ්‍යතා ඉටු කෙරෙන පරිදි විවිධත්වයක් ඇති විය යුතු බව සත්‍යයකි. මෙහිලා වඩාත් වැදගත් වන්නේ එම විෂයමාලාව විස්තීර්ණ කිරීමේ කාර්යය ගුරුවරයාට ලබා දීමයි. එවිට ඒ ඒ ශිෂ්‍යයන්ට සුදුසු පරිදි භාෂා කුසලතා අරමුණු සාධනයට මග පෑදීමට ගුරුවරයාට අවස්ථාවක් ලැබේ.

7.04-4 සමහර ගුරුවරුන් ඉදිරිපත් කරන ලද තවත් අදහසක් නම් 2,4,5 ශ්‍රේණිවලට අදළ සිංහල පෙළ පොත්වල අන්තර්ගත කථාවලින් ළමයින්ගේ හැඟීම් සහ කුතුහලය අවදි නො වන නිසා ළමයින් ඒවා කියවීමට නො පෙළඹෙන බවය. එම කතන්තරවලින් ළමයින්ට සිතීමට අවස්ථා නිර්මාණය කර නැත. ඒ නිසා ළමයි එම පොත් යාන්ත්‍රික ව, කට පාඩමෙන් කියවනවා විනා, අකුරු, වචන හඳුනාගෙන, ඒවායේ අර්ථය අවබෝධ කරගෙන කියවීමේ නො යෙදෙන බව ඒ අයගේ අදහසයි. උදාහරණයක් වශයෙන් "අමරට තෑග්ගක්" යන පාඩම සඳහන් කර ඇත. එබැවින් විෂයමාලා සහ පෙළපොත් අන්තර්ගතය තේරීමෙහි දී සහ ඒවා අනුක්‍රමයෙන් පිළිවෙළ කිරීමෙහි දී මීට වඩා පරීක්ෂාකාරී විය යුතු යයි සිතේ.

## 43 වගුව
## කියවීමේ ප්‍රවර්ධනය සඳහා පාසල් සතු පහසුකම්

| දිස්ත්‍රික්කය | පාසල් වර්ග | ප්‍රාථමික පාසල් පුස්තකාල | පුස්තකාල භාර නිලධාරි | පොත් සංඛ්‍යාව | ළමා පත්‍ර | පොත් ඇසිරීමේ පහසුකම් | ප්‍රවෘත්ති පත්‍ර | රූපවාහිනී | ගුවන් විදුලි යන්ත්‍ර |
|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 1 | ✕ | ✕ | ✕ | ✕ | ✕ | ✕ | ✓ | ✓ |
| | 2 | ✓ | ✕ | 300 | ✕ | ✕ | ✕ | ✕ | ✕ |
| | 3 | ✕ | ✕ | ✕ | ✕ | ✕ | 2 | ✓ | ✓ |
| කුරුණෑගල | 1 | ✓ | ✕ | 1000 | ✓ | ✓ | 2 | 4 | 4 |
| | 2 | ✓ | ✓ | 1000 | ✕ | ✓ | 3 | 4 | 4 |
| | 3 | ✓ | ✕ | 1200 | ✓ | ✓ | 1 | ✕ | ✓ |
| මාතර | 1 | ✕ | ✕ | 350 | ✕ | ✕ | ✕ | ✕ | ✓ |
| | 2 | ✕ | ✕ | 250 | ✕ | ✕ | ✕ | ✕ | ✓ |
| | 3 | ✕ | ✕ | 500 | ✓ | ✕ | 2 | ✓ | ✓ |
| කොළඹ | 1 | ✕ | ✕ | 1200 | ✓ | ✕ | 1 | ✕ | ✓ |
| | 2 | ඉදිවෙමින් පවතී | ✕ | සංවිධානය කෙරෙමින් පවතී | 5 | | 3 | ✕ | ✕ |
| | 3- ගැ | ✓ | ✓ | 5000 | ✓ | ✓ | 3 | ✓ | ✓ |
| | 3- පි | ✓ | ✓ | 3000 | ✓ | ✓ | 3 | ✓ | ✓ |
| ✕ | නැත | 7 | 9 | 2 | 8 | 4 | 4 | 6 | 2 |
| ✓ | ඇත | 6 | 4 | - | 5 | - | 9 | 7 | 11 |

ජාතික පාසල් දෙකේ හැර අනිකුත් පාසල් පුස්තකාල භාර ව අදාළ පුහුණුවලත් පුස්තකාලයාධිපතීන් නොමැති බව පෙනේ. බොහෝ පාසල් පුස්තකාලවල ගුරුමඬුල්ලේ මහත්මියක් හෝ මහත්මයෙක් සේවය කරයි. සමහර පාසල්වල ගැහැනු ළමයෙකු සුළු දීමනාවක් ගෙවා පුස්තකාල සේවයෙහි යොදවා ඇත.

මේ අනුව බලන විට, කියවීමේ පුරුදු සහ විඥපන කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දෑ සපයා ගැනීමට නියැදියට අයත් පාසල් සංඛ්‍යාවෙන් 50%කට වඩා පාසල් පසුබිම සහ ශිෂ්‍යයන්ගේ ගෙදර පසුබිම අපොහොසත් බව පැහැදිලි ය.

**44 වගුව**

**ප්‍රාථමික පාසල් පුස්තකාල සහ පොත් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | පාසල් වර්ග | ප්‍රාථමික පාසල් පුස්තකාල | පුස්තකාල භාර නිලධාරීන් | පාසල් සතු පොත් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 200-500 | 500-1000 | 1000-2000 | 2000-5000 |
| අනුරාධපුරය | 1 | ✗ | ✗ | - | - | - | - |
| | 2 | ✓ | ✗ | ✓ | - | - | - |
| | 3 | ✗ | ✗ | - | - | - | - |
| කුරුණෑගල | 1 | ✓ | ✗ | - | ✓ | - | - |
| | 2 | ✓ | ✓ | - | ✓ | - | - |
| | 3 | ✓ | ✗ | - | ✓ | - | - |
| මාතර | 1 | ✗ | ✗ | - | - | - | - |
| | 2 | ✗ | ✗ | - | - | - | - |
| | 3 | ✗ | ✗ | - | - | - | - |
| කොළඹ | 1 | ✗ | ✗ | - | - | ✓ | - |
| | 2 | ✗ | ✗ | - | - | - | - |
| | 3- ගැ. | ✓ | ✓ | - | - | - | - |
| | 3- පි. | ✓ | ✓ | - | - | - | - |
| ✗ | නැත | 7 | 10 | - | - | - | - |
| ✓ | ඇත | 06 | 03 | 04 | - | 04 | 02 |

7.05 පර්යේෂණයෙන් ලබාගත් තොරතුරු සංක්ෂිප්තය

1 ළමයි පොත්, පින්තූර පොත්, සඟරා, ආදියට ඇලුම් කරති. තොරතුරු ලබා ගැනීමට, දැනුම සෙවීමට, සන්නිවේදනයට ඔවුන් තුළ සහජ ආශාවක් පවතී.

2. නියැදියට අයත් 2 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගෙන් 80%ක් සතුටුදායක ලෙස භාෂා කුසලතා අත්පත් කරගෙන ඇත.

3. I නියැදියට අයත් 4 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගෙන් 50% -67% අතර ශිෂ්‍ය සංඛ්‍යාවක් වර්ෂය අවසානයෙහි දී එම ශ්‍රේණියට අපේක්ෂිත භාෂා කුසලතා ලබා ගැනීමට අසමත් වී තිබේ.

II අනුරාධපුර දිස්ත්‍රික්කයේ 68%කට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 36%කට සෑහීමට පත් විය හැකි ප්‍රමාණයට නිවැරැදි ව තමාගේ ලිපිනය ලිවීමට අසමත් වී ඇත. එසේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ 43%කට තමාගේ පාසලේ නම ලිවීමට නො හැකි විය.

4. දිස්ත්‍රික්ක 4 අතර, පාසල් වර්ග 3 අතර සහ ගැහැනු -පිරිමි ළමයින් අතර භාෂා කුසලතා සාධනයෙහි පැහැදිලි විෂමතාවක් දක්නා ලදී.

5. එහෙත්, වඩාත් යහපත් අධ්‍යාපන සංවර්ධනයක් සඳහා තවමත් සියලුම පාසල්වලට සමාන ලෙස මානව සහ භෞතික සම්පත් සම්පාදනය නොවේ.

6. ඉගැන්වීමේ කාර්යයෙහි දී නව්‍යකරණ තාක්ෂණ ශිල්පී ක්‍රම භාවිත කිරීමේ හැකියාව හා අවශ්‍ය දැ ගුරුවරුන්ට සපයා දී නොමැත.

7. උපදේශක ගුරුවරුන් විසින් විධිමත් පදනමක් මත ගුරුවරුන් ගේ ඉගැන්වීම අධීක්ෂණය කිරීම සහ ගුරුවරුන්ට මාර්ගෝපදේශකත්වය ලබා දීම හරියාකාරව සිදු නොවේ.

8. ශිෂ්‍යයන්ගේ ඉගෙන ගැනීමේ දුෂ්කරතා අනාවරණය කරගෙන, ඒ අයට උදවු දීම සඳහා සාධනය තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ක්‍රම, විධිමත් ලෙස පවත්වා ගෙන යනු නො ලැබේ.

9. වර්තමානයෙහි වෙනස්වීමට භාජනවන සමාජයට උචිත අන්දමට විෂයමාලාව, ගුරු උපදේශනය, පෙළපොත් සහ ඉගැන්වීමේ ක්‍රම සකස්වීම සහ ඒවා සමානත්වයකින් බෙද හැරීම සිදු නොවේ.

10. නියැදියෙන් හරි අඩක පමණ ප්‍රාථමික පාසල්වල විධිමත් පුස්තකාල පහසුකම් දක්නට නො ලැබේ. ඒ ඒ ප්‍රාථමික ශ්‍රේණිවලට යෝග්‍ය පොත්පත්, පුස්තකාල කාර්යභාරය ඉටු කළ හැකි පුස්තකාලයාධිපතීන්, විවිධ වර්ගයේ පොත්, ප්‍රාථමික අවදියේ ශිෂ්‍යයාගේ විවිධ අවශ්‍යතා සහ අභිරුචි ඉටුකර ගැනීමට සුදුසු ගුණාත්මක පොත් විශාල ප්‍රමාණයක් සහ ඒවා ආරක්ෂා සහිතව අසුරා තැබීමට ඉඩ ප්‍රමාණයක් සහ පහසුකම් නොමැති වීම ආදී ඌනතා රාශියක් ඇත. ළමයින් තුළ කියවීමේ පුරුදු, විඥපන සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීමේ මං අහුරන මෙම බාධක මග හරවා ගැනීමට පියවර ගත යුතු වේ.

## 08 පරිච්ඡේදය

# දත්ත තොරතුරු ආශ්‍රිත සාකච්ඡාව

8 -01 ළමයින් කියවීමට ඇලුම් කරන බව ස්වයං අභිරුචි වාර්තාවලින් පැහැදිලි ව පෙන්නුම් කර ඇත. ඔවුහු පොත්, සඟරා, ළමා පත්‍ර ආදියට ආශා කරති. තොරතුරු සහ දැනුම ලබාගැනීමට ඔවුන්ට පිපාසයක් ඇත. කතන්දර ඇසීමට ඔවුහු සහජයෙන් ම ප්‍රිය වෙති. මෙම ළමයින් තුළට කා වැදී ඇති ආශාව, ඔවුන්ගේ කියවීම් පුරුදු , විනෝදාපන සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කර ගත හැකිය.

කියවීමේ පුරුදු සහ සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීමේ පදනමක් හැටියට සවන්දීම, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා පන්තිකාමරය තුළ දී දියුණු කළ යුතු වේ. කියවීම පුරුද්දක් හැටියට සංවර්ධනයවීමට නම්, ළමයාට ආයාසයෙන් තොර ව පහසුවෙන් කියවීමට හැකියාව ලබා දිය යුතු ය. මේ සඳහා වුවමනා කෙරෙන මූලික අවශ්‍යතාව අකුරු සහ වචන හඳුනා ගැනීමේ හැකියාව ලබා ගැනීම යි. ඉන්පසු අනුමාන වශයෙන් අදහස් දැනගැනීම සහ දැනුම හා සන්නිවේදන කුසලතා ලබාගැනීම සඳහා වචන - වගන්ති කියවීමට වුවමනා ම ය. මෙය සංකීර්ණ ක්‍රියාවලියකි. ඒ නිසා කියවීමේ කාර්යය සඳහා ස්ථිර පදනමක් ගොඩනගා ගැනීම වැදගත් ය. මෙය ගුරු - දෙගුරුන් ගේ සහ පාසලේ වගකීමයි. 2 වැනි සහ 4 වැනි ශ්‍රේණි සඳහා දිස්ත්‍රික්ක හතරකින් තෝරාගනු ලැබූ පාසල්වල පවත්වන ලද සාධන සහ ආකල්ප පරීක්ෂණ දෙකෙන් අනාවරණය වී ඇත්තේ මේ වැදගත් වගකීම දෙමව්පියන්, ගුරුවරුන් හෝ අනිකුත් අධ්‍යාපනය පිළිබඳ වගකියයුත්තන් විසින් පිළිගත හැකි අන්දමකට, බරපතල ලෙස සැලකිල්ලට භාජන කර නොමැති බවයි.

8.02 දිස්ත්‍රික්ක 4ට අයත් වර්ග තුනේ ම පාසල්වල 2 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගේ භාෂා කුසලතා සාධනයේ ලකුණුවල සාමාන්‍ය 80%ට වැඩි වූ නමුත් 4 වැනි ශ්‍රේණියේ සාධනය කිසිසේත් සතුටුදායක නොවේ. 50% සිට 67% දක්වා සිසුන් සංඛ්‍යාවක් අපේක්ෂිත මට්ටමට ළඟාවීමට නො හැකි ව අසමත් වී තිබේ. (08 වගුව ) අදාළ ගුරුවරුන් සහ පාසල්, දෙමව්පියන් යන හැමදෙනා ම තමන්ගේ යුතුකම් සෑහීමට පත්වීමට පුළුවන් ආකාරයට ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව ද මෙය කියා පායි. මෙම තත්ත්වයෙන් අනාවරණය වන තවත් කරුණක් ඇත. එනම්, ළමයා ඉගෙනීම ආරම්භ කළ හැටියේ ම, 1 ශ්‍රේණියෙහි දී දෙමාපියෝ ළමයින්ගේ අධ්‍යාපනය පිළිබඳ ව බෙහෙවින් උනන්දු වෙති. අවශ්‍ය සෑම දෙයක් ම සපයා දෙති. එහෙත් කාලයත් සමග ම එම උනන්දුව හීනවී යයි. දෙමවුපියන්ගේ මෙන් ම වැඩෙන දරුවාගේ ද අවධානය පවුලට අලුතින් එක්වන දරුවන් කෙරෙහි යොමු වේ. වයස අවුරුදු 9-10 දරුවන්ගේ අධ්‍යාපනය මෙයින් ක්‍රමයෙන් බොහෝ විට අතපසු වේ.

4 වැනි ශ්‍රේණියේ භාෂා පරීක්ෂණයෙන් ලබාගත් දත්තවලට අනුව දිස්ත්‍රික්ක, පාසල් වර්ග හා ගැහැනු - පිරිමි ළමයින් අතර ඔවුන් ලබා ඇති සාධනයෙහි වෙනසක් තිබේ. 3 වැනි වර්ගයේ පාසල්වලට උසස් ම සාමාන්‍ය ලකුණු මට්ටමක් හිමි වී ඇත. උද :- ගැහැනු ළමයින් 57%ක් පිරිමි ළමයින් 47%ක් ලබාගෙන ඇති අතර 2 වැනි වර්ගයේ පාසල්වලට දෙවැනි තැන ද, (ගැහැනු 43%- පිරිමි 33% ) අවම පහසුකම් හිමි 1 වැනි වර්ගයේ පාසල්වලට (ගැහැනු 38% - පිරිමි 26.4%) තුන්වැනි තැන ද හිමි වී ඇත.

කොළඹ දිස්ත්‍රික්කයෙහි වැඩි පහසුකම්, සම්පත් ඇති පාසල්වල ශිෂ්‍යයන් අනෙකුත් දිස්ත්‍රික්ක තුනේ ශිෂ්‍යයන්ට වඩා හොඳින් එම ශ්‍රේණියට අපේක්ෂිත භාෂා කුසලතා අත්පත් කරගෙන ඇති බව මෙයින් පැහැදිලි වේ. අවම ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ශිෂ්‍යයන් විසිනි. මේ බව විශිෂ්ට සාධන වගුවලින් ද මෙසේ ම පෙන්නුම් කෙරේ. සාධනයෙහි ඇති මෙම විවිධත්වය භාෂා විෂය පමණක් නොව අනිකුත් සෑම විෂයයක් ඉගෙනීමට අත්‍යවශ්‍ය පහසුකම් හා සම්පත් එක හා සමානව බෙදහැරීමක් සිදු නොවන බව අපට ඇඟිල්ල දිගුකර පෙන්වීමකි.

භාෂා කුසලතා සාධන පරීක්ෂණයෙන් පෙන්නුම් කර ඇති පරිදි 4 වැනි ශ්‍රේණියේ සිසුන්ට ප්‍රධාන දුෂ්කර ක්ෂේත්‍ර දෙකක් වී ඇත්තේ අක්ෂර වින්‍යාසය හැකියාව සහ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා යන ප්‍රශ්න බව වගු අංක 27න් පෙන්නුම් කෙරුණි. ඒ කෙරෙහි පාසල් වර්ගයෙහි බලපෑමක් සිදු වී නොමැත.

**45 වගුව**
**භාෂා සාධන ප්‍රශ්න පත්‍රයෙහි දුෂ්කර ක්ෂේත්‍ර සහ**
**අසමත් ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රතිශතය - 4 වැනි ශ්‍රේණිය**

| අංකය | සාධන පරීක්ෂණය | පාසල් වර්ගය 1 | පාසල් වර්ගය 2 | පාසල් වර්ගය 3 |
|---|---|---|---|---|
| 3 | අක්ෂර වින්‍යාසය | 69% | 71% | 53% |
| 7 | නිර්මාණාත්මක ලිවීමේ කුසලතා | 77% | 70% | 50% |

අවුරුදු 4ක් පාසලෙහි අධ්‍යාපන ලැබුවාට පසු නියැදියෙන් හරි අඩකටත් වඩා, එනම් 50% - 70% අතර සිසුන් සංඛ්‍යාවක් ඉහත සඳහන් කුසලතා දෙකෙන් 4 වැනි ශ්‍රේණියට අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වීමට අසමත් වී තිබේ. මෙම උග්‍ර අවස්ථාව ඇති වීමට තුඩු දුන් හේතු පසු පස තවත් කරුණු ඇති බවට මෙයින් ඉඟියක් ලැබේ. මෙම සන්දර්භය යටතේ ළමයින්ගේ ඉගෙනීමේ සාර්ථකත්වය සඳහා ගෙදරින් සහ පාසලෙන් ලැබෙන පිටුබලය මූලික වැදගත් සාධකයක් හැටියට සැලකේ. එසේ ම, කාර්යක්ෂම ඉගැන්වීම් ක්‍රම, සාර්ථක ඉගෙනුම සඳහා ද සාධන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ද අවශ්‍ය වේ. එහෙයින් ගුරුවරුන් උපයෝගී කර ගන්නා ඉගැන්වීම් ක්‍රමවේදය ඉතා වැදගත් වේ. අවම පහසුකම් ඇති ළමයින්ට භාෂා සංවර්ධනය සඳහා ගෙදරින් ලැබෙන සහාය ඉතා ම අල්ප බව හෙළිදරවු විය. (අංක 41- 1,2 වගු) මෙවැනි තත්ත්වයක් පවත්නා අවස්ථාවල දී සෑම අතින් ම ළමයින්ට අධ්‍යාපන පහසුකම් සලසා දීම ස්ථිර ව පාසල සහ ගුරුවරයා අතින් සිදුවිය යුතු ය. මෙය නියත වශයෙන් ම සිදුවේ ද යන්න දත්ත විශ්ලේෂණ ප්‍රතිඵලවලින් අපට ඉදිරිපත් වුණු ප්‍රශ්නයකි.

8.03 නියැදිය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක හතරෙහි පාසල්වලට සමානුපාතික ව භෞතික සහ මානව සම්පත් සම්පාදනය නොවන බව නිරීක්ෂණය කරන්ට යෙදුණි. අනුරාධපුරය සහ මාතර දිස්ත්‍රික්කවල සමහර පාසල්වල ප්‍රාථමික පන්ති විවෘත ශාලාවල පැවැත්වේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි ඉතාම ඉහළ ගණයේ පාසල් බොහොමයක පන්ති කාමර ශිෂ්‍යයන්ගෙන් පිරී ඉතිරී පවතී. ගුරුවරයාට පුද්ගලික ව ශිෂ්‍යයා කෙරෙහි අවධානය යොමු කිරීමට හෝ ශිෂ්‍යයා මුහුණ දෙන ගැටලුවකට ගුරුවරයාගෙන් විසඳුමක් ලබා ගැනීමට හෝ නො හැකි වන තත්ත්වයක් මේ නිසා උදාවී ඇත. මෙවැනි දුර්වලතා විශේෂයෙන් බලපාන්නේ ප්‍රාථමික දරුවා කෙරෙහි ය. එම ළමයී බොහෝ විට ජීවිතයේ ප්‍රථම වතාවට යම් යම් දෑ ග්‍රහණය කිරීමට දරණ පළමු ප්‍රයත්නය මෙය විය හැකි ය. මෙවැනි වාතාවරණයක සිට ගුරු මහත්ම මහත්මීන් විධිමත් ලෙස දැනුම බෙද හැරීමට දරන පරිශ්‍රමය, ආයාසය, වෙහෙස තුළින් ළමයින් ලබා ගන්නා ඵල ප්‍රයෝජන ඉතා අල්ප බව පෙන්නුම් කෙරේ. එසේම එය දුෂ්කර ක්‍රියාවකි.

8.04 නියැදියට අයත් පාසල්වලින් ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලබාදෙන්නේ පාසල් 5කින් පමණි. මේවායේ සාමාන්‍යයෙන් ශිෂ්‍යයන් 500ක් පමණ ඉගෙනුම ලබන අතර පාසල් ප්‍රධානියකු හා උප ප්‍රධානියකු මගින් ඒවා කළමනාකරණය කෙරේ. ඉංග්‍රීසි භාෂාව, පරිසර විද්‍යාව ආදී විෂයයන්ට විශේෂ ගුරුවරුන් සිටින ඉහළ ශ්‍රේණි පැවැත්වෙන පාසල්වල මෙන් නොව මෙම ප්‍රාථමික පාසල්වල සියලුම විෂයයන් ඉගැන්වීම කරනු ලබන්නේ එකම ගුරුවරයකු විසිනි. මෙම ප්‍රාථමික පාසල්වල ඉංග්‍රීසි භාෂාව, පරිසර විද්‍යාව, තාක්ෂණය ආදී විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් පවතී. එවැනි ගුරුවරුන් ලැබීමෙන් ප්‍රාථමික පාසල් ළමයින්ගේ භාෂා කුසලතා, දැනුම සහ සන්නිවේදන කුසලතා පුළුල් වේ. ඉංග්‍රීසි - සිංහල භාෂා දෙකෙන් ම පොත් කියවීමට සිසුන් පෙළඹේ.

8.05 ඉගෙනුම් - අවස්ථාවක දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුවෙන්නේ ඉගැන්වීම් ක්‍රම තුළිනි. විශේෂ නව්කරණ, තාක්ෂණ ශිල්පී ක්‍රම සහ සිසුන්ගේ පුද්ගලික විවිධත්වය පිළිබඳ ව කල්පනා නො කර ගුරුවරු වැඩි පිරිසක් සාමාන්‍ය ඉගැන්වීම් ක්‍රම යොද ගන්නා බව දක්නට ලැබිණ. තව ද සිසුන්ගේ කියවීම ඇගයීමේ ක්‍රම විධිමත් ව පවත්වා ගෙන යෑම බොහෝ විට සිදු නොවේ. අක්‍රමවත් ලෙස ප්‍රතිපෝෂණ, ප්‍රතිකාර්ය ඉගැන්වීම් ක්‍රම සිදු කළ ද ඒවා පිළිබඳ ව පිළිවෙළකට වාර්තා පවත්වාගෙන යාම නො කෙරේ. ඉගෙනුම් උපකරණවල ඌනතාව විශාල දුර්වලතාවක් හැටියට ප්‍රාථමික අධ්‍යාපනයෙහි කැපී පෙනේ. දුර්වල ශිෂ්‍යයන්ට වඩාත් යෝග්‍ය වනනේ ඉන්ද්‍රිය - සංජානන ඉගෙනුමයි. ඕනෑම ශිෂ්‍යයෙකුට පළමුවරට අලුත් දැනුම ග්‍රහණය කරගැනීම පහසුවන්නේ ඉන්ද්‍රිය සංජානනය තුළිනි. ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නොමැති ව ඉගැන්වීම කිරීම අති දුෂ්කර කාර්යයකි. ප්‍රාථමික අධ්‍යාපන ක්‍රම වේදයෙහි ප්‍රධාන දුර්වලතාවක් හැටියට නිරීක්ෂණය කරන්ට යෙදුණේ, පන්ති කාමරයෙහි කරනු ලබන ඉගැන්වීම සිසුන්ගේ ජීවිතය හා පරිසරය සමග සම්බන්ධ කිරීමට දිරි නො ගැනීම යි. නියැදියට අයත් 4 වැනි ශ්‍රේණියේ සිසුන්ගෙන් 67% ක් තම පුද්ගලික ලිපිනය ද 43%කට තම පාසලේ නම ද සෑහීමට පත් විය හැකි තත්ත්වයකට ලියා ගැනීමට නො හැකිවීම ඉහත සඳහන් කළ අදහස් තවදුරටත් තහවුරු කරයි.

8.06 කියවීම සඳහා අවශ්‍ය පොත පත ලබාගැනීමට ඇති ඉඩකඩ පහසුකම් අනුව කියවීමේ කුසලතා සංවර්ධනය වේ. කියවීමේ පුරුදු සංවර්ධනය කිරීමෙහි ලා බලවත් අඩුපාඩුකම් ඇත. අවම පහසුකම් සතු පාසල්වල ශිෂ්‍යයන්ට කියවීම සඳහා අවශ්‍ය - සුදුසු, පොත පත සෑහෙන ප්‍රමාණයක් නොමැත. නියැදියට අයත් පාසල්වලින් හරි අඩකටත් වඩා පාසල්වල පුස්තකාල පහසුකම් නොමැත. පුස්තකාල ඇති පාසල් කීපයක ද ඉඩ පහසුකම් නොමැතිවීම, පුස්තකාල භාර නිලධාරීන් පත්කර ගැනීම සඳහා බලපාන මුදල් හිඟවීම, පොත් බෙද දීමට මෙන් ම ළමයින්ට මග පෙන්වීමට පුස්තකාල සහායකයන් නොමැතිවීම, ප්‍රාථමික එක් එක් ශ්‍රේණිවලට උචිත පොත්වල ඌනතාවයක් වීම, විවිධ ළමා ලැදිකම්වලට යෝග්‍ය විවිධ වර්ගයේ පොත් රාශියක් නොමැති වීම ආදී දුෂ්කරතා රැසක් ඇත. එමෙන්ම සමහර පාසල්වල පුස්තකාල සහායකයන්ට රට අදළ පුහුණුව ලැබී නැත.

සමහර පාසල්වලට, විවිධ සංවිධාන මගින් සහ නොයෙකුත් දනපතීන් විසින් පරිත්‍යාග කෙරුණු පොත පත අරක්ෂා සහිතව තැන්පත් කර තැබීමට කුඩා අල්මාරියක් පවා නොමැත. එහෙත් ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සතුව පොත් 3000- 5000 සංඛ්‍යාවක් ඇත. අවශ්‍ය ලී බඩු, කළමනාකරණය සඳහා පුහුණු පුස්තකාලයාධිපති, ආදී අවශ්‍ය අංග සියල්ලෙන් පරිපූර්ණ ව ඇත. එහෙත් 1 වැනි වර්ගයේ පාසල්වල සමහරවිට ඇත්තේ පොත් 10ක් පමණි. වත්මන් රජය විසින් මෙම දුඃඛදයක තත්ත්වය මගහරවා ගැනීමට නොයෙකුත් ක්‍රම සහ විධි යොද ගැනීම සුබ ලකුණකි. ළමයි සහජයෙන් ම දැනුම සෙවීමට, පොත් කියවීමට උත්සුක වෙති. ඔවුන්ගේ කියවීමේ පුරුදු, විඥපන සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ මෙන් ම අදළ නිලධාරීන්ගේ ද වගකීමකි. යුතුකමකි.

කියවීමේ පුරුදු සංවර්ධනය කිරීම සඳහා පහසුවෙන් හා ආයාසයකින් තොර ව, නිවැරදි ව කියවීමේ හැකියාව ළමයින් විසින් අත්පත් කර ගැනීම අවශ්‍ය ය. කියවීමේ දුර්වලතාව, ප්‍රමාණවත් භාෂා සංවර්ධනයක් නො ලැබීම හා බැඳී පවතී. ඒ නිසා ප්‍රාථමික පාසල් ළමයින්ගේ භාෂා කුසලතා ප්‍රවර්ධනය පිළිබඳ ව මීට වඩා බරපතල ලෙස සැලකිලිමත් විය යුතු වේ. අධ්‍යාපනයේ මූලික අරමුණ සාක්ෂරතාව පැතිරවීම යි. එනම් කියවීම, ලිවීම හා චින්තනය දියුණු කිරීම යි. දෛනික චර්යාව හෙවත් ජීවත්වීම තීරණය කෙරෙන්නේ කෙනෙකුගේ අදහස් සහ හැඟීම් මෙහෙයවීමෙනි. මිනිස් වර්ගයාගේ ප්‍රධාන ක්‍රියාකාරකම සන්නිවේදනය යයි කිව හැකි ය. එය ඉතා වැදගත් චර්යා ක්‍රමය යි. කියවීම උගෙනීම යනු කුසලතාවක් සහ ක්‍රියාකාරකමක් පමණක් නොවේ. ළමයින් කියවීම තුළින් දැනුම අත්පත් කර ගත්විට, කියවීම, බුද්ධිමය ගවේශනයට සහ ශාස්ත්‍රීය අධ්‍යයනයට ඉතා වැදගත් අභියෝගයක් වේ. එහෙයින් මෙම අභියෝගයන්ට මුහුණ දීම සඳහා පාසල ළමයින්ට උපකාරී විය යුතු ය.

නියැදියට අයත් පාසල් සියල්ල ම, අධ්‍යාපනය ලබා දීමේ ප්‍රයත්නයෙන් එක හා සමාන සාර්ථකත්වයක් අත්පත් කරගෙන නොමැත. මීට හේතු කාරක රාශියක් ඉදිරිපත් කළ හැකි ය. විශේෂයෙන් භාෂා කුසලතා සාධන මට්ටම, භෞතික සහ මානව සම්පත් ප්‍රමාණය හා සම්බන්ධතාවක් පෙන්නුම් කර තිබේ. 3 වැනි

වර්ගයට අයත් කොළඹ දිස්ත්‍රික්කයෙහි පාසල් සිසුන්ගේ භාෂා කුසලතා සාධනය ඉතා ඉහළ මට්ටමක පවතින අතර, 1 වැනි වර්ගයට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි ශිෂ්‍යයන්ගේ භාෂා කුසලතා සාධනය ඉතා ම අවම මට්ටමක පවතී. අවම පහසුකම් සහිත මෙම පාසල්වල සිසුන්ගේ ඉගෙනීම සඳහා ඔවුන්ගේ දෙමව්පියන්ට ආධාර කළ හැකි නොවේ. ඉගෙනීමක් නො ලැබූ බොහෝ දෙමව්පියන්ට අධ්‍යාපනය කෙරෙහි ධනාත්මක ආකල්පයක් නොමැත. ඒ නිසා ඔවුහු තම දරුවන් අධ්‍යාපනය කෙරෙහි උනන්දු නො කරවති. සමස්ත නියැදියට අයත් 4 වැනි ශ්‍රේණියේ පාසල් සිසුන්ගෙන් 50% සිට 67% දක්වා භාෂා කුසලතා අත්පත් කර ගැනීමට අපොහොසත් වූහ. ශ්‍රේණියට අදාළ වාඩිමාලාව, අක්ෂර වින්‍යාසය පිළිබඳ හැකියාව, අදහස් අවබෝධ කර ගැනීමේ කුසලතාව, ව්‍යාකරණානුකූල ව හා නිර්මාණාත්මක ලිවීමේ හැකියාව ලබා ගැනීමට ඔවුන් අසමත් වී තිබේ. තව ද, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 4 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයන්ගෙන් 68%කට තමාගේ ගෙදර ලිපිනය ද, 43% කට තම පාසලේ නම ද සෑහීමට පත් විය හැකි ප්‍රමාණයකට ලිවීමට නො හැකි වී ඇත. මෙසේ භෞතික සහ මානව සම්පත් සම්පාදනය කර ගැනීමේ පහසුව සහ ශිෂ්‍යයන්ගේ විෂය සාධන මට්ටම අතර සහසම්බන්ධතාවක් තිබේ. මෙම අවදනම් සහිත තත්ත්වය මග හරවා ගත යුතු වේ.

මෙවැනි අවස්ථාවක් යටතේ ඉගෙනීමේ වැදගත් ම සම්පත ගුරුවරයා සහ ශිෂ්‍යයා පමණි. අද කියවීම සහ ලිවීම යන කාර්යයන්ට කියවීමට ඇති පාඨය දිගේ ඇස දුව වීම, අකුරුවල හැඩය ඇඳීම හා හැඩය වෙන් කර හඳුනා ගැනීමට පමණක් සීමා නොවේ. මනෝවිද්‍යාවට අනුව ඕනෑම ක්ෂේත්‍රයක දැනුම කෙනෙකුට අත්පත් කර ගත හැක්කේ එම දැනුම ලබාගන්නා සහ ඒ දැනුමට අයත් වස්තුව සමග ඇති කර ගන්නා අන්තර්ක්‍රියාවලිය තුළිනි. මේ අනුව කියවීම ඉගෙන ගැනීම යනු ලියන ලද්දෙහි ස්වභාවය, කාර්යය සහ අගය පිළිබඳ ව විපරම් කිරීම යි. ළමයා මෙම ක්‍රියාව ආරම්භ කරන්නේ පාසලට ඇතුළුවීමට බොහෝ කාලයකට පෙර සිටය. ළමයි යම්කිසි සුවිශේෂී කුසලතාවක් අත්පත් කර ගැනීමට හුදෙක් කැමති හෝ අකමැති පිරිසක් නොව ක්‍රියාකාරී ලෙස දැනුම සොයා යන අය බව අප මතක තබා ගත යුතු වේ. ප්‍රාථමික පාසල් ළමයා "සාක්ෂර කවයට " ඇතුළු වී ස්වාභාවික සහ අනියම් අන්දමකට කියවීම ඉගෙනීම ආරම්භ කර ඇතැයි සඳහන් වේ. ළමයා නෙත ගැටෙන ලියන ලද දේවල් තම පරිසරයෙහි දකියි. උදා:- බස්වල නාම පුවරු, වෙළෙඳ පොළේ බඩුවල නම්, රූපවාහිනියෙහි විස්තර ප්‍රචාර, ප්‍රවෘත්ති පත්‍රවල ලොකු අකුරු. මෙසේ ළමයා තම පරිසරය තුළ වචන රාශියක් දකියි. ඒවා අර්ථවත් ව තේරුම් ගැනීමට උත්සාහ ගනියි. බොහෝ දරුවන්ට මුද්‍රිත වචන පිළිබඳ දැනුවත් බවක් තිබේ. මෙහි ලා ගුරවරු සතු වගකීම නම් ළමයා ලබා ඇති අත්දැකීම් පුළුල් කිරීමත්, අත්දැකීම් අඩු අයට ඊට හිලව් වන ලෙස අත්දැකීම් ලබා දීමත් ය . සමහර ගුරුවරුන් ළමයින්ගේ මෙම පුද්ගල විවිධත්වයට අවධානය යොමු කරන බව හෝ ළමයින් සතු දැනුම පුළුල්වන ලෙස අර්ථවත් අවස්ථා ඇතිකර කියවීම සඳහා ඒවා යොදා ගන්නා බවක් දක්නට නො ලැබේ. තවත් මතක් කළ යුතු කරුණක් නම් කියවීම ඉගෙනීමේ සාර්ථකත්වයට ළඟා වන්නේ අප කරන ඉගැන්වීම් තුළින් නොව, ඉගෙන ගනු ලබන්නන් වශයෙන් අප ළමයාට ක්‍රියාකාරීවීමට ලබාදෙන උදවුවලින් බවයි. ළමයින් ඉගෙන ගනු ලබන බොහෝ දෑ ඔවුන් විසින් ම උගත යුතු ය. ළමයා ඉගෙන ගන්නේ අප උගන්වන දෙය ම නොවේ. ඒ නිසා, ඉගෙනුම ලබන්නාගේ අවශ්‍යතා පිළිබඳ ව ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ. ගුරුවරු උගැන්වීමට සූදනම් වන වචන, වාක්‍යාංශ, වගන්ති ආදිය ළමයාට රුචිකත්වයක් ඇති කරන්නේ නම්, ඒවා මතකයෙහි රැඳේ නම්, ළමයින්ගේ ලැදිකම්වලට, අභිරුචිවලට සම්බන්ධතාවක් ඇත් නම් එවිට ඒවා ළමයිනට අර්ථවත් වේ. ළමයි තමන් ලබා ඇති අත්දැකීම් සමග අළුත් දෑ සන්සන්දනය කිරීමෙන් පසු ප්‍රතිචාර දක්වති. මේ අනුව මනාව පණිවුඩය ලැබී අවබෝධවීම මත කියවීම සිදු වේ. පරීක්ෂණ ප්‍රතිඵලවලින් අනාවරණය වී ඇත්තේ ඉගැන්වීමේ කාර්යයෙහි දී ගුරුවරුන් ඒකාකාර, සාමාන්‍ය ශිල්පීක්‍රම අනුගමනය කරන බව ය.

8.07 ළමයින්ගේ කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීමෙහි ලා ගුරුවරුන් අත්‍යවශ්‍ය අය හැටියට සැලකේ. කියවීමට හුරුවීම සහ කියවීම් පුරුදු ගොඩනගා ගැනීම ආරම්භ කරන මෙම ප්‍රාථමික අවදියෙහි දී ගුරුවරුන්ගේ බලපෑම අතිශයින් ප්‍රබල වේ. කියවීමෙන් විනෝදයක් ලැබීම සඳහා ළමයින්ට මග පෙන්වීම සහ උනන්දු කරවීම අවශ්‍ය වේ. ළමයින්ට කියවා දෙන දෑට අමතර ව එයින් ප්‍රියජනක අත්දැකීමක් නො

ලැබුණහොත් ළමයින් කියවීමේ යෙදෙනුයේ අල්ප වශයෙනි. ළමයින් තුළ කියවීමට ඇල්මක් ඇති වන අන්දමට හා රසවින්දනයක් ළමයින් තුළ ඇති වන හැටියට කියවීමට, ගුරුවරියට ද කියවීමේ ආශාවක් තිබිය යුතු වේ. මෙහිදී ළමා සාහිත්‍යය පිළිබඳ පූර්ණ දැනුමක් තමා සතු වීම ද ගුරුවරුන්ට ප්‍රබල වාසියක් වේ. මිළදී ගත හැකි උසස් පොත් සමග සමීප බවක් ගුරුවරුන් තුළ තිබිය යුතුය. තමාගේ මුළු සේවා කාලය තුළ දී 500ට අධික පොත් සංඛ්‍යාවක් කියවා ඇත්තේ නියැදියට අයත් ගුරු සංඛ්‍යාවෙන් 50%ක් පමණ බව "ස්වයං වාර්තා ආකල්ප පරීක්ෂණ" ලැයිස්තුවේ පිළිතුරුවලින් අනාවරණය වේ. පොත් 1000කට අධික සංඛ්‍යාවක් කියවා ඇත්තේ ගුරුවරුන් 2ක් පමණි. නවදැනුම සොයා යාම ගුරුවරයකු සතු අවශ්‍ය ලක්ෂණයක් විය යුතු නොවේ ද?

සෑම ඉගෙනුම් ඒකකයක් ම උගන්වා අවසානයෙහි දී අඛණ්ඩ ඇගයීමක් කරන ලද්දේ නම් , ළමයින්ගේ භාෂා කුසලතා සාධනයෙහි දුර්වල ක්ෂේත්‍ර සොයා බැලීම සඳහා අනාවරණ පරීක්ෂණ පවත්වන ලද්දේ නම්, ඉන්පසු ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ නම්, අදාළ ශ්‍රේණිය සඳහා වූ භාෂා සාධන පරීක්ෂණයෙන් මෙතරම් ශිෂ්‍ය සංඛ්‍යාවක් අපේක්ෂිත කුසලතා මට්ටමට අවම සාධනයක් නො ලබනු ඇත. මේ අනුව බලනවිට නව ඇගයීම් ක්‍රම භාවිත කිරීම සහ අඛණ්ඩ ඇගයීම් ක්‍රමයක් පැවැත්වීම, ඒ හා බැඳුණු ක්‍රමවත් ප්‍රතිපෝෂණ වැඩ සටහන් පවත්වාගෙන යාම ප්‍රබල අවශ්‍යතාවකි.

8.08 පොතක් කියවීමෙන් ළමයෙකුගේ අවශ්‍යතා සන්සිඳුනොත් ළමයා එම පොත රස වින්දනය සඳහා නැවත නැවත කියවීමට පටන් ගනියි. ළමයා පොත සමග මුලින් ම සබැඳියාවක් ඇති කරගන්නේ එම පොතේ පින්තූර දෙස බැලීමෙනි. ඒවා විමසීමෙනි. එම පින්තූර කෙරෙහි ලැදියාවක් ඇති වුවහොත් ළමයා නැවත නැවත පොත සොයා යන බව පෙනේ. සිබිල් වෙත්තසිංහගේ "කුඩහොරා" වැනි පින්තූර කතන්දර පොත් ළමා අවශ්‍යතා තෘප්තිමත් කිරීමට ඉවහල් වන හෙයින් එවැනි පොත් තෝරා ළමයින්ට ලබා දිය යුතු වේ. 4 වැනි ශ්‍රේණියේ ස්වයං වාර්තා අභිරුචි ලේඛනවලින්, ජාතක කතන්දර ළමයින්ගේ ප්‍රියතම තේරීම හැටියට අනාවරණය වුණි. රට හේතුව ළමයින්ගේ අවශ්‍යතා සහ ලැදියා එම කතන්දරවලින් තෘප්තිමත් වන නිසා විය හැකිය. එම කතන්දරවලින් කියැවෙන ලෝකය සහ අවට පරිසරය, වෘක්ෂලතාදිය, සත්ත්ව වර්ග, පවුල් ජීවිතය, සමාජය හා සම්බන්ධ මානව අන්තර් ක්‍රියාකාරකම් ආදිය ඔවුන් ගේ අත්දැකීම් හා සම්බන්ධ කර ගනිමින් රසවින්දනයක් ලබා ගැනීමට ළමයින්ට පුළුවන. එසේම ඒවා කියවීමෙන් නිවැරැදි සදාචාරධර්මයන් සිතට කා වැදී යනවිට ළමයා ඒවා තුළින් හොඳ - නරක තෝරා බේරා ගනියි. ඒ නිසා මෙහිලා ප්‍රධාන ගුරු කර්තව්‍යය වන්නේ ළමයින්ගේ සංවර්ධනාත්මක හැකියාවන්ට සහ වයස් මට්ටමට සරිලන අවශ්‍යතා සහ ලැදිකම්වලට අනුකූල පොත පත තෝරා දීම යි.

බටහිර රටවල කරන ලද පර්යේෂණවලට අනුව ළමයින්ගේ කියවීමේ සාර්ථකත්වය සාධනය කරගනු ලබන්නේ ඔවුන්ට කියවීම සඳහා අවස්ථා බහුල කිරීමෙන් සහ හැකිතාක් යෝග්‍ය පොත්පත් ලබා දීමෙනි. කියවීමේ දක්ෂයන් බොහෝ දෙනෙකුට ඒ අයගේ දෙමව්පිය වැඩිහිටියන් නිත්‍යයෙන් ම කතන්දර කියා දීම හෝ පොත් බලා කථාන්තර කියවීම හෝ කර ඇති බව ඔප්පු වී ඇත.

ළමයින්ට ඉදිරිපත් කරන ලද ආකල්ප පරීක්ෂණවලින් හෙළිදරව් වූයේ ළමයින්ගෙන් 15%ක් වත් ඒ අයගේ සීයා, ආච්චි, නෑදැයෙකු හෝ පවුලේ නොවන අනෙකුත් වැඩිහිටියෙකු සමග ජීවත් නොවන බවය. තවත් අනාවරණය වූ කරුණක් නම්, කියවීමට ඇති ආසාව නිසා ළමයින් අතට අසුවන ඕනෑම පොතක්, පත්‍රයක් කියවන බව ය. ( IV ඇමුණුම බලන්න.) ඒ නිසා ළමා වයසට සුදුසු - නුසුදුසු පොත් තේරීමේ කාර්යය වැඩිහිටියන් විසින් කළ යුතු වේ. ප්‍රාථමික ශ්‍රේණිවල උගෙනුම ලබන ළමයින්ට පොත්වල හොඳ - නරක පිළිබඳ වැටහීමක් නැත. ශ්‍රී ලංකාවේ ළමා පොත්වල ප්‍රමාණය සහ ගුණාත්මක බව ප්‍රවර්ධනය කළ යුතු බව මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ. එසේම පොත් තේරීම සහ බෙද හැරීම මීට වඩා ක්‍රමවත් ව සිදු කළ යුතු වේ.

## 09 පරිච්ඡේදය

# නිර්දේශ සහ යෝජනා

නිර්දේශ පිළිබඳ ව ප්‍රධාන මාතෘකා දෙකක් ඔස්සේ සැලකිල්ල යොමු කර ඇත.

1. භාෂා කුසලතා සහ සම්බන්ධ අධ්‍යාපන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම
2. ප්‍රාථමික පාසල් සිසුන් අතර කියවීමේ පුරුදු, විඥාපන සහ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම.

9.01 භාෂා කුසලතා හා සම්බන්ධ අධ්‍යාපන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම

අ. ඉගැන්වීමේ කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන විචල්‍යයන් රාශියක් ඇත. එනම්, භෞතික සහ මානව සම්පත් අවශ්‍ය ප්‍රමාණයට පාසල සතුවීම, ශිෂ්‍යයන්ගේ ගෙදර පසුබිම ඉගෙනීම සඳහා හිතකර වීම, ගුරුවරයා ශිෂ්‍යයන් කෙරෙහි සහ තම වෘත්තිය කෙරෙහි දක්වන ආකල්ප, ඉගැන්වීමේ ශිල්පීක්‍රම ගුරුවරුන්ට ලබාදෙන අඛණ්ඩ මාර්ගෝපදේශනය, ගුරු ඉගැන්වීම අධීක්ෂණයට භාජන කිරීම, ඉගැන්වීම් උපකරණ, සිසුන්ගේ කුසලතා සාධනය තක්සේරු කිරීම සහ ඇගයීම, ඒ පිළිබඳ විධිමත් ව වාර්තා තැබීම, ප්‍රතිපෝෂණ ක්‍රියාමාර්ග, ගුරු පුහුණුව, පාසල් ප්‍රධානියාගේ ආකල්ප සහ කාර්යක්ෂමතාව ආදිය වැදගත් වේ.

ඉගැන්වීම් සහ ඉගෙනුම් අවස්ථාවක ඉතාම වටිනා සම්පත් වන්නේ ගුරුවරයා සහ ශිෂ්‍යයාය. 1 වැනි සහ 2 වැනි වර්ගයේ පාසල්වල සිසුන්ට ඉගෙනුම ලබාගත හැකි එකම මූලාශ්‍රය ගුරුවරයා ය. ළමයා ජීවිතයට හැඩගස්වන මෙම ප්‍රාථමික අවදියෙහි දී ගුරුවරයාගේ බලපෑම අතිශයින් ප්‍රබල වේ. ඒ නිසා ළමයින්ගේ ලැදිකම්වලට, පාසල් අවට පරිසරයට යෝග්‍ය, නවතම ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් අනුගමනය කළ යුතු වේ. දක්ෂ ගුරු නියාමකවරුන්ගෙන් මෙම ගුරුපිරිස විධිමත් ලෙස මාර්ගෝපදේශය ලැබිය යුතු ය. අධීක්ෂණයට භාජන කළ යුතු ය. පාසල පිහිටි ප්‍රදේශයේ ද්‍රව්‍යවලින් ඉගෙනුම් උපකරණ සකස් කර ගැනීමට සහ ඒවා ප්‍රයෝජනවත් කර ගන්නා අයුරු පිළිබඳව පුහුණුවක් ලබා දීම අවශ්‍ය වේ. එවිට උගැන්වීමේ ගුණාත්මක බව වැඩි දියුණු වේ.

භාෂාව ඉගෙන ගැනීමෙහි දී සිසුන් මුහුණ පාන දුෂ්කර ක්ෂේත්‍ර විමසා බැලීම සඳහා ගුරුවරුන් ඇගයීම් ක්‍රම උපයෝගී කර ගත යුතුය. ඉන්පසු ප්‍රතිපෝෂණ ඉගැන්වීම් ක්‍රම, පසු ප්‍රතිපෝෂණ ක්‍රියා සකස් කර ගත යුතු වේ. මෙහි දී ශිෂ්‍යයන්ගේ විවිධත්වය මෙනෙහි කර ගැනීම අවශ්‍ය වේ. ගුරුවරුන් විසින් අවුරුදු 10-15 ට පෙර ලබා ඇති ඉගැන්වීම් පුහුණුවට නව පණක් ලබා දිය යුතු ය. එවිට එම ගුරුවරුන්ට තමන් පිළිබඳව ආත්ම විශ්වාසයක් ගොඩ නැගේ. ගුරුවරයකු වශයෙන් තමාගේ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට එයින් ධෛර්යයක් ලැබෙන නිසා වඩාත් ඇප කැප වීමෙන් වෘත්තියෙහි නියැලීමට එය පිටු බලයක් වේ. ඒ නිසා කාර්යක්ෂම ගුරු උපදේශකවරුන් වැඩි පිරිසක් පුහුණු කිරීමටත්, වසරකට දෙවරක් හෝ ගුරුවරුන්ට සේවාස්ත පුහුණුව ලබාදීමටත් මෙයින් නිර්දේශ කෙරේ.

ආ. භාෂා කුසලතා සංවර්ධනය කිරීමෙහිලා ගුරු අභ්‍යාස විද්‍යාල සහ අධ්‍යාපන පීඨ විශේෂ ස්ථානයක් උසුලනු ලැබේ. භාෂා කුසලතා ඉගැන්වීමේ ක්‍රම අත්හද බැලීමේ පර්යේෂණ ආරම්භ කළ යුත්තේ විශේෂයෙන් මෙම ආයතනයන් ය. ප්‍රාථමික අවදියේ විවිධ ශ්‍රේණි සඳහා කියවීම, ලිවීම සහ අවබෝධය ඉගැන්වීම පිළිබඳව පර්යේෂණ ඉදිරිපත් කිරීමට ගුරුවරුන් පෙළඹවීම, උනන්දු කරවීම ගුරු පුහුණු පාඨමාලාවලට ඇතුළත් විය යුතු ය. පුහුණුවෙන් පසු ගුරුවරුන් ඒ ඒ පාසල්වලට පත්වීම් ලැබූ විට එම ප්‍රදේශවල ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවලට උචිත පරිදි විවිධ ඉගැන්වීම් ක්‍රම අත්හද බලා යෝග්‍ය ක්‍රම ක්‍රියාත්මක කිරීමට ඒ අයට කළ හැකි ය. සාමූහික ඉගෙනීම, විවිධ ශ්‍රේණිවලට එකවර ඉගැන්වීම සහ ප්‍රතිපෝෂණ වැඩ සටහන් ඇත්ත වශයෙන් ම පහසුකම් අඩු පාසල්වල අධ්‍යාපනය නගා සිටුවීමට ආධාර වේ.

ඇ. පාසලක අධ්‍යාපන ක්‍රියාවලිය කළමනාකරණය කරන, එය මෙහෙයවන පුද්ගලයා එහි විදුහල්පතිවරයා ය. අවම පහසුකම් ඇති පාසල්වල ප්‍රධානීන්ට ප්‍රජා නායකයන් හැටියට ද ක්‍රියාකිරීමට සිදුවේ. මෙම පාසල්වල ශිෂ්‍යයන්ගේ දෙමවුපියෝ බොහෝ විට උසස් ඉගෙනුමක් ලබා නොමැති නිසා ඉගෙනීම කෙරෙහි ධනාත්මක ආකල්පයක් නො දක්වති. එහෙයින් ළමයින්ගේ අධ්‍යාපන කටයුතුවලට ඔවුන්ගෙන් පිහිටක් නො ලැබේ. මෙවැනි අවස්ථාවල දී පාසල් ප්‍රධානීන් ප්‍රජා නායකයන් හැටියට, අධ්‍යාපනයෙහි වටිනාකම පිළිබඳ ව දෙමාපියන් දැනුවත් කර පාසලේ ශුභ සාධනය සඳහා ඒ අයගේ උදවු උපකාර ලබා ගත යුතු වේ. පාසලේ ක්‍රියාකාරකම් පිළිබඳ ව (උදා:- කුඩා ළමයින්ට කතන්දර කියා දීම භාෂා සංවර්ධනයට ඉඩ සලසන බව ආදිය පිළිබඳ ව) දෙමාපියන් දැනුවත් කෙරෙන වැඩසටහන් සංවිධානය කළ යුතු වේ. එසේ ම ඉගෙනුම් උපකරණ සෑදීමට, කියවීමට අදළ පොත පත ලබා ගැනීමට අදළ වැඩසටහන් පිළිවෙළ කරගෙන දෙමාපිය සහභාගිත්වය ලබා ගත යුතු වේ. එසේ ම වත්කම් ඇති අයගෙන් මූලාධාර ලබාගත හැකි ය. මෙසේ පාසල් ප්‍රධානීන්ට ගුරුවරුන් ගේ මෙන් ම, දෙමාපියන්ගේ ද සහයෝගය ලබා ගැනීමට සිදු වේ. පාසලේ අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීම සඳහා විදුහල්පතිගේ නායකත්වය සහ සේවයට කැපවීම ලක්ෂණ ඉතා වැදගත් වේ. ඒ නිසා පාසල් ප්‍රධානීන් ඉතා ප්‍රවේශමෙන් තෝරා ගත යුතු වේ. විශේෂයෙන් ප්‍රාථමික පාසල් ප්‍රධානීන්ට අදළ පුහුණුව අනිවාර්යයෙන් ම ලබා දිය යුතු වේ.

## 9.02 කියවීමේ පුරුදු, විඥපන සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා

අ. කියවීමේ පුරුදු විඥපන සහ සන්නිවේදන කුසලතා ළමයින් තුළ ප්‍රවර්ධනය කිරීමේ වටිනාකම ප්‍රමාණවත් ලෙස හඳුනාගෙන අධ්‍යාපන අමාත්‍යාංශය ධනාත්මක ස්ථාවර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. ළමා පොත් සහ කියවීමේ පුරුදු සංවර්ධනය කර දියුණු කිරීම උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රධාන සංවිධාන 3 ක් ඇත. :-

1. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
2. ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
3. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මෙම ආයතන මගින් වැඩමුළු, සම්මේලන, ලේඛකයන් පුහුණු කිරීමේ වැඩසටහන් , පොත් ප්‍රදර්ශන සාහිත්‍ය තරග ආදී කටයුතු රාශියක් සංවිධානය කෙරේ. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සෑම දිස්ත්‍රික්කයක ම පාහේ පාසල්වල, දෙපාර්තමේන්තුවල පුස්තකාල පිහිටුවීම හා දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළ දියත් කර ඇත. එසේ ම පොත් ප්‍රකාශන කර්මාන්තය දියුණු කර මහජනයාට වැඩිපුර පොත් ප්‍රමාණයක් ලබාදීමට ආධාර කෙරේ. ලේඛකයන් දිරි ගැන්වීමක් වශයෙන් කිසියම් පොත් ප්‍රමාණයක් මිලදී ගැනීම ද ඒවා නො දියුණු ගම් ප්‍රදේශවල නොමිලේ බෙද හැරීම ද සිදු කෙරේ. මෙවැනි ම වැඩ පිළිවෙළක් ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය මගින් ද, සංස්කෘතික අමාත්‍යාංශයේ සාහිත්‍යය සහ ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ද සිදු කර ඇත. රජයේ මෙම සංවිධානවලට අමතරව පොත් ප්‍රකාශකයන්ගේ සංගමය, පොත් වෙළඳුන්ගේ සංගමය, ලේඛකයන්ගේ සංගමය, පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය ද මහජන පුස්තකාලය, බ්‍රිතාන්‍ය මණ්ඩලයේ පුස්තකාලය, කෞතුකාගාරයේ පුස්තකාලය ආදී ආයතන රාශියක් මගින් කියවීමේ පුරුද්ද වැඩි දියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.

මෙවැනි වැඩ කටයුතු රාශියක් ක්‍රියාත්මක වෙතත්, ප්‍රාථමික අවදියෙහි ළමයින් සඳහා නිෂ්පාදනය කෙරෙන පොත්වල සංඛ්‍යාවේ සහ එම පොත්වල ගුණාත්මකභාවයේ තවමත් ඌනතා දක්නට ලැබේ. ප්‍රාථමික ශ්‍රේණිවල ඒ ඒ වයස් මට්ටමට යෝග්‍ය පොත් ප්‍රමාණයේ හිඟයක් ඇත. හැම පළාතකට ම, ප්‍රදේශයකට ම, පාසලකට ම පොත් බෙද හැරීම එක හා සමාන ව සිදු නොවේ. පුස්තකාල පහසුකම් පුළුල් ලෙස පැතිරී නැත. පුස්තකාලවල සේවයේ යෙදී සිටින ගුරුවරුන් ආදේශකයන් ඒ සඳහා පුහුණුවක් ලබා නොමැත. ප්‍රාථමික ශ්‍රේණි සිසුන් තුළ කියවීමේ පුරුද්ද සංවර්ධනය කිරීමට

නම් මෙම අඩුලුහුඩුකම් හැකිතාක් කඩිනමින් මගහරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම වැඩ පිළිවෙළක් දියත් කළ යුතු වේ.

ආ. ළමා පොත් සංඛ්‍යාව

සංඛ්‍යා ලේඛනවලට අනුව 1996 වර්ෂයෙහි දී නිෂ්පාදනය කරන ලද පොත් ප්‍රමාණය 318 (ග්‍රන්ථ නාම) කි. 1997 වර්ෂයේ නිෂ්පාදනය කර ඇත්තේ පොත් 284ක් පමණි. අනෙකුත් රටවල් හා සන්සන්දනය කර බලන විට අපේ ජනගහනයට අනුපාත ව නිෂ්පාදනය කර ඇති පොත් සංඛ්‍යාව ඛේදජනකය. ඩෙන්මාර්කය වැනි දියුණු රටක් ඒ අයගේ මිලියන එකක් පමණ වූ ළමා ජනගහනයට පොත් මිලියන 70ක් නිෂ්පාදනය කෙරේ. ශ්‍රී ලංකාවේ 1996 වසරේ පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 18,103228 කි. එම වසරේ නිෂ්පාදනය කර ඇති පොත් සංඛ්‍යාව 318 (ග්‍රන්ථ නාම) කි. මෙසේ ප්‍රාථමික අවදියේ ළමයින්ට කියවීමට ඇත්තේ ඉතා සුළු පොත් ප්‍රමාණයකි. කියවීමේ පුරුදු සහ විඥපන, සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අසතුටුදායක තත්ත්වය කෙසේ හෝ මග හරවා ගත යුතු වේ. ළමා සාහිත්‍යය ඉතා දියුණු බ්‍රිතාන්‍යය, ජර්මනිය, අමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල විවිධ මාදිලියේ මෙන් ම ඒ ඒ මට්ටමට අදළ විවිධ අන්තර්ගතයෙන් යුක්ත පොත් බහුල ව ලබා ගත හැක.

ළමයින් සඳහා පොත් රචනා කරනවිට ළමයින්ගේ හැකියා මට්ටම හා යමක් අවබෝධ කර ගැනීමේ ශක්ති ප්‍රමාණය ගැන සිතා, පුළුල්, එසේම විවිධ අත්දැකීම් ක්ෂේත්‍ර සහ දැනුම පාදක කරගෙන, හැම ළමයකුට ම පාහේ පොතක් ලැබෙන සේ පොත් රාශියක් බිහි කළ යුතු වේ. විශේෂයෙන් ළමයාගේ පරිසරය හා අත්දැකීම් සමග බැඳුණු කථා පොත් සහ ළමයින් කියවීමට පොළඹවන ඔවුන්ගේ කුතුහලය සන්සිඳුවන පොත් කියවීමෙන් ළමා පෞරුෂයේ හැම අංශයක් ම පාහේ සංවර්ධනය වේ. ස්වභාවධර්මය, විද්‍යාව, භූගෝල ශාස්ත්‍රය ආදී විෂයයන් අළලා ප්‍රාථමික ළමයින් උදෙසා ලියැවුණු පොත් ප්‍රමාණය ඉතා අල්ප වේ. මෙයින් පෙනෙන්නේ ළමා සාහිත්‍යයේ සංවර්ධනය සමතුලිත නො වන බවයි. ලේඛක ප්‍රකාශක දෙපක්ෂය ම වඩාත් නැඹුරු වී ඇත්තේ අවුරුදු 5-8 වයසේ එක ම කණ්ඩායමකට එක ම වර්ගයේ, එනම් පින්තූර කථාපොත් ලිවීමට ය. එබැවින් ප්‍රාථමික අවදියෙහි එක් එක් වයස් මට්ටමට සරිලන විවිධ වර්ගයේ පොත් මට්ටම් 3කින් නිෂ්පාදනය කිරීම සුදුසු යයි යෝජනා කරනු ලැබේ.

1 මට්ටම = 1 ශ්‍රේණියට අදළව
2 මට්ටම = 2 සහ 3 ශ්‍රේණිවලට අදළව
3 මට්ටම = 4 සහ 5 ශ්‍රේණිවලට අදළව

මෙම බෙදීම සාමාන්‍යයෙන් දළ වශයෙන් ළමයාගේ මනෝවිද්‍යාත්මක, සමාජීය සහ භාෂා සංවර්ධන මට්ටම ගැන සැලකිලිමත් ව සකස් කෙරුණි.

තවත් සඳහන් කළ යුතු කරුණක් නම්, අධ්‍යාපනඥයන් මෙන් ම ලේඛකයන් ද ආබාධිත ළමයින් සඳහා, විශේෂයෙන් මානසික පසුබටතාවක් ඇති ළමයින් උදෙසා පොත් රචනා කිරීම පිළිබඳ ව සැලකිල්ල යොමු කළ යුතු බව යි.

ඇ. ළමා පොත්වල ගුණාත්මක බව

ළමයින් සඳහා හොඳ තත්ත්වයේ පොතක් නිර්මාණය කිරීමට අවශ්‍ය කරන ගුණාංග පිළිබඳ ව තවමත් අප ලේඛකයන්ට සහ ප්‍රකාශකයන්ට පැහැදිලි අවබෝධයක් නැතුවා සේ පෙනේ. බොහෝ විට පොතේ ආකෘතිය සහ සැකැස්ම මුද්‍රණකරු දන්නා හැටියට සිදු කෙරේ. සෑම වයස් කණ්ඩායමකට ම අපට ඇත්තේ එක සමාන ආකෘතියක පොත් ය. ලේඛකයන් බහුතරයකට ළමා සංවර්ධනය සහ ළමා අධ්‍යාපන ක්‍රම පිළිබඳ දැනුමක් නොමැත. ළමයාගේ ශාරීරික සංවර්ධනයට සුදුසු අන්දමට ඔහු කියවන පොතේ පිටුවේ සහ අකුරුවල ප්‍රමාණය වෙනස්වීම අවශ්‍ය බව පිළිබඳ ව ඒ අය සැලකිලිමත්

නොවෙති. එසේ ම ළමයාට එක් පිටුවක කියවීමට ඇති වචන ප්‍රමාණය ඔහු ගේ මානසික සංවර්ධන මට්ටම සහ වාඝ්මාලා මට්ටම අනුව පාලනය කළ යුතු බව ලේඛකයෝ නො සිතති. සමහර ලේඛකයෝ ළමයින්ට තේරුම් ගත නො හැකි වැඩිහිටි අයට සුදුසු ශාස්ත්‍රීය භාෂාව සහ වියුක්ත සංකල්ප භාවිත කරති. වචන අහුලාගෙන සංකල්ප ගොඩ නගා ගැනීම ආරම්භ කරන කුඩා ළමයාට, මෙසේ හරබර වචන භාවිත කිරීම නිසා කියවීම පිළිබඳ ඇති රුචිය හීන වී යා හැකි බව ඒ අය බොහෝ විට අමතක කරති. නො එසේ නම් ඒ බව නො දනිති. අපගේ ලේඛකයන් බොහෝ දෙනෙකුට සහ ප්‍රකාශකයනට ළමා පොත් ලිවීමේ පරමාර්ථ සහ එම පරමාර්ථ කෙසේ යොමු කළ යුතු ද යන්න පිළිබඳ හරි වැටහීමක් නොමැති බව පෙනේ. ඒ නිසා ළමයාගේ පරිකල්පනය සහ කුතුහලය අවදි කරන. වඩාත් යහපත් නිර්මාණාත්මක ලේඛකයන් බිහි කිරීම සඳහා පුහුණු කිරීමේ ක්‍රියා මාර්ග සංවිධානය කිරීම අත්‍යවශ්‍ය වේ. නිර්මාණාත්මක ලේඛකයන්ගේ පොත් කියවීමට එවායේ රසවින්දනයට ළමයි කැමති වෙති. ඒවා රස විඳීමෙන් කියවීම කෙරෙහි යාවජීව අභිරුචියක් ජනනය වේ.

### ඈ. ජනමාධ්‍ය සහ කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම

කියවීම පිළිබඳ ඇල්මක්, රුචියක් ජනිත කරවීම සඳහා ජනමාධ්‍ය ප්‍රයෝජනවත් කර ගැනීම තවත් මාර්ගයකි. උදහරණයක් ලෙස ගත හොත් ප්‍රවෘත්ති පත්‍රවල සිත් ඇද ගන්නා පොත් පිළිබඳ විවේචන, ගුවන් විදුලිය , රූපවාහිනිය මගින් නවතම කෘති පිළිබඳ සාකච්ඡා මෙහෙයවීම, ළමා වැඩසටහන්, නාට්‍ය ආදිය පිළිබඳ සාකච්ඡා කිරීම ආදිය පෙන්වා දිය හැකිය. මෙවැනි ක්‍රියාදමයක් තුළින් පොත් කියවීමේ අගය, පොත්වල වටිනාකම ආදිය පිළිබඳ ව මහජනයා අතර පුළුල් ලෙස තොරතුරු ව්‍යාප්තවීමට ඉඩ සැලසේ.

රූපවාහිනිය නැරඹීම ළමයාගේ විවේකකාලය උදුරාගැනීමක් බවත්, ඒ නිසා ම ළමයා පොත් කියවීමෙන් ඈත් වන බවත් සමහර ගුරුවරුන්ගේ මතය විය. රූපවාහිනියේ විශේෂයෙන් කාටූන් කතාන්දර ළමයින්ගේ ප්‍රියතම රූපවාහිනී වැඩ සටහන බව ළමයින්ගේ ස්වයං වාර්තා අභිරුචි ලේඛනවලින් ද පෙන්නුම් කෙරුණි. වර්ණය, ශබ්දය, ක්‍රියාකාරිත්වය සහ වේගී චලනයට ළමයා ආකර්ෂණය වන නිසා එක් අවුරුදු වයසැති නොදරුවන් පවා රූපවාහිනිය නැරඹීමට ඇලුම් කරන බව පෙනේ. ළමයින් සඳහා විශේෂයෙන් සකස් කරන ලද "සෙසමි ස්ට්‍රීට්", ටයිටස් තොටවත්තයන් ගේ කාටූන් චිත්‍ර කතාන්දර ළමා සංවර්ධනයට සහ ඔවුන්ගේ භාෂා වර්ධනයට, විනෝදයට අතිශයින් හිතකර වේ. රූපවාහිනියෙන් දැක්වෙන දමරික ක්‍රියා නැරඹීමෙන් ළමයින් තුළ දමරික චර්යා වැඩිවීමට ඉඩ සැලසෙන බව විචාරකයන් බහුතරයකගේ මතය යි. සමහර විට දෙමව්පියන් ළමයින් ගැන මඳ සැලකිල්ලක් දැක්වීම නිසා ළමයින් රූපවාහිනිය නැරඹීමට ඇබ්බැහි විය හැකිය. එය නිතැතින් ම කියවීමේ පුරුදු සංවර්ධනයවීමට බාධාවක් වේ. මේ සඳහා දෙමව්පියන් විසින් ගත හැකි ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

1. රූපවාහිනිය නරඹන කාලය කෙටි කර ඒ වෙනුවට ළමා සිත් ඇද බැඳගන්නා ක්‍රියාකාරකම් ලබා දීම.
2. යහපත් වැඩදායි වැඩසටහන් දරුවන් සමග එකට වාඩි වී බලා ඒවායේ හොඳ පැත්ත සාකච්ඡා කිරීම.
3. රූපවාහිනියෙන් පෙන්නුම් කරන සාහසික ක්‍රියා පිළිබඳ ව සහ කලහකාරී දමරික හැසිරීම් පිළිබඳ ව කථාකිරීම, අකමැත්ත දැක්වීම එම ගැටලු විසඳීම සඳහා අනිකුත් ක්‍රම ඉදිරිපත් කිරීම සහ සාහසික ක්‍රියා අඩුවෙන් නැරඹීමට කටයුතු සැලසීම.

### ඉ. පොත් බෙද හැරීම

ළමයින් බහුතරයකට වැඩදායි වන ලෙස පොත් බෙද හැරීම කළ යුතු වේ. මහජන පුස්තකාල, ප්‍රාදේශීය පුස්තකාල, ප්‍රජා සංවර්ධන පුස්තකාල, පාසල් පුස්තකාල ආදිය මාර්ගයෙන් පොත් බෙද

දීම කළ හැකි වේ. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාථමික පාඨශාලාවකට ම ළමා පොත් විශාල පරාසයක්, ළමා පුවත්පත්, ළමයින්ට යෝග්‍ය සඟරා මෙන් ම පුස්තකාල භාර පුහුණු නිලධාරීන් ද අත්‍යවශ්‍ය ය. එසේ ම ගෙදරවල පුස්තකාලයක් හැටියට පොත් එකතුවක් ගොඩ නගා ගැනීම ද සුදුසු ය. මෙසේ මුළු රට පුරා වෙසෙන ප්‍රාථමික ශ්‍රේණී දරුවන් උදෙසා පුස්තකාල පහසුකම් ලබාදීම පිළිබඳ ව වගකිවයුතු අය ගේ අවධානය යොමු විය යුතු ය. පොත් බෙද හැරීමේ නව ශිල්පී ක්‍රම සොයා ගත යුතු අතර, පුස්තකාලයාධිපතීන් සහ සහායකයන් පුහුණු කිරීමට කටයුතු සැලසිය යුතු ය. අනාවරණය වී ඇති කරුණුවලට අනුව කියවන පාඨක අනුපාතයට සරිලන පුහුණු පුස්තකාලයාධිපතීන් ඇත්තේ 1 % කටත් අඩු ප්‍රමාණයකි.

ඊ. තව ද, වෙනස්වන සමාජයට අනුකූල ව පුස්තකාල පද්ධතිය තුළ වෙනස්කම් ඇති කිරීම ද අදට වුවමනා අවශ්‍යතාවකි. ආත්ම පරිත්‍යාගයෙන් හා ඇප කැපවීමෙන් යුක්ත ව ළමයින් තුළ කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට පුස්තකාලයාධිපතීන්ට පුළුවන. ළමයින්ගේ සිත් ඇදගන්නා සුලු ඒ අය ඇලුම් කරන ක්‍රියාකාරකම් රාශියක් ඒ ඒ පුස්තකාලවල පුස්තකාලයාධිපතීන්ට සංවිධානය කළ හැකි ය. දෙමවුපියන්ගේ සහභාගිත්වය සහ ප්‍රසිද්ධ උගතුන් ගේ සහයෝගය ඇති ව දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා ජාතික මට්ටමෙන් "කතන්දර පැය" ප්‍රහේළිකා තරග, පොත් සංසද , පොත් ප්‍රදර්ශන, කියවීම් සාමාජ, කියවීම් සති ආදී ක්‍රියාකාරකම් ආරම්භ කිරීමෙන් ළමයින් තුළ කියවීමේ ආශාව දියුණු කළ හැකි ය. එසේ ම ආබාධිත ළමයින් සඳහා ද සුදුසු වැඩ සටහන් සංවිධාන කිරීම, අත්‍යවශ්‍ය කරුණක් වී තිබේ.

පුස්තකාල පද්ධතිය ප්‍රතිසංවිධානය කිරීමෙහි දී 2 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යයකුට වුව ද පහසුවෙන් පුස්තකාලයෙන් ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි එහි යාන්ත්‍රණය සකස් විය යුතු ය. පොතක් තෝරා ගන්නේ කෙසේ ද? කුමන වර්ගයේ පොතක් තෝරා ගත යුතු ද? එම පොත් ඇත්තේ කුමන අංශයේ ද ආදී වශයෙන් ළමයින්ට පොත් ලබා ගැනීමේ දී සහාය සහ පැහැදිලි කිරීම් අවශ්‍ය වේ. "කාඩ්පත්" ක්‍රමය ක්‍රියාත්මක කිරීම මුදල් ප්‍රශ්නයකට තුඩු දේ නම්, ළමයින්ට තමා කියවන ලද පොත් පිළිබඳව ස්වයං වාර්තා ලේඛනයක් වෙන ම අභ්‍යාස පොතක හෝ පවත්වා ගෙන යාම පිළිබඳ ව දැනුවත් කළ යුතු වේ.

එහි කියවන ලද පොතේ නම, කර්තෘගේ නම, පොත කියවා අවසන් කළ දිනය, මාසය පමණක් මුල් අවදියේ දී සටහන් කර ගැනීම සෑහේ. පසුව ළමයා වැඩෙත් ම අනුක්‍රමයෙන් ඉහළ ශ්‍රේණිවල දී පොතෙන් කියැවුණු ප්‍රධාන චරිත, සිදුවීම්, තමාට රුචි චරිත සහ ඒවාට කැමතිවීමට හේතු ආදී විස්තර වශයෙන් ඇතුළත් කිරීමට යොමු කළ හැකි ය. ළමයින් කීපදෙනෙකු එක ම පොත කියවා අවසන් වූ විට එම පොත සහ කර්තෘ පිළිබඳ ව සාකච්ඡා කිරීම, ඒවා අගය කිරීම සඳහා කණ්ඩායම් සංවිධානය කළ හැකි වේ. මේ සමග ම ශිෂ්‍යයන් ඇතුළත් කරන කරුණු පිළිබඳ ව විශ්වසනීයතාව ඇති කර ගැනීමට ශිෂ්‍යයන්ගෙන් එම පොත් පිළිබඳ ව ඉදිහිට විස්තර විමසා බැලීමට පුළුවන. මේ අන්දමට පොත් කියවීම පිළිබඳ ව යාවජීව ආශාවක් ගොඩ නැගෙන පරිදි ළමයින් පෙළඹවිය හැකි වේ.

## උ. දෙමාපියන් සහ ගුරුවරුන් සඳහා යෝජනා

ළමයින්ට ලබා දිය හැකි උසස් ම යහපත නම් මනා ලෙස කියවීම සඳහා ළමයින් තුළ ඇල්මක්, රුචියක් ඇති කිරීම යි. කියවීමේ පුරුදු ප්‍රවර්ධනය සඳහා යොදගන්නා වැඩ කටයුතුවලට ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම ඉතා වැදගත් වේ. ළමයින්ගේ කියවීමේ පසුතලය පෝෂණය කිරීම සඳහා කියවීමේ පුරුද්ද නගරයෙන් බැහැර ඈත ගම්මානවල මිනිසුන් කරා ළඟා විය යුතු ය. ඒ අය අතර කියවීම ව්‍යාප්ත කළ යුතු ය. ප්‍රථමයෙන් දෙමාපියන් විසින් හොඳ පොත් කියවීමේ අගය තේරුම් ගත යුතු ය. එවිට ළමයින් තුළ කියවීමේ පුරුදු සංවර්ධනය කිරීම පහසු වේ. ඒ නිසා කියවීම ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන්වලට දෙමව්පියන්ට, ප්‍රජාවට සහභාගිවීමට උනන්දු කළ යුතු ය. මෙසේ කියවීම පිළිබඳ ව දෙමව්පියන් දැනුවත් කළ විට ගෙදර පවුල තුළ කියවන පරිසරයක් වර්ධනය වේ. ඉතා

කුඩා අවධියේ සිටම ළමයින් කියවීම කෙරෙහි උනන්දු කර විය යුතු බව දෙමව්පියන් ද වටහා ගත යුතු වේ. ඒ සඳහා ගුරුවරුන් දෙමාව්පියන්ට මග පෙන්වා දී ම අවශ්‍ය වේ. දරුවාට කෑම කවනවිට, ඇඳුම් අන්දවන විට, කතාන්දර කියාදීමට , දරු නැළවිලි ගී, සින්දු ආදිය කීමෙන් කියවීමේ පුරුද්දක් ඇතිවීමට මග පෑදීමට මවට හැකි වේ. අකුරු කියවීමට නො හැකි දරුවන්ට විවේකී අවස්ථාවල දී පොත්වල කතාන්දර කියවාදීමට මවට පුළුවන. මෙයින් ළමයා නො දැනුවත් ව ම පොත් කියවීම කෙරෙහි ආශාවක් ඇති කෙරේ. කියවීමේ හැකියාවක් ඇති ළමයි පොත් කියවන විට එය අසාගෙන සිටීම ද, දරුවාට ප්‍රශංසා කිරීම ද මවට කළ හැකි ය. එවිට තමා පිළිබඳ ව ධනාත්මක හැඟීමක් ඇති කර ගන්නා ළමයා කියවීමේ යෙදීමට වඩාත් ඇලුම් කරයි. එසේ ම, දරුවාට කියවීම සඳහා පොත් මිලදී ගෙන දීමට දෙමව්පියන් මැලිකමක් නොදක්වනු ඇත.

ඌ9. ළමයින් තුළ කියවීමේ පුරුදු, විඥාපන සහ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානය පාසල යි. ළමයින්ගේ ඉගෙනීම හා සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් පාහේ සමෝධානය කරන ප්‍රධානත ම සාධකය ගුරුවරයා ය. ළමයින්ගේ කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයාට පහසුවෙන් කළ හැකි දෙයකි, පන්ති පුස්තකාලයක් ආරම්භ කිරීම. එසේත් නැත්නම් පොත් මුල්ලක් පිළිවෙළ කිරීම. එවිට ළමයාට තමාගේ ඇසට නිතර පොත පත ගැටීමෙන් පොත් කියවීමට පෙළඹවීමක් ලැබේ. මේ සඳහා දෙමව්පිය සහයෝගය ලබා ගත හැකිය.

සතියකට වරක් නිදහසේ කියවීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ගුරුතුමියට මේ සඳහා ගත හැකි තවත් පියවරකි. රූකඩ දර්ශන, ක්‍රීඩා, නාට්‍ය කතාන්දර කීම වැනි කියවීමේ රුචිය උපදවන ක්‍රියාකාරකම් මේ සඳහා උපයෝගී කර ගත හැකි ය. තව ද, පාසලේ එදිනෙද සිදුවන සෑම ක්‍රියාකාරකමක් ම කියවීම හා සම්බන්ධ කිරීමට ගුරුවරුන් උත්සාහ ගත යුතු වේ. ඊට උචිත වාතාවරණයක් අප ප්‍රාථමික පාඨශාලාවල තිබේ. ප්‍රාථමික පාසලේ විෂයයන් වැඩි හරියක්, එකම ගුරුවරයකු විසින් ඉගැන්වීම කරන නිසා පන්තියක සාමාන්‍යයෙන් එදිනෙද කෙරෙන ඉගැන්වීම කියවීම ප්‍රවර්ධනය කිරීම සඳහා යොදගත හැකි වේ.

ළමයාට කියවීම සඳහා සපයා දෙන පොත පත ඔහුගේ මට්ටමෙන් ආරම්භ කළ යුතු ය. ළමයින්ගේ ලැදිකම් පුළුල් වන ලෙස, රුචිකත්වය ඉහළ මට්ටමකට නගා සිටුවීම සඳහා පරීක්ෂාකාරී ලෙස සැලසුම් කරන ලද වැඩසටහන් ඒවාට ඇතුළත් කළ යුතු වේ. කියවීම ළමයාගේ ම අත්දැකීම් මට්ටමෙන් ආරම්භ කළ විට එයින් ඔවුන්ට සාර්ථකත්වය විඳගැනීමට ඉඩ සැලසේ. එවිට පොත්පත් කියවීම, පුරුද්දක් හැටියට තිරලෙස ස්ථාපිත වේ. එසේ ම ආරම්භයේ සිට ම ළමයින්ට කියවීම අර්ථවත් විය යුතු ය. එය ප්‍රයෝජනවත් විය යුතුවාක් මෙන් ම තාත්වික ද විය යුතු ය. මෙවැනි ප්‍රවේශයක් ඇති විට ළමයි ආරම්භයේ සිට ම කියවීම කෙරෙහි ධනාත්මක හැඟීම් ඇති කර ගනිති.

## 9.03 නවීකරණ

9.03. 01 පින්තූර, ජනකථා - පිළිබඳ පොත්, එදිනෙද ජීවිතය හා බැඳෙන කතාන්දර, සංස්කෘතිය හා සම්බන්ධ කතාන්දර, විඥපනය ලබාගත හැකි පොත පත, කැසට් පටි, පුද්ගලයන් - වීරයන් පිළිබඳ චරිතාපදන, විද්‍යා හා තාක්ෂණ ඥනය හා සම්බන්ධ සරල පොත්, ආදී ඒකකවලින් පරිපූර්ණ කියවීම් සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම

9.03.02 ඉගැන්වීම ක්‍රම විද්‍යාව පිළිබඳ සක්‍රිය පර්යේෂණවල නියැලීම සඳහා ගුරු පුහුණු විද්‍යාල සහ විද්‍යාපීඨ උපයෝගී කර ගැනීම. විශේෂයෙන් ළමයා ප්‍රාථමික අධ්‍යාපනය ලබන අවදිය අදළ භාෂා කුසලතා පිළිබඳ ගුරුවරුන්ට මනා පුහුණුවක් ලබාදීම. එක අධ්‍යාපන පීඨයක හෝ භාෂා සංවර්ධනය සඳහා පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

9.03.03 ප්‍රාථමික අධ්‍යාපන ගුරු පුහුණුවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු, අත්දැකීම් බහුල ඇප කැප වීමෙන් යුක්ත අධ්‍යාපනඥයන් යොදා ගැනීම.

9.03.04 "ජාතික ළමා පොත් දිනය" වැනි උත්සව පැවැත්වීම සහ ඒවාට ළමයින්ගේ සාහිත්‍ය ක්‍රියාකාරකම්, පදනම් කර ගැනීම. උදහරණ: මා වඩාත් කැමති ළමා පොත් රචකයා, මා වඩාත් කැමති පොත වැනි මාතෘකා අනුව ළමයින් විසින් රචනා කරන ලද නිර්මාණ

9.03.05 ළමා සාහිත්‍යය, විශේෂ, වටිනා ක්ෂේත්‍රයක් හැටියට සැලකීම, විශේෂ අවධානය එය කෙරෙහි යොමුකිරීම, වාර්ෂික ව, මුළු රටපුරා ම නිර්මාණය වී ඇති ළමා කෘතිවලින් ගුණාත්මක අගයෙන් යුත් ළමා ග්‍රන්ථ කාර්යක්ෂම අපක්ෂපාතී මණ්ඩලයක් මගින් තෝරා, එම දක්ෂ ලේඛකයන් 10කුට පමණ තිළිණ, ප්‍රශංසා ආදිය ලබා දී ම.

9.03.06 පෙළපොත් විවිධකරණය, ප්‍රාථමික ශ්‍රේණිවල දී, විශේෂයෙන් 1-3 ශ්‍රේණි දක්වා හෝ එක් ශ්‍රේණියකට විවිධ වර්ගයේ පෙළ පොත් 3ක් වත් ළමයින්ගේ බුද්ධිවර්ධනයට අවකාශ ලැබෙන පරිදි සපයා දීම. එක ම පෙළපොතක් මුළු ලංකාවේ ම ළමයින්ට නියම කළ විට බුද්ධිමත් ළමයින්ට තනිව හෝ කල්පනා කර සිතා බලා කරුණු ඉදිරිපත් කිරීමට ඉඩක් හෝ ප්‍රශංසාවක් හෝ ඇගයීමක් කිරීමට අවකාශ නො ලැබේ. ළමයි ඒකාකාර චින්තනයට නැඹුරු වෙති.

වත්මන් රජය විසින් දැනට පාසල් තුළ පවත්නා භෞතික - මානව සම්පත්වල විෂමතා මගහරවා ගැනීම සඳහා පන්තිකාමර සහ පුස්තකාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, පොත් ප්‍රදානය කිරීම, පරිගණක සහ පරිගණක පුහුණුකිරීම් පහසුකම් ලබා දීම, ආදී වැඩ පිළිවෙළ දියත් කර ඇත. නිසැකව ම මේවා සිසුන්ට ඵලදායීවනු ඇත. දැනුම සඳහා, අධ්‍යාපනය සඳහා, ජීවත්වීම සඳහා සහ සාමූහික ජීවත්වීම සඳහා යන ප්‍රධාන මූලධර්ම 4 පදනම් කරගත් ඉගෙනීම සඳහා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් යහපත් ප්‍රතිඵල ලබාගැනීමට ඉඩ ඇත. එය රැඳී ඇත්තේ මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය මත ය.

**(4) පින්තූර අඳින්න.**

1. ඉර පායනවා.

2. මල්ලි අඬනවා.

3. පූසා ලස්සනයි.

**5. වචන තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. අම්මා බත් (උයනවා / කඩනවා / සෝදනවා)
2. ගිරවා අහසේ (ඇවිදිනවා/ පියාඹනවා / නටනවා)
3. මල්ලී කිරි (වැටෙනවා/ දකිනවා/ බොනවා)
4. හාවා (රතු/ සුදු/ නිල්) පාටයි.
5. අපේ රට (එංගලන්තය යි/ ශ්‍රී ලංකාව යි/ ඉන්දියාව යි)

**"ආ" කොටස**


1. මගේ නම: ..............................................................................................................................
2. අපේ පවුලේ ........................................................................................................ දෙනෙක් ඉන්නවා.
3. මම සෙල්ලම් කිරීමට වඩාත් කැමති මල්ලී / නංගී/ අයියා/ අක්කා/ යාලුවො සමග/ කවුරුත් නෑ
4. මම කැමති පොත්වල පින්තූර බැලීමට / කථාන්තර ඇසීමට/ පිටු පෙරලා බැලීමට / මුකුත් නෑ.
5. පාඩම් පොත හැර මට තව කියවීම් පොත් 1 ක් /2 ක්/ 3ක් / 4ක්/ 5 ට වඩා තියෙනවා.
6. මට කතාන්තර කියා දෙන්නේ සීයා/ ආච්චි/ තාත්තා/ අම්මා/ නැන්දා/ පුංචි අම්මා/ කවුරුත් නෑ.
7. රූපවාහිනියෙන් මම වඩාත් බලන්න කැමති කාටූන් / නාට්‍ය / ළමා කතා/ මුකුත් ආසා නෑ
8. ගුවන් විදුලියේ මම වඩාත් අහන්න කැමති අම්බිලි මාමා/ ළමා පිටිය/ ළමා රඟමඩල / සින්දු
9. මම වඩාත් ඉගෙනගැනීමට කැමති සිංහල/ ගණිතය/ ආගම/ සෞන්දර්ය/ පරිසර විද්‍යා
10. මම කියවීමට කැමති සතුන් ගැන/ මල් ගැන/ කුරුල්ලන් ගැන / ළමයින් ගැන / ආසා නෑ
11. මම කියවීමට කැමති ළමා පත්‍රය රන්කැටි/ බිංදු/ මිහිර/ ටිකිරි
12. මට සල්ලි ටිකක් ලැබුණොත් මම ගන්නේ සෙල්ලම් බඩු/ පාට පැන්සල්/ කථාන්තර පොත්
13. මම වඩාත් කැමති සෙල්ලම් කිරීමට / පොත් කියවීමට/ බයිසිකල් පැදීමට/ මුකුත් කැමති නෑ
14. මම වඩාත් කියවීමට කැමති අන්දරේගේ කථා/ ගමරාලගේ කථා / ජනකථා / යුධ කථා
15. මම එළියේ ඇවිදින්න කැමති තාත්තා/ අම්මා/ අයියා/ අක්කා එක්ක/ කවුරුත් නෑ


**කැමති උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.**

ඇමුණුම - I

## 2 වසර


**(1) පළමුවන කොටුවේ පෙනෙන රූපයට අයිති වචනයේ මුල් අකුරෙන් පටන් ගන්නා තවත් රූපයක් තෝරා හරි (✓) ලකුණ දමන්න.**






**(2) රවුමෙන් අකුරු තෝරාගෙන වචන සම්පූර්ණ කරන්න.**

1. ග__ම
2. __ච
3. ස__ංගලය



4. ක__ර
5. __නා
6. __සය



තු චු
නැ ලේ
රැ මේ

**(3) වාක්‍යයට ගැලපෙන පින්තූරය ඉරකින් යා කරන්න.**

1. අපි මල් කඩමු.
2. වැස්ස වහිනවා.
3. මල් පිපෙනවා.
4. මල්ලි අඹ කනවා.
5. පොල් ගස උසයි.



ඇමුණුම - II

## 4 වසර භාෂා සාධන පරීක්ෂණය

**(1) සමාන අර්ථය ඇති වචන ලියන්න.**

i සූර්යයා ..................................

ii සවිමත් ..................................

iii ගිර ..................................

iv ලැහැබ ..................................

v විමතිය ..................................

**(2) විරුද්ධ අර්ථය ලබාදෙන ඇති වචන ලියන්න.**

i හොඳ ..................................

ii අහස ..................................

iii සතුට ..................................

iv කීර්තිය ..................................

v වෛරය .................................. (10)

**(3) පහත දැක්වෙන වචනවල අකුරු නිවැරැදි කර ලියන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| i | ලක්ශන | .................. | vi | කොරෝදය | .................. |
| ii | ආරස්සාව | .................. | vii | සන්දියාව | .................. |
| iii | පක්සීහු | .................. | viii | බරාහ්මණයා | .................. |
| iv | උපක්කරමය | .................. | ix | විද්යාගාරය | .................. |
| v | නිස්සබ්ද | .................. | x | සත්තෝදියානය | .................. |

(10)

**(4) පහත සඳහන් ගී කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඇත එපිට කාලේ සිට
සමනොළ ගිරි මුදුනින් බැස
මහමුහුදට ගලා ගියා
මහවැලි ගංගා

2. ගහට වැලට මහ පොළොවට
වැඩක් නැතිව මුහුදට ගිය
නිමක් නොමැති මහ ජල කඳ
මහවැලි ගංගා

3. ගිය මග වෙනසක් වී දැන්
උතුරට හැරවී රජ රට
ඇළ දෙළ මහ වැව් පුරවන
මහවැලි ගංගා

4. පෙර කිසිදින නොකළ ලෙසට
මුළු රජ රට සරු කරමින
ගමින් ගමට දිය ගෙන යයි
නව ජය ගංගා

5. මහ වන රොද කල එළි වී
ගම්බද ජනපද ඉදි වී
මහවැලි යුගයක් බිහි කළ
මහවැලි ගංගා

6. රන්වන් රන් කරල් පැසෙන
රන් පාටින් පිරි කෙත් දැක
කිරි උතුරන සිනහ නගන
මහවැලි ගංගා

1. මහවැලි ගඟ පටන් ගන්නේ ................................................................ සිටය.
2. මහවැලි ගඟෙහි සිදුකර ඇති වෙනස කුමක් ද? ................................................................
................................................................................................
3. එම වෙනස නිසා ලැබේ යයි කවියා සිතන ප්‍රයෝජන මොනවාද?
i ................................................................
ii ................................................................
iii ................................................................

**4. පහත දැක්වෙන යෙදුම්වල අදහස ලියන්න.**

i සරු බිම ................................................................
ii මහ ජල කඳ ................................................................
iii ගිරි මුදුන ................................................................
iv නිමක් නොමැති ................................................................
v කිරි උතුරන සිනාව ................................................................ (20)

**5. සුදුසු ක්‍රියා පද යොදන්න.**

i මම මල ................................................................
ii අපි අකුරු ................................................................
iii සඳ ................................................................
iv තාත්තා රක්ෂාවට ................................................................
v මැණියෝ සතුටින් ................................................................
vi වඳුරෝ ගසින් ගසට ................................................................
vii පුතා ද දුව ද පාසලට ................................................................
viii වැද්දෝ සතුන් ................................................................
ix සීතා ඇඳුමක් ................................................................
x ළමයි පාසලට ................................................................ (20)

**(6) කැමති මාතෘකාවක් තෝරා රචනයක් ලියන්න.**

1. මගේ ගම
2. මා දුටු සිහිනයක්
3. බෝම්බය පිපුරූ දා......
4. පෙරහැරක් (40)

## " ආ" කොටස

1. මගේ නම : ..........................................................................................................

2. මගේ වයස: අවුරුදු .......................................... මාස ..........................................

3. මගේ පාසලේ නම: ..........................................................................................................

4. මගේ ගෙදර ලිපිනය: ..........................................................................................................

5. මට සහෝදරයන් .............................. ද, සහෝදරියන් .............................. ද ඉන්නවා.

6. මගේ දෙමව්පියන්

   1. දෙදෙනාම ජීවත්ව සිටිත්.
   2. දෙදෙනාම ජීවත් නොවේ.
   3. මව පමණක් ජීවත් වේ.
   4. පියා පමණක් ජීවත් වේ.

7. මා පාසලට එන්නේ බසයෙන් / බයිසිකලයෙන්/ කාරයෙන්/ වෑන් එකෙන් / ඇවිදගෙන

8. අපේ ගෙදරට පුවෘත්ති පත්‍ර ගන්නේ සැමදම / ඉරිදට/ සමහරදට/ කවදවත් නෑ.

9. මම ගුවන්විදුලියෙන් අහන්නේ සින්දු/ කථාන්තර/ නාට්‍ය / මුකුත් නෑ

10. මම රූපවාහිනියෙන් බලන්න කැමති කාටූන් චිත්‍ර/ නාට්‍ය/කථාන්තර/ හින්දි චිත්‍රපටි

11. පන්තියේ පාඩම් පොත් හැර මා ළඟ කථාන්තර පොත් 1/ 2/ 3/ 4/ 5/ 10 ට වැඩිය තියෙනවා.

12. මම පාසල් පුස්තකාලයෙන් කියවා තියන පොත් ගණන 1-5/ 5-10/ 10-20/ 20-25 පමණ

13. මම කියවීමට වඩාත් කැමති ළමා පත්‍රය බිංදු/ ටිකිරි/ මිහිර / විද්‍යා

14. මම කියවා තේරුම් ගන්න බැරි ඒවා ගෙදරදී අහගන්නේ අම්මාගෙන්/ තාත්තාගෙන්/ සීයාගෙන්

15. මම කියවා ඇති කැමතිම කතාන්තර පොත ..........................................

16. මම කියවීමට කැමති සතුන් ගැන/ වාහන ගැන / කුරුල්ලන් ගැන / වීරයන් ගැන / මුකුත් නෑ

17. මම වඩාත් ඉගෙනීමට කැමති ගණිතය / කියවීම/ ලිවීම/ චිත්‍ර/ ගායනය

18. පාසල ඇරී ගෙදර ගියාට පසු මම කිරීමට කැමති නිදගැනීම/ සෙල්ලම් කිරීම/ පොතක් කියවීම

19. මා වඩාත් යාමට කැමති සෙල්ලම් පිට්ටනියට/ සංගීත පන්තියට/ පිහිනීමට/ පුස්තකාලයට

20. මට මුදල් ලැබුණොත් මම ගන්නේ ළමා පත්‍රයක් /බැට් එකක් හා බෝලයක් / කථාන්තර පොතක්/ පාට පැන්සල් පෙට්ටියක්

("අ" කොටස - ප්‍රශ්න අංකය 15)

## කැමති කතාන්තර පොත

1. වලහා සහ සිංහයා
2. නත්තල් සීයා
3. අපේ ගමේ විත්ති
4. කොණ්ඩ මාමා
5. පූසා සහ මීයා
6. පන්සලේ ඇතින්න
7. දඟ මල්ල
8. රත්තරන් පොරොව
9. හොඳ ටිකිරි
10. සරුංගල් මාමා
11. ගොපළු දැරිය
12. අලි බබා සහ හොරු හතළිහ
13. සුසිලාගේ වාසනාව
14. පොකුරු මල්
15. දඟ ළමයා
16. කපටි අන්දරේ
17. කතන්දර විස්ස
18. අනගාරික ධර්මපාලතුමා
19. නිල් මැණිකේ
20. වලස් උපාය
21. යකා බැඳි ඇල්ල
22. බංඩි ගුරා
23. රන් පිහාටුව
24. මුතුබෙල්ලා සහ නාග හත්දෙනා
25. අන්දරේගෙ කතා
26. කිරි පුංචා සහ අලි පුංචා
27. නුවණැති කුමාරයා
28. දසමහ යෝධයෝ
29. හීන් සැරය
30. දඟ දසගේ කැටපෝලය
31. ටිකිරිගෙ ගෙදර
32. සමන්මලී
33. වැලිකතරේ මංමුළාව
34. නලාකාරයා
35. බට්ටා සහිත ඔර්ලෝසුව
36. මාලතී මල්
37. පුංචි මිකී
38. අහසට ගිය කුහුඹුවා
39. ඇලිස්ගේ සිහිනය
40. ජේර පොකුණ
41. හඳ මලී
42. හිම කුමාරි
43. නරියා සහ කේප්පු කැල්ල
44. උඩගිය බබා
45. වල් හංසයෝ
46. කලු පූසා
47. කතා හත
48. බෝංචි මැස්ස
49. මිතුරන් හත්දෙනා
50. ආඩම්බර මොනරා
51. උණ පඳුරයි බුරුත ගහයි.
52. හඳට ගිය හාවා
53. අන්දරේ
54. හත්පණ
55. මඩොල් දූව
56. මහදැනමුත්තා සහ ගෝල පිරිස
57. බොර දිය
58. හැම්ලට්
59. නටන ඉබ්බා
60. කෙව්ළි බිත්තර රැක්ක හැටි
61. නරියා මිදි කෑ හැටි
62. නරියා ලබු කිරිබත් කෑ හැටි
63. සුදු හා පුංචා
64. මහවැලි කතාව
65. රතු හැට්ටකාරී
66. මල්ලි මගේ රත්තරන්
67. දියෙන් උපන් කුමාරයා
68. නැතිවුණු හිරු
69. කළු සහ සුදු
70. බිම්මල් හොරා
71. ඉබ්බා අහසින් ගිය හැටි
72. හොඳ යාළුවෝ
73. මාරයා ඇඹු ද
74. අලියාට මල් ඔටුන්නක්
75. නැති වූ පුතා
76. මහා ඇලෙක්සැන්දර්
77. තහනම් අඩවිය
78. ඔලිවර් ට්විස්ට්
79. මද්දුම බණ්ඩාර
80. ලස්සන මාළුවෝ
81. ඩිංගී
82. ත්‍රිකෝණ රහස

83. මාපට ඇඟිල්ල
84. වනගත වීරයෝ
85. අහසට සරුංගලයක්
86. රතු කිකිළි
87. රොබින්සන් ක෴සෝ
88. කල්ලන්දුවේ මුතු කොල්ලෝ
89. අළුත් යාළුවෝ
90. පාරමී
91. සුරංගනා කතාන්දර
92. අලියා සහ කුඹියා
93. අකීකරු අලිබබා
94. කතාන්තරෙන් විද්‍යාව උගනිමු.
95. මැජික් පින්සලය
96. වෙස්සන්තර කතාව
97. පුංචි පැංචි
98. මඟුල් කෑම
99. ඕල්කට්තුමා
100. රන් කැකිර
101. කළු හොඳ පස්සෙන්
102. කම්මැලි යාළුවෝ
103. කළුගුණ දත් කපුටුහාමි
104. සතුටු කඳුළු
105. යෝදයා සහ කුඹියා
106. ගෙම්බා සහ කුමරිය
107. බිහිසුණු සවාරිය
108. විලම්බීත
109. සිරිමල්ගෙ වික්‍රම
110. අපි යාළුයි
111. කන්ද හෙල්ලු මෝඩයා
112. කුමාරොදය
113. ටිකිරිබණ්ඩා සහ සුපිරිබණ්ඩා
114. ඇලඩින්ගේ පුදුම පහන
115. අමල් බිසෝ
116. කුරුළු දූපතට ගමනක්
117. රත්තරන් පුහුල
118. රණරාළ
119. කට්ටයා සහ වෙට්ටයා
120. වෙස්වලාගත් දෙවිදුව
121. සමඟිය බලය වේ.
122. නිදන කිරා
123. හර්කියුලස් වික්‍රම
124. වයඹ පුත්තු
125. ගමරාළයි හැරමිට්ටියයි
126. කොරල් දූපත
127. එකට එක
128. අප්පුහාමිගෙ දැලි පිහිය
129. පාළු දූපත
130. දෙව්ලොව කලබල
131. දෙයියො දුන්න රත්තරන්
132. ටාසන්
133. ටිකිරි රජ වූ හැටි
134. පාසල් බස් රිය
135. සුදු වැද්ද
136. රොබින් හුඩ්
137. අටල්ලේ උන් කුමාරිය
138. බෙඩින් පවල්
139. කෝන්තරය
140. දංඩි පැටවු
141. හොල්මන් දූපත
142. ගිරා පැටියා
143. ගුරු ආදරය
144. තාරා පැටියා
145. තුන් යහළු වික්‍රමය
146. වැඩ බැරි දස
147. අඹ යහළුවෝ
148. පුංචි සිකනලා වලිගය ඉල්ලයි
149. මුහුදු ගමන
150. නෙල්ලි කැලේ වීරයෝ
151. යකෙක් කන්න බඩගිනියි
152. පිදුරු ගෙදර
153. යක් දමනය
154. කහ කුරුල්ලා
155. මැණික් ගලේ කතාව
156. සීක්‍රට් සෙවන් (Secret Seven)
157. පණ්ඩුකාභය රජතුමා
158. රජ සබයට ගිය බල්ලා
159. සතුන්ගේ වගතුග
160. මල්වගේ අපේ ළමයි
161. නිමල්ගෙ යාළුවො
162. සමනල කුමාරිය
163. අපට අපේ අත්
164. සින්ඩරෙල්ලා
165. කේන්ති හාමිනේ
166. පුංචි සියම
167. පුදුම දිවයින
168. තණකොළ පෙත්තා සහ කුඹියා
169. අපූරු ලෝගුව
170. හඳපානේ මාලු හොරා

171. කැකිල්ලේ රජතුමා
172. අපූරු ජෝගුව
173. වෙරළු ආච්චී
174. අපූරු තීන්දුව
175. වීරවරුන්ගේ කතාන්දර
176. වලගම්බා
177. සිරි සඟබෝ රජතුමා
178. දගකාර වලස්පැටියා
179. මංජුගෙ ලෑලි කරත්තය
180. කුරුළු කුමාරි
181. සින්දු කිරිල්ලි
182. ඔලිම්පික් බීෂා
183. වඩු කුරුල්ලෝ
184. සීනු හාමි
185. නපුරු කුඩම්මා
186. කහඹිලියා ගෙත්තම
187. කොක්කු ජෝඩුවක්
188. හොඳ ළමයි බය නෑ
189. නරිහාමිගෙ කතාව
190. සීනි කුමාරි
191. පූසි හොඳ පූසී
192. පුංචි රවුම් බනිස් ගෙඩිය
193. ටිකිරිගෙ මුල්ම පාඩම
194. ඊශොප්ගේ උපමා කතා
195. මවකගෙ සෙනෙහස

ඇමුණුම - III

## ගුරු තොරතුරු

**පාසලේ නම :** ..............................................................................................................

1. ගුරුතුමියගේ නම : ..............................................................................................................

2. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්: ..............................................................................................................

3. සේවා කාලය : අවුරුදු ..............................................................

4. පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව : ගැ .............................................................. පි. ..............................................................

5. පොත් කියවීම පිළිබඳ මගේ අදහස:

| | | එකඟ වෙමි. | නොවෙමි. |
|---|---|---|---|
| I. | කියවීම විවේකකාලය ගත කිරීමේ හොඳ මගකි | .............................. | .............................. |
| II. | ළමා පොත්වලින් බොහොමයක් දිග වැඩිය. නොගැළපේ | .............................. | .............................. |
| III. | මා හිතන හැටියට පොත් කියවීම විනෝද ජනකය | .............................. | .............................. |
| IV. | පොත් කියවීමෙන් යහපත් ප්‍රතිඵල ලැබේ. | .............................. | .............................. |
| V. | මගේ විනෝදාංශය පොත් කියවීම නොව රූපවාහිනිය බැලීමයි | .............................. | .............................. |
| VI. | පොත් කියවීමට වේලාව ගතවේ. කම්මැලි කාර්යයකි | .............................. | .............................. |
| VII. | මට පොත් කියවීමේ දක්ෂතාවක් නැත. | .............................. | .............................. |
| VIII. | පාසලෙහි දී කියවීම සඳහා ළමයින්ට වැඩිකාලයක් දිය යුතුය | .............................. | .............................. |
| IX. | මාසික වේතනයෙන් පොතක් මිළ දී ගැනීම මගේ පුරුද්දකි. | .............................. | .............................. |
| X. | මෙතෙක් මා කියවා ඇති පොත් සංඛ්‍යාව පාඩම් පොත් හැර<br>50. 100. 200. 400. 800. 1000 | .............................. | .............................. |

6. ඔබේ පන්තියේ කියවීම දුර්වල ළමයි කී දෙනෙක් සිටිත් ද? ..............................................................................................................

..............................................................................................................

7. ඒ අයගේ කියවීම දුර්වල වී ඇත්තේ කුමක් නිසා ද? ..............................................................................................................

..............................................................................................................

8. එම දුර්වල ළමයින්ට උදවු කිරීමට ඔබ යොද ගන්නා උපක්‍රම? ..............................................................................................................

..............................................................................................................

9. ඔබේ පන්තියේ පුස්තකාලයක් තිබේද? .............................................. පොත් ..............................................

10. ළමයින් තුළ කියවීමේ පුරුද්ද වැඩි දියුණුකිරීම සඳහා ඔබට ගත හැකි පියවර මොනවා ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

ඇමුණුම - IV

# පාසල පිළිබඳ ප්‍රශ්නාවලිය

1. පාසලේ නම : ..........
2. පාසලේ ලිපිනය: ..........
3. ප්‍රාථමික පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව: ..........
4. පාසලේ ඇති ඉහළම ශ්‍රේණිය .......... පහළම ශ්‍රේණිය ..........
5. මෙය කුමන ගණයේ පාසලක් ද? 1 AB, 2AB, 1B, 1C, ජාතික, III
6. ගුරුමණ්ඩලයේ සංඛ්‍යාව: පුහුණු .......... නුපුහුණු .......... උපාධි ..........
7. විදුහල්පතිතුමා පිළිබඳ තොරතුරු:
   I නම: ..........
   II සේවා කාලය: අවුරුදු ..........විදුහල්පති වශයෙන් ..........
   III වෘත්තීය හා අනිකුත් සුදුසුකම්: ..........
8. මෙම පාසල පාලනය වන්නේ .......... මගිනි.
9. පාසලට ඇති පහසුකම්:
   I පන්තිකාමර .......... II ජලය .......... III ඩෙස්ක් - පුටු ..........
   IV විදුලි බලය.......... V පුස්තකාල ..........
10. පාසල් පුස්තකාලයට පොත් ලබා ගන්නේ වියදම් ලැයිස්තුවෙන්/ බාහිර අධාර/ පුද්ගලික ආධාර/ වෙනත් ..........
11. ප්‍රාථමික අංශයේ ළමයින්ට කියවීමට ඇති පොත් ප්‍රමාණය ..........
12. පුස්තකාලය භාරව කටයුතු කරන්නේ ..........
13. පාසලට දිනපතා ලබා ගන්නා පුවත්පත් ..........
14. පාසලට ලබා ගන්නා ළමා පුවත්පත් ..........
15. පාසලට රූපවාහිනියක් / ගුවන් විදුලි යන්ත්‍රයක් තිබේ. ..........
16. අවුරුද්ද තුළ පැවැත් වූ පොත් ප්‍රදර්ශන ගණන ..........
17. ඒවා මෙහෙය වූ නියෝජිතයන් ..........
18. එම පොත් විමර්ශනයට භාජන කෙරුණිද? ..........
19. 1996 දී 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ සිසුන් ගණන ..........
    1996 දී 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් අසමත් වූ සිසුන් ගණන ..........
20. ළමයින්ගේ කියවීමේ රුචිකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගෙන ඇති උපක්‍රම මොනවාද? ..........

..........

..........

..........

## ග්‍රන්ථ නාමාවලිය


1. Brian, Peter and Braddy, Yenette (1988), Children's reading problem, Blackwells, London

2. Cramar, Eugene it and Castle, Mariectta, Fostering the love of reading, the effective domain in reading education, International Reading Association, USA.

3. Duffy, Gerald and, Sherman,George B. (1996) Systematic reading instruction Michigan State University, Harpe and Row, New York.

4. Durkin, Dolores (1995), Teaching Young Children to read, 3rd ed; Allynand Baccon, London.

5. Ekanayaka, Mohottige Sedara (1989), Disparity in achievement research, National Institute of Education, Maharagama

6. Encyclopaedia Britanica (1964)

7. Harrison, Collin and Coleo, Martin (1992), Reading for real handbook, London

8. Kariyawasam, T. (1990) National assesment of Educational Progress in Sri Lanka, National Institute of Education, Maharagama.

9. Morris, Ronald (1979) Success and failure in learning to read, Penguin, London

10. Nakara, Ontia (1996) Children with learning difficulties, Allied Publishers, Madras

11. New Encyclopaedia Britanica Vol. 3 micropaedia

12. Research on what the children have learnt after five years of schooling (1995), National Institute of Education, Maharagama.

13. Research on year five scholarship examination (1995), National Institute of Education, Maharagama

14. Smith, Brigid (1996), Through writing to reading classroom strategies for supporting literacy, Routledge, London.

15. Smith, James A. (1996) Creative teaching of reading in the elementary school ; 2nd ed, State University College Oswego, New York.

16. Wijesuriya (1995) Research on participation and performance in primary education, National Institute of Education, Maharagama

මෙම පර්යේෂණයෙහි යෙදුණු නන්දා නාරංගොඩ බෝලවලාන හෝමාගම සහ මහරගම යන ගුරු විද්‍යාලයන්හි අධ්‍යාපන මනෝවිද්‍යාව සහ අධ්‍යාපන මූලධර්ම පිළිබඳ කථිකාචාර්යවරියක් වශයෙන් සේවය කර ඇත. මාලදිවයින් ජනරජයෙහි මැලේහි අමීනියා බාලිකා මහ විද්‍යාලයෙහි විදුහල්පතිනිය ලෙස 1986 - 1990 දක්වා සේවය කර ඇති නන්දා නාරංගොඩ මහත්මිය බී. ඒ, එම් ඒ, අධ්‍යාපන ඩිප්ලෝමා සහ පෙර පාසල් ඩිප්ලෝමා සහතික ලබා ඇති අතර ළමාපොත් කතුවරියකි. එමෙන්ම 1992 දී ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලීය කමිටුව විසින් පවරන ලද Country Education Profile - Sri Lanka a Comparative Study on Higher Education Qualifications නමැති පර්යේෂණයට අදාළ වාර්තාව ප්‍රකාශයට පත්කර ඇත. දැනට ඇය සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය යටතේ ඇති ශබ්ද කෝෂ කාර්යාලයෙහි බාහිර උපකතුවරියක ලෙස සේවය කරයි.

ISBN 955 - 8383 - 07 - 4

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/21
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..................

Date : 2017/10/21

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*